සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

25 වෙනි කලාපය

ශ්‍රී බු. ව. 2557ක් වූ ඉල් මස (ව්‍යවහාරික වර්ෂ 2013 නොවැම්බර්)




## මරණය සහ උපත අතර සිදුවන සංකීර්ණ ක්‍රියාදාමය...


● සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය

# මම වනාහි...









මම මට මගේ යැයි කියමින් සිටින කෙනා
නමකට වහල් වී මේ අත්බවයෙ ගෙනා
හැම විට තමන්ගෙයි කටයුතු කරන තැනා
නොම දැන හිඳියි අනතෙහි ආ සසර ගැනා

සැණින් වෙනස් වන හිත කය මම කියලා
තැනින් තැන තියෙන නෙක වස්තුව හොයලා
වෙනින් කෙනෙකු හට නැති වන ලෙස ලියලා
නැණින් අඩුව හැර යයි සේරම තියලා



හරක් බලු බළල් වී හිටි පෙර කාලේ
අරක් ගෙන කරපු තිරිසන් වැඩ බාලේ
කරක් ගහපු අගු පිල් නෙක නෙක තාලේ
වරක්වත් කියයි දෝ මම ලෙස රාලේ



කෝ පෙර මම කියපු අය දැන් කොහි ඉන්නේ
හෝ හඬ පවා නැත දැන් මතකෙට එන්නේ
ලෝ සත මමයි මගෙ කිව්වද වැනසෙන්නේ
සෝ සුසුමන් පමණි අවසානෙට දෙන්නේ





මම කිවු කෙනා ලැබු කයවල් එකතු කර
එමගින් ලැබෙන ගොඩ බැලුවොත් කෙලෙස බර
බිම ඇති පසෙහි බර සැසඳිය නොහැකි වර
කුමටද තවත් මම ගැන තතු නොමැති හර

හිටියද මමෙක් රිසි ලෙස තුන් ලොව කොතැනා
කැමතිද කෙනෙක් අත හරිනට හිටි එතැනා
ඇති වෙද කයක් ලෝ සත රිසි ලෙස පතනා
කෙලෙසද මමෙක් නම් එය හැර අද මෙතැනා

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

# නිවන් මාර්ගයේ මුල පටන් ගැන්ම අපදාන පාළිය තුලින්...

5 වන කොටස

සිදුහත් කුමාරයා උපන් වෙලාවෙ මේ පුංචි කුමාරයගෙ අනාගතය ගැන දැනගන්න, සුද්ධෝදන රජතුමා රටේම ඉන්න නැකත් කරුවන් ගෙන්නුවා. මේ ආපු පිරිසගෙනුත් ඉස්සෙල්ලම 108 ක් තෝරගෙන, ඒ අය අතරිනුත් සුදුසුම 8 දෙනෙක් තමයි මේකට තෝරා ගත්තයි කියන්නෙ. මේ අය සියලු දෙනාම හිටියෙ එක මතයක. ඒ කියන්නෙ මේ පුංචි කුමාරය ගිහි ගෙයි හිටියොත් සක්විති රජ වෙනව, පැවිද්දට ගියොත් බුද්ධත්වයට පත්වෙනව කියන කාරණය. හැබැයි ඒ අය අතර විශේෂ තරුණ තාපසයෙකුත් හිටියා. මේ තරුණ තාපසතුමා, මඳක් විමසිලිමත්ව බලන කොට, මේ කුමාරයගෙ විශේෂ ලක්ෂණයක් දැක්කා. ඒ තමයි නළල් තලය මත දකුණට කැරකුන ඌර්ණ රෝම ධාතුව. ඒ අනුව ඒ තාපසතුමා, මේ කුමාරයා ඒකාන්තයෙන්ම බුදුවෙන බව පැහැදිලිවම කියා සිටියා. ඒ වගේම මේ කුමාරය බුදුවෙන කොට තමනුත් ලෑයිස්ති වෙලා ඉන්න ඕන කියල හිතාගෙන, මේ තාපසතුමා එදා ඉඳන් කුමාරයා වෙනුවෙන් වනගත වුණා. මේ තරුණ තාපසතුමා නමින් කොණ්ඩඤ්ඤ. ඒ වගේම ගෞතම බුද්ධ ශාසනයේ පළමු වෙනි මාර්ග ඵල ලාභියා. ඒ කිච්චෙ මුලින්ම දහම් අවබෝධය ලබාගන්න තරම් මහා වාසනාවක් තිබිච්ච උත්තමයෙක්.

හැබැයි ඒ වාසනාව එක දවසෙන් ලැබිච්ච දෙයක් නෙවෙයි. සෑහෙන කාලයකට උඩදී කරපු මහා දානයක ප්‍රතිඵලයක් තමයි ඒ විදියට ලැබුවෙ. හරියටම කියනව නම්, පදුමුත්තර බුදුපියාණන්වහන්සේ ලොව පහළ වෙලා හිටපු කාලයේ වෙච්ච සිද්ධියක්. උන් වහන්සේ බෝමැඩදී සියලු කෙලෙසුන් නසා ලොවුතුරා බුද්ධත්වයට පත්වුන මොහොත. ඒ අවස්ථාව ගැන අපදාන පාලියේ මෙහෙම සඳහනක් තියෙනවා. ඒක පැහැදිලි කරගන්න ඕන වැදගත් කාරණයක්.

බෝ මුලෙහි යම් පමණක් යක්ෂයෝ රැස් වූවාහුද, ඒ සියල්ලෝ බදැඳිලි ඇත්තාහු බුදුරජුන් පිරිවරා වඳිත්. - අපදාන පාලිය 1 - අඤ්ඤා කොණ්ඩඤ්ඤ ස්ථවිරාවදානය - 87 පිටුව

යක්ෂයෝ කිච්චම කෙනෙකුට මුලින්ම හිතට එන්නෙ, ඉතාමත් ද්වේශයෙන් ඉන්න සතර අපාගත කොටසක් ගැන. ඒ වගේම කෙනෙකුට තරහ ගියාම ඉබේටම කියවෙන දෙයක් තමයි, මට ඒ වෙලාවෙ යකා නැග්ග මොනව වුනාද කියල දන්නෙ නෑ කියන කාරණය. එහෙම නැත්නම් නිතර දෙවේලෙ තරහ යන කෙනෙක් දැක්කම අපි කියනව, අපෝ ඒ මිනිහ යකෙක් වගේ කියල. මේ වගේ අවස්ථාවක්, එහෙම නැත්නම් තරහෙන් පුපුර පුපුර ද්වේශයෙන් ඉන්න අත්බැවක්, ජාතියක් තමයි යක්ෂ කියන කොට මුලින්ම මතකයට එන්නෙ. ජාතිය ද්වේශ නම් භවයත් ද්වේශ වෙන්න ඕන. ඒ භවය නිකන් හට ගන්නෙ නෑ. ද්වේශ බවක් එන්න ද්වේශයම උපාදාන කරගෙන ඒකෙම ඉන්න ඕන. ඒකෙම ඉන්නවා කියන්නෙ ඇස, කන, නාසය, දිව, ශරීරය, මන කියන මේ සියල්ලම ආයතන කරගෙන තියෙන්නෙ ද්වේශයටමයි. හිතේ බැහැගෙන තියෙන්නෙත් ද්වේශයමයි. ද්වේශය හිතේ බැහැගන්න නම් හිත, කය, වචනය හැම තිස්සෙම ද්වේශ වැඩවලට යොදාගෙන ද්වේශයෙන් ක්‍රියා කරන්න ඕන. ඉතින් එහෙම ඉන්න කොට, අනේ මේ ලොවුතුරා බුදුන් වහන්සේ නමක් පහල වෙලා ඉන්න මොහොතක්නෙ, කොච්චර හොඳද කියල සතුටු වෙන්න පුළුවන්ද? ඒක ගලපන්න බෑ. ඒ වගේ අත්බැවක ඉඳෙද්දි එහෙම අදහසක් එන්න බෑ කියල ඥානගෝචරව බැලුවම තේරෙනවා. එතකොට කවුද මේ කිච්ච යක්ෂ කොටස?



කෙනෙක් ඉන්නව හරිම සැඩ පරුෂයි. හැබැයි ඒ සැඩ පරුෂ බව සිල් රකින, ගුණ දහම් පුරණ අයට නෙවෙයි. නරක වැඩ කරන, ඒ වගේම සත්පුරුෂ අයට කරදර හිරිහැර කරන අසත් පුරුෂයන්ට විතරයි. ඒ වගේ අයට ගහල බැනල හරි, තරවටු කරල හරි, අර ගුණ දහම් රකින අයට කරදරයක් නැති පරිසරයක් හදල දෙන්න ඕන, ඒ වගේම දඬුවම් දීල හරි ඒ අයත් යහමගට හරවන්න ඕන කියන මානසිකත්වයේ ඉඳගෙන ඒ අනුව කටයුතු කරනවා. එහෙම කොටසක් අදටත් සමාජයේ ඉන්නවා. හරියට නීතිය රකින අවංක පොලිස් නිලධාරියෙක් වගේ. ඉතින් මේ අයගෙ ගතිය සැඩ පරුෂ වුනාට ගුණ දහම්වලට නැමෙනවා. ඒ වගේ අය මරණින් මතු චාතුර් මහාරාජිකයට අයත් යස්ස නමින් හඳුන්වන දේව කොට්ඨාශයේ උපදිනවා. **යස්ස කියන්නෙ යසස් ඇති කියන අර්ථයෙන්. යක්ෂ කියන්නෙ යසස් ක්ෂය කරපු අර්ථයෙන්. නමුත් මේ දෙකටම පොදුවේ යක්ෂ කියල භාවිතා වෙනවා.** ඉතින් ඉහත පෙන්වපු යක්ෂ කියන්නෙත් මේ දේව කොට්ඨාශයම තමයි. එහෙම උපන්න කෙනෙක් තමයි ජනවසභ කියන්නෙත්. ඒ කියන්නෙ කලින් අත්බැවේ බිම්බිසාර රජතුමා. බුදුන් වහන්සේ ඔහු ඇමතුවෙත් යක්ෂයා කියල. ඒ වගේම ඉන්න තැන බැලුවම චාතුර්මහාරාජිකයට අයත් තැනක්. පහත ප්‍රකාශයෙන් ඒ බව මනාව පැහැදිලි වෙනවා.

අනඳයෙනි, හඬ නැගෙන්නා හා ම උදාර වූ සිරුරු පැහැ ඇති යක්ෂයෙක් මා ඉදිරියේ පහළ විය. දෙවනු වරැ ද හෙතෙම ''භාග්‍යවතුන් වහන්ස, මම බිම්බිසාර වෙමි, සුගතයන් වහන්ස, මම බිම්බිසාර වෙමි'' යි හඬ ඇස්වීය. ''වහන්ස, මේ සත්වන වර වෙසවුණු (වෙසමුණි) මහරජු ගේ සහභාවයට පැමිණියෙමි. ඒ මම මෙයින් සැව් (මෙයින් චුත වෙලා) මිනිස් රජක්හු වන්නට හැක්කෙමි. මෙ දෙව්ලොවින් සැවැ (චුත වෙලා) සත් වරක් ද, ඒ මිනිස් ලොවින් සැවැ සත් වරක් දැයි මෙසේ යම් දෙව් මිනිස් දෙදෙව්ලොව්හි පෙරැ මා වුසුයේ ද, ඒ දෙ තැන්හි ම හැම ලෙසින් කඳ පිළිවෙළ තුදුසක් (14 ක්) විසීම දනිමි. (ස්කන්ධ පරිපාටිය

හෙවත් තමන් හිටපු හැටි දන ගැනීම) සෙදැගැම් බව පිණිස ද මගේ අපේක්ෂාව පවතී යැයි ද හේ කී ය. දීඝ නිකාය 2 - 315 පිටුව, ජනවසභ සූත්‍රය.

දැන් මෙතනදි මේ බිම්බිසාර රජතුමා කියන්නෙ රජකම් කරන කොට අර වගේ, මිනිස්සුන්ට යහපත සලසන්න, වැරදි කරපු අයට සැඩපරුෂ විදියට දඬුවම් දීල ඒ වගේ රාජ්‍ය පාලනය කරපු කෙනෙක්. ඒ තමයි වඩපු ගතිය. හැබැයි අන්තිමට සෝවාන් වුණා. සෝවාන් වුනාට පස්සෙ තමයි සතර අපායෙ උපදින්නෙ නැත්තෙ. ඊළඟ අත්බවයෙ ඉපදුනේ චාතුර් මහාරාජිකයට අයත් යක්ෂ කියන දේව කොට්ඨාශයේ. නමුත් එතනින් පස්සෙ දෙව් ලොවින් චුත වෙලා පළමුව මනුස්ස වශයෙනුත්, එතනින් චුත වෙලා නැවතත් දෙව් වශයෙනුත්, නැවතත් එතනින් චුත වෙලා මිනිස් වශයෙනුත්... ආදී වශයෙන් මාරුවෙන් මාරුවට මිනිස් ලොව හත් වතාවකුත්, දෙව් ලොව හත් වතාවකුත් වශයෙන් 14 වතාවක් මැරි මැරි ඉපදුන බව තමන් දකින බවත් සඳහන් කරනවා. හැබැයි මිනිස් ලොව හත් වතාවක් ඉපදුනයි කියන්නෙ, මස් ලේ කයක් සහිතව මවු කුසින් බිහිවුනාම කියන එක නෙවෙයි. මවු කුසක උප්පත්ති වෙලා බිහි වෙන්න පෙරම චුත වෙලා, නැවතත් මවු කුසක උප්පත්ති වෙලා ඒත් මිනිසත් කයක් ලබන්න නොහැකි වෙලා, එතනිනුත් චුත වෙලා ආදී වශයෙන් හත් වතාවක් මිනිස් වශයෙන් චුත වුනා වෙන්න පුළුවන්. එහෙම නැත්නම් මවු කුසින් දරුවෙක් වශයෙන් ඉපදිලා බඩේදි හරි බිහි වුණාට පස්සෙ හරි අකල් මරණයකට ගොදුරු වෙන්න පුළුවන්. ඊළඟට දෙවියෙක් වුනත් නියම ආයුස ඉන්න ලැබෙන්නෙ නෑ ගෙවෙනවා. ඒ කියන්නෙ කරපු කර්ම විපාක නිසා සුගතියේ වුනත් නියම ආයුස ගෙවන්න කලියෙන් අකල් මරණ එනවා. සෝවාන් වුනත් විපාකවල හැටි එහෙමයි. එතකොට 14 වතාවක් දෙව් මිනිස් වෙලා ඉපදුනත් සතර අපාගත වුනේ නෑ. නමුත් අර කරපු පාප කර්මවල විපාක වශයෙන් තමයි ආයුස කෙටි වුණේ. හැබැයි ආයුස කෙටි වෙච්ච හේතුව මෙතන කියල නෑ. ඒක නැණ නුවණින් තේරුම් ගන්න ඕන.

දැන් මේ විදියට පැහැදිලිවම කියන්න පුළුවන් **චාතුර් මහාරාජිකය, තාවතිංසය වගේ දේව ලෝකවල ඉන්න දෙව් දේවතාවන්ටත් යක්ෂ කියන වචනය භාවිතා කරල තියෙන** බව. තාවතිංසයේ නායකයා වන සක්‍ර දෙවියන්ටත් බුදුන් වහන්සේ යක්ෂයා කියල භාවිතා කරපු තැන් තියෙනවා. ඒ වගේම ඒ කාලෙ හිටපු සමහර මනුස්සයො, බුදුන් වහන්සේටත් යස්ස කියල ආමන්ත්‍රණය කළා. ''ඒ කෙබඳු යස්සයෙක්ද?... ආදී වශයෙන් ඇහුවෙ, කොහොම යසස් ඇත්තෙක්ද කියන කාරණය. මේ නිසා යක්ෂ කියන වචනය අද යකා කියල පහත් තත්ත්වෙන් භාවිතා කළාට, එදා අර වගේ උසස් අය ආමන්ත්‍රණය කරන්නත් ගත්ත වචනයක්.

කොහොම හරි මේ කොණ්ඩඤ්ඤ තාපසතුමාගෙ පෙර අත්බැව් කතාවෙදි, බෝ මුලට රැස් වෙච්ච යක්ෂයෝ... ආදී වශයෙන් කියන්නෙ, සතර අපාගත යක්ෂ කොටසක් ගැන නෙවෙයි. තවදුරටත් කෙනෙකුට සැඩ පරුෂ බවින්, හිංගි හිංසාවක් නොකරන මට්ටමේ, ඒ ජාතියේ සැඩ ගති ගන්නෙ නැති දේව කොටස් ඉන්නෙ ඉහළ දේව තලවල. නමුත් චාතුර්මහා රාජිකය, තුසිතය වගේ දේව ලෝකවල ඉන්න පාලක දෙවි දේවතාවන්ට, ලෝකයට යහපත සලස්වන්න සැඩ පරුෂ අය අල්ලගෙන මෙල්ල කරන්න වෙනවා. ඒ නිසා මෙතනදි යක්ෂ කියන කොට, චාතුර් මහා රාජිකයේ ඉන්න පාලක දෙවි දේවතාවො තමයි ප්‍රධාන වශයෙන්ම අදහස් කරන්නෙ.

ගුණ බල මහිමයෙන් ගත්තම සියලු බුදුවරු සමානයි. බුදු කෙනෙක් සමාන කරන්න පුළුවන් තවත් බුදු කෙනෙකුට විතරයි. ඉහතින් ගෞතම බුදුන් වහන්සේගෙ කාලෙ උදාහරණ පෙන්නුවත්, පුරිස ධම්ම සාරථී ගුණය පදුමුත්තර බුදුන් වහන්සේගෙ කියල වෙනසක් නෑ. එදා උන්වහන්සේ බුද්ධත්වය ලබපු මොහොතෙ දෙවියො, බ්‍රහ්මයො වගේම මේ කියන සැඩ ගති තියෙන යක්සයිනුත් සතුටින් බුදුන් වහන්සේ ඉදිරියේ, මේ සාසනය තුල කෙලෙස් දවමු, උන්වහන්සේගෙන් බණ අහමු... ආදී වශයෙන් ඔල්වරසන් දුන්නා. ඉතින් මේ වචන අහල සතුටු වෙච්ච, එදා පදුමුත්තර බුදුන් වහන්සේගෙ කාලෙ යක්ස අත්බැවේ හිටපු කොණ්ඩඤ්ඤ තාපසතුමා, බුදුන් වහන්සේට පළමු දානය පූජා කළා. එදා කොණ්ඩඤ්ඤ තාපසතුමා හිටියෙ අර දෙවියන් අතර දෙවියෙක් වෙලා. පදුමුත්තර බුදුන් වහන්සේ කරපු අනුමෝදනාවෙන්ම ඒ කාරණය පැහැදිලි වෙනවා.

යමෙක් තුසිත දෙව්ලොවින් මෙහි අවුත් මට භික්ෂාව (දානය) පිළිගැන්වී ද, මම ඔහු කවරෙක් දැයි කියන්නෙමි. එසේ කියන්නා වූ මාගේ වචනය අසවු - අපදාන පාලිය 1 - අඤ්ඤා කොණ්ඩඤ්ඤ ස්ථවිරාපදානය - 89 පිටුව.

එතකොට පදුමුත්තර බුදුන් වහන්සේට බුද්ධත්වයෙන් පස්සෙ ලැබිච්ච පළමු දානය තමයි ඒ. ඒ දානයේ ආනිසංස බුදුන් වහන්සේ අනෙක් අයට ඇහෙන්නත් එක්ක දේශනා කළා. බුද්ධ සාසනය කෙරෙහි අප්‍රමාණ පැහැදීමෙන් දුන්න ඒ දානයේ ආනිසංස සුළුපටු නෑ. කලින් ලිපිවල ඒ වගේ දානවලින් ලැබෙන ලැබීම් ගැන හොඳින් පැහැදිලි කළා. නමුත් මෙතනදි කියන්න යන්නෙ, මේ කොණ්ඩඤ්ඤ බමුණාට පළමු වෙනි මාර්ග ඵලලාභියා වෙන්න තරම් හේතු වාසනාව ලැබුනෙ කොහොමද කියන කාරණය. ධර්මයේ සඳහන් වෙනව, මේ කොණ්ඩඤ්ඤ බමුණා එක්තරා ඇත්බැවක බුද්ධ සාසනය කෙරෙහි පැහැදිලා, තමන් සතු කුඹුරේ එකම අස්වැන්නෙන් නව වතාවක් අග්‍ර වූ ප්‍රමුඛ වූ කොටස දන් දුන්න කියල. දැන් කෙනෙකුට හිතෙන්න පුළුවන් ඒකෙන් කොහොමද මුල් තැනක් ලැබෙන්නෙ, එතකොට මොකක්ද මේ අග්‍ර වූ ප්‍රමුඛ වූ කොටස කියන්නෙ, ඇයි එහෙම සාසනයට දෙන්න ඕන කියල.


**මේ වගේ අග්‍ර ප්‍රමුඛ දානයක් දෙනකොට පැරැන්නන් විසින් භාවිතා කරපු ක්‍රමයක් තියෙනවා.** ඉස්සෙල්ලම කුඹුර වපුරනවා. ඊළඟට හීන් බණ්ඩිය කියල අවස්ථාවක් එනවා. ඒක කිරි රස බොඩයක්. ඒකෙන් කොටසක් කපාගෙන, ඒ ගස් පලාගෙන හීන් බණ්ඩිය ගන්නවා. මේ හීන් බණ්ඩිය කියන්නෙ කෙලින්ම ව්‍යංජනයක් හෝ මැල්ලුමක් හෝ හදන්න පුළුවන් අවස්ථාවක්. ඒකෙන් කිරි ව්‍යංජනයක් හරි, කිරි මැල්ලුමක් හරි හදල, ඒ දානය අග්‍ර කොටස වශයෙන් බුදුන්ට පූජ කරල ඉතිරි වුනොත් දෙවන කොටස සංඝයා උදෙසා පූජ කරනවා. උදෙසා පූජ කරනවයි කියන්නෙ පුද්ගලිකව පූජ කරනව කියන එක නෙවෙයි. භික්ෂූන් වහන්සේලාට පුද්ගලිකව දානය පූජ කළත්, සඟ ගුණ සිහි කරල, අරමුණ සිහි කරල ඒ ගුණ උදෙසා දන් දුන්නම සංඝයා උදෙසා පූජ කළා වෙනවා.

දැන් තව ටික දවසක් යනකොට ඊළඟ සැරේ ගොයම් ගහ හැදිල මහ බණ්ඩිය කියල අවස්ථාවක් එනවා. ඒකෙන් දෙවන වතාවටත් කොටසක් කපාගෙන අර වගේම කිරි මැල්ලුමකින් හරි කිරි ව්‍යංජනයකින් හරි දානයක් හදල ඉඳුල් නොකර බුද්ධ පූජාවට තියල, ඉතිරි කොටසක් තියේ නම් සංඝයා වහන්සේලාටත් දන් දෙනවා. දැන් තවමත් කුඹුර ඉඳුල් කරල නෑ. ඊළඟට තව ටික දවසක් යනකොට කිරි වැදීගෙන එන අවස්ථාවක් එනවා. ඒ ඇට අතින් අරගෙන පොඩි කරල පොතු අයින් කරන්න පුළුවන් අවස්ථාවක්. එහෙම පොතු සුද්ද කරන කොට ඒ ඇට නියපොත්තෙන් තද කළොත් කිරි විසිරෙන අවස්ථාවක්. ඒ තමයි කිරි වදින ඇට. එයින් කොටසක් කපාගෙන ඒ ඇට අරගෙන කිරි බතක් හදල අග්‍ර කොටස වශයෙන් බුදුන්ට පූජා කරල, ඉතිරි වුනොත් දෙවන කොටස සංඝයා උදෙසා පූජ කරනවා. ඊළඟට ගොයම පැහිල කපන්න ඉස්සෙල්ල ඒකෙනුත් තවත් කොටසක් කපාගෙන අර වගේම අග්‍ර කොටස ☞

වෙන් කරල ඒකෙන් කිරිබත් දානයක් හදල පූජ කරනවා. ඊට පස්සෙ සම්පූර්ණ ගොයම කපල, ගොයම් කොළේ ගහල පාගන්න ඉස්සෙල්ල ඒකෙනුත් අග්‍ර කොටස වෙන් කරල අරගෙන අර විදියටම කිරිබත් දානයක් හදල පූජ කරනවා. ඊළඟට ගොයම් පාගල ඉවර වුනාට පස්සෙ, වී මැනල වෙන් කරන්න ඉස්සෙල්ල ඒකෙනුත් අග්‍ර කොටස වෙන් කරල කිරිබත් දානයක් හදල පූජ කරනවා. ඊළඟ අවස්ථාවෙ මැනල, දෙවියන්ගෙ කොටස, හවුල්කරුවන්ගෙ කොටස් ආදී වශයෙන් වෙන් කළාට පස්සෙ තමන්ගෙ කොටසින් අග්‍ර කොටස වෙන් කරල අර විදියටම කිරිබත් දානයක් හදල පූජ කරනවා. ඊළඟට වී කොටාගෙන ඇවිත් තමන්ට කියල වේලක් උයන්න ඉස්සෙල්ල ඒකෙනුත් අග්‍ර කොටස වෙන් කරගෙන අර විදියටම කිරිබත් දානයක් පූජ කරනවා. දැන් මේ විදියට ගිහින් අන්තිමට තමන්ට කන්න උයාගත්තු කිරි බතෙනුත් නැවතත් අග්‍ර කොටස වෙන් කරගෙන පූජ කරල තමයි තමන්ගෙ පාවිච්චියට ගන්නෙ. මේ අවස්ථා 9 මේ විදියටම නොවුනත් දළ වශයෙන් මේ වගේ සුදුසු අවස්ථා 9 කින් අග්‍ර කොටස වෙන් කරල මේ විදියට දන් දෙන්න පුළුවන්.

දැන් මේ විදියට අග්‍ර ප්‍රමුඛ දාන 9 ක්ම දීල ඉවර වෙනකල් තමන්ගෙ පරිභෝජනයට ගන්නෙ නෑ, ඉඳුල් කරන්නෙ නෑ. එතකල් අර විදියට බුද්ධ පූජාවයි, සංඝයා වහන්සේලාට දන් දෙන එකයි විතරයි කරන්නෙ. ඒ කියන්නෙ කුඹුරෙ ගොයම තියෙද්දි කපන අවස්ථාවලින් කවුරුවත් පරිභෝජනයට ගන්නෙ නෑ. ඒ මුල් දාන හතර පහට සාමාන්‍යයෙන් කවුරුහරි ප්‍රධාන වෙලා, හවුල් කරුවො ඉන්නවනම් ඒ අයත් සහභාගි වෙනවා. බෙදල වෙන්කර ගත්තට පස්සෙ තම තමන්ගෙ කොටස්වලින් වෙන වෙනම දාන නවයෙ ඉතිරි කොටස් සම්පූර්ණ කරන්න පුළුවන්. මේ විදියට අවස්ථා 9 ම පූජ කරල ඉවර වෙනකල් තමන්ට හිමි කොටසින් බාහිර කිසි කෙනෙක් ඉඳුල් කරන්නෙ නෑ. ඒ කියන්නෙ ගොයම පාගල වී ටික වෙන් කරගත්තට පස්සෙ, ඒකෙන් තමන්ගෙ කොටසට අදාලව විතරයි ඉඳුල් කරන්නෙ නැත්තෙ. වෙනත් අයට වෙන් කරපු කොටස් තමන්ගෙ කොටසට අදාල වෙන්නෙ නෑ. මෙහෙම වෙන් කරගෙන **හැම වෙලේම තමන්ට හිමි එක කන්නයකින් අග්‍ර ප්‍රමුඛ දාන 9 ක් දෙනවා. මේක තමයි ශ්‍රේෂ්ඨයි, අග්‍රයි කියන්නෙ.** ඒ කියන්නෙ තවමත් ඉඳුල් කළේ නැති නිසා. බුදුන් ප්‍රමුඛ මහා සංඝ රත්නයට පූජ කරනවයි කියන්නෙ ඉඳුල් කිරීමක් නෙවෙයි. තුනුරුවන් උදෙසාමයි ඒ අග්‍ර පූජාව තියන්නෙ.

ඉඳු + උල් =ඉඳුල්. උල් කියන්නෙ ලෝභ, ද්වේශ, මෝහ. ලෝභය උලක්, ද්වේශය උලක්, මෝහය උලක්. එතකොට මේ තුනෙන් කටයුතු කරන පුද්ගලයෙක් ලෝභ, ද්වේශ, මෝහවල ඉඳගෙන ආහාරයක් ගත්තොත් ඒක ඉඳුල් වෙනවා. එතකොට ඒ ආහාරයේ තියෙන ශක්තිය අරගෙන ලෝභ, ද්වේශ, මෝහ තුල ඉඳගෙන තමයි ඒ පුද්ගලය කටයුතු කරන්නෙ. ඒ ශක්තිය ඉන්දෙව්වෙ මේ තුන් දොස්වලින් කරන කටයුතුවලට. උල්වල ඉන්දෙව්වයි කියන්නෙ ඒකයි. ආහාරයක් ඉඳුල් වෙන්නෙ එහෙමයි. නමුත් බුදුන් **වහන්සේට, රහතන් වහන්සේලාට දෙන දානයක් ඉඳුල් වෙන්නෙ නෑ.** උන් වහන්සේලා උඳුල් කරන්නෙ නෑ. මොකද උන් වහන්සේලාට ලෝභ, ද්වේශ, මෝහ ඇත්තෙම නෑ. අලෝභ, අද්වේශ, අමෝහ තමයි තියෙන්නෙ. ඒ නිසා උන් වහන්සේලාට කොච්චර දන් දුන්නත් සාමාන්‍ය මිනිස්සුන්ට දුන්න වගේ ඉඳුල් වෙන්නෙ නෑ. ඒ වගේම රහත් ඵලයෙන් මෙහා ඉන්න ආර්ය ශ්‍රාවකයො වුනත් රාග, ද්වේශ, මෝහ සම්පූර්ණයෙන්ම ක්ෂය කරල නැති වුණාට ඒවායේ ඉන්ද වෙන්නෙ නෑ. මොකද ඉන්ද වෙනව කියන්නෙ ඒකෙම ඉන්නවයි කියන එක.



නමුත් ආර්ය ශ්‍රාවකයෙකුට රාග, ද්වේශ, මෝහ තිබුණත් ඒකෙ ඉඳගෙන නෑ. උලක ඉන්නව කියන එකක් නෑ. ඒවායෙන් නික්මෙන්නමයි බලන්නෙ. ඒ නිසා ඒ අයත් ඉඳුල් කරන්නෙ නෑ. ලෝකයේ ඉන්න පෘතජ්ජනයින්ට තමයි මේ ඉඳුල් කියන වචනය තියෙන්නෙ. ඉඳුල් කියන වචනය තෝර ගන්න ඕන මේ විදියට.

දැන් මේ විදියට සාසනයට පූජ **කරල දෙවියන් ඇතුළු සියලු සත්ත්වයින්ට පිං අනුමෝදන් කරනවා. ඒකෙන් විසාල සශ්‍රීකත්වයක්, සෞභාග්‍යයක් ලැබෙනවා.** ඉතින් මේ ක්‍රමය මෑතක් වෙනකල්ම පැරණි ගැමියන් අතර තිබුණා. නමුත් දැන් ඉතින් ඒක ගණන් ගන්නෙ නැති තත්ත්වයට පත් වෙලා. මොකද ඒ කාරණය සැඟවිලා ගිහින් දන්නෙ නැති නිසා. නමුත් මේ ක්‍රමය අදත් අනුගමනය කරන්න පුළුවන් නම් ඒකෙ ආනිසංස හුඟක් බලවත්. අර වගේ කිරි වඩින මුල් අවස්ථාවල ලැබෙන ඇට අරගෙන, සංඝයා වහන්සේලාටත් දන් දෙන්න ඒ ටික ප්‍රමාණවත් නැත්නම් බුද්ධ පූජාවට විතරක් තියන්නත් පුළුවන්. නමුත් මහා පරිමාණයෙන් නැතත් ලැබෙන ටිකෙන් හරි අග්‍ර කොටස වෙන් කරල කිරි ව්‍යංජනයක් හදල බුද්ධ පූජාවෙන් පස්සෙ, ඉතිරිය සංඝයා වහන්සේලාට පූජ කරන්න පුළුවන් නම් ඒකත් බොහොම හොඳයි. තමන්ට පුළුවන් විදියට අග්‍ර කොටස වෙන් කරල අර විදියට පූජා කිරීම, දන් දීම තමයි මෙතනදි වැදගත් වෙන්නෙ.

මේ ලිපිය පටන් ගන්න කොටම, පදුමුත්තර බුදුන් වහන්සේගෙ කාලයේ හිටපු යක්ෂ නම් සත්ව කොට්ඨාශයක් ගැනත්, ඒ අයගෙ ස්වභාවය ගැනත් සඳහන් කළා. ඒ වගේම ඊටත් වඩා දරුණු වෙච්ච අංගුලිමාල, ආලවක, නාලාගිරි ඇතා වගේ අයත් බුදුන් වහන්සේ ඉදිරියේ දමනය වුණා. එතකොට කාටවත් හික්මවන්න බැරි වෙච්ච අය උන්වහන්සේ ඉදිරියේ හික්මවෙන්න හේතුව මොකක්ද? රත් වුන යකඩයකට තව තවත් ගිනි ගන්න හේතු දැම්මොත් මොකද වෙන්නෙ? ඒක තව තවත් රත් වෙනවා. නමුත් සිසිල් කරන්න ඕන නම් මොකක්ද කරන්න ඕන? දැන් කාරණාව ටිකක් පැහැදිලියි. රත් වුන දෙයක් සිසිල් කරන්න නම් සිසිල් වූ යමක් දැමිය යුතුයි. සිසිල් ජලය මේ වගේ දේට වඩාත්ම හොඳයි. ඉතින් ලෝක සත්වයොත් ඔය විදිහට නිතරම රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් රත්වෙලා ඉන්නෙ. ලොවුතුරා බුදුන් වහන්සේ නමක් ලොව පහල වුනාම තමයි, අර රත්වීම නිවීම පිණිස අමා දහම් සිසිල් ජලාශය ලොවට ලැබෙන්නෙ. ඒ සිසිලසෙන් රාග, ද්වේශ, මෝහ නිවෙනවා.

ඉතින් උන්වහන්සේලාගේ මහා මෙත්තා ගුණය, මහා කරුණා ගුණය වෙන කෙනෙකුට සම කරන්න බෑ. ඒ මහා ගුණය නිසාම හික්මවන්න බැරි, ඒ වගේම හේතු වාසනා තියෙන අය හික්මෙනවා. වෙන කෙනෙකුට කරන්න බැරි දෙයක් කරන්න පුළුවන් කෙනෙක් ඉන්නව කියන්නෙ, ඒ පුද්ගලය තමයි තුන් ලෝකයෙන්ම අග්‍ර වෙන්නෙ. බුදුපියාණන් වහන්සේ නමක් තුන් ලෝකයෙන්ම අග්‍ර වෙන්නෙත් ඒ හේතුවෙන්. ඉතින් මේ කාරණය එසේ මෙසේ වැඩක් නෙවෙයි, සාරසංඛ්‍ය කල්ප ලක්ෂයක්, අටාසංඛ්‍ය කල්ප ලක්ෂයක් එහෙම නැත්නම් සොළොසාසංඛ්‍ය කල්ප ලක්ෂයක් වශයෙන් නොවිඳිනා දුක් විඳල, කිසිම පෞද්ගලික අරමුණක් නැතිව අනුන් වෙනුවෙන්ම කැපවෙලා ආපු ගමනක්. ඒක කොතරම් ශ්‍රේෂ්ඨද? ඒ නිසාම ☞

උන්වහන්සේලා අනෙක් අයට වඩා ශ්‍රේෂ්ඨ වෙනවා. ඉතින් මෙහෙම අග්‍ර වූ ශ්‍රේෂ්ඨ වූ මහා උත්තමයෙකුට, අපි දානයක් පිළියෙල කරන කොට, එහෙම නැත්නම් පිරිකරක් පූජ කරන කොට, අපට පුළුවන් විදිහට අග්‍ර වූ කොටස, එහෙම නැත්නම් ශ්‍රේෂ්ඨ වූ කොටස දෙනව හැර වෙන දෙයක් ගැලපෙනවද?

මෙතනදි කෙනෙකුට නැවත ප්‍රශ්නයක් එන්න පුළුවන්, දැන් ඉතින් බුදුන් වහන්සේ නැහැනෙ අපි කොහොමද එහෙම දානයක් හෝ පිරිකරක් හෝ පූජ කරන්නෙ කියල. දැන් මෙහෙම දෙයක් හිතමු. බෞද්ධයන් අතර බොහෝ විට භාවිතා වෙන වචන පෙළක්, එහෙම නැත්නම් කෙනෙකුට යහපත පතල කියන වචන පෙළක් තියෙනවා. ''අනේ උඹ බුදුන් දැකල නිවන් දකින්න ඕන''. මොකක්ද මේ ප්‍රාර්ථනාව හෙවත් යහපත පැතීම? ''දැන් බුදුන් වහන්සේ නැහැනෙ, කොහොමද නිවන් දකින්නෙ? මෛත්‍රී බුදුහාමුදුරුවො පහළ වෙනකල් ඉන්න වෙයිද?'' මේ විදියට ප්‍රශ්න වැලක් ඔළුවට එනවා. එහෙම නැත්නම් ඒ ගැන හිතන්නෙම නැතිව වැඩේ කල් දානවා. මේ වචන පෙලේ සැඟවුණ අර්ථයක් තියෙනවද කියල කවුරුවත් හොයල බැලුවද?

ශ්‍රී බුද්ධ දේශනාවෙ මෙහෙම දෙයක් පෙන්වා තියෙනවා. ''යමෙක් පටිච්ච සමුප්පාදය දකීද හේ ධර්මය දකී. යමෙක් ධර්මය දකීද හේ මා දකී.'' ඒ කියන්නෙ, කිව්ව දහම් තෝරගන්න නම් පටිච්ච සමුප්පාදය තේරුම් ගන්න ඕන. අන්න ඒ දහම් තේරුම් ගත්තම තමයි බුද්ධ කියන තත්වයෙ ගුණය දකින්න පුළුවන් වෙන්නෙ. ඉතින් අදත් අපිට මේ ආර්ය දහම කියා දෙන ජීවමානව වැඩ ඉන්න කල්‍යාණ මිත්‍රයන් වහන්සේලා ඉන්නවා. උන්වහන්සේලාගෙන් මේ දහම තෝරගන්න පුළුවන්. එහෙම තෝරගත්තම ධර්මය දකිනවා. ඒ දැක්ක ධර්මය තුලින් බුදුන් වහන්සේ දකිනවා. අංශු මාත්‍රයකින් හරි ධර්මය දැක්කද, ඒ අංශු මාත්‍රයෙන් බුදුන් දකිනවා. උන්වහන්සේගෙ අප්‍රමාණ ගුණස්කන්ධය වැටහෙන්න පටන් ගන්නවා. ඉතින් උන්වහන්සේ ජීවමානව වැඩ ඉන්නවා වගේ හැඟීම එනවා. ඒ හැඟීම ගන්න උදව් කරන කල්‍යාණ මිත්‍රයන් වහන්සේලා, ඒ කියන්නෙ ආර්ය සංඝයා වහන්සේලා තවම වැඩ ඉන්නවා. උන්වහන්සේලා දේශනා කරපු ධර්මය තවම තියෙනවා. ඒ තුලින් අපි බුදුන් දකිනවා. ඔය විදිහට තමයි බුදුන් දැකල නිවන් දකින්නෙ. එහෙම නැතිව මෛත්‍රී බුදු හාමුදුරුවො පහළ වෙනකල් කල් දාන්න ඕන නෑ. මජ්ජිම නිකායෙ 3 වන කාණ්ඩයෙ එන **දක්ෂිණ විභංග සූත්‍රයට අනුව බුදුන් වහන්සේ නමකට දෙන පෞද්ගලික දානයකට වඩා, ආර්ය සංඝයා වහන්සේලාට දෙන සාංඝික දානය මහත්ඵල මහානිසංසයි කියල පැහැදිලිව සඳහන් වෙනවා.** එතකොට සාසනය කෙරෙහි පැහැදිලා, සාසනය වෙනුවෙන් අග්‍ර වූ, ශ්‍රේෂ්ඨ වූ කොටස දන් දෙන්න බුදුන් වහන්සේ නමක් වැඩ ඉන්නම ඕන නෑ. උන්වහන්සේ පිහිටවපු සාසනය විද්‍යමානව තියේ නම් ඒක කරගන්න පුළුවන්.

දැන් කාරණාව පැහැදිලියි. ඒ වගේම මෙතනදි විශේෂයෙන් දැනගන්න ඕන දෙයක් තමයි ''**තමන්ට පුළුවන් ආකාරයට දන් දෙන්න**'' කියන එක. මොකක්ද මේ තමන්ට පුළුවන් ආකාරය? අද සමාජයේ මිනිස්සු විවිධ රස්සාවල් කරනවා. ඒ රස්සාවල්වල විවිධත්වය අනුව, තමන්ට ලැබිල තියෙන රස්සාව අනුව ලැබෙන වැටුප වෙනස්. එක් කෙනකුට රුපියල් පහළොස් දහසක වැටුපක් ලැබුනොත්, තව කෙනෙකුට ඊට අඩු හෝ වැඩි වෙන්න පුළුවන්. අර අඩු වැටුප ගන්න කෙනාට, වැඩි වැටුපක් ගන්න කෙනා වගේ දන් දෙන්න බෑ. වැඩි වැටුප ගන්න කෙනා පැහැදීම අනුව හොඳ වටින හාලකින් බතක් උයල දන් දෙන්න පුළුවන්. නමුත් අඩු වැටුපක් ගන්න කෙනාට පැහැදීමක් තිබුණත් එහෙම දන් දෙන්න බෑ. හැබැයි ඒ පුද්ගලයටත් අග්‍ර වූ, ප්‍රමුඛ වූ කොටස දන් දෙන්න පුළුවන්. කොහොමද ඒක කරන්නෙ? තමන් කෑමට ගන්න හාල වුනත් කමක් නෑ, ඇයි උන්වහන්සේලා අග්‍ර වුනේ, කොහොමද ශ්‍රේෂ්ඨ වුනේ කියල අර කිව්ව විදිහට ගුණස්කන්ධය දකින්න ඕන. දැන් ඒ අනුව අග්‍ර කොටස අරගෙන වෙන් කරනවා. ඒකෙන් බතක් උයල පූජ කරනවා. දැන් මහා දානයක් දුන්නා හා සමානයි. මේකෙන් ලැබීමක්, අභිවෘද්ධියක් මිසක් පිරිහීමක් නෑ. සියලුම බුද්ධ ශ්‍රාවකයන් වහන්සේලා වගේ අවසානයේ නිවනින්මයි කෙලවර වෙන්නෙ. දැන් මේකට හොඳ උදාහරණ කිහිපයකුත් ධර්මයේ සඳහන් වෙනවා.

ඒ කාලෙ හිටපු එක්තරා දුගියෙක් තමන්ගෙ ගෙදර තිබ්ච්ච සුනු සහල් කුඩු ටිකක් එකතු කරල, ඒකට ඉතිරි වෙලා තිබ්ච්ච හකුරු කැල්ලකුත් පැණි ටිකක් වශයෙන් අරගෙන, බෝතලේ අඩියෙ තිබ්ච්ච තෙල් පොඩ්ඩකුත් අරගෙන ඒකෙන් අනල තමන්ට පුළුවන් උපරිමයෙන් හදාගත්තු රොටියක් වගේ දෙයක් බුදුන් වහන්සේට පූජ කළා. රොටියක් කිව්වට ඒක මොකකටවත් නැති එකක්. නමුත් කන්න පුළුවන් මොකක් හරි දෙයක්. ඉතින් ඒ මනුස්සයට වෙන මුකුත්ම දෙන්න තිබුණෙ නෑ. තිබුණෙ එච්චරයි. එතකොට බුදුන් වහන්සේ ඒ අවස්ථාවෙ හිටපු මහ දානපතියන්ගෙ මහ දාන සියල්ලම මග හැරල ගිහින්, අර දුගිය දීපු සුනු සහල්වලින් හදපු රොටියක් වගේ එක පිළිගත්තා. ඒක විශේෂත්වයක්.

ඒ වගේම ඒ කාලෙ හිටපු ඒකසාටක කියන බමුණා, තමන්ට තිබ්ච්ච එකම සළුව බුදුන් වහන්සේට පූජ කළා. ඒ කියන්නෙ තමන්ගෙ උපරිමයෙන් පූජ කළා. ඒ වගේම ඒකට දිට්ඨ ධම්ම විපාක වශයෙන් ඒ බමුණාට කොසොල් රජතුමාගෙන් එදාම සළු 12 ක් ලැබුණා. දැන් මේ අවස්ථා දෙකේ විශේෂත්වයක් තියෙනවා. මහ දානපතියෙක් ගත්තොත් තමන්ට තියෙන එකම ආහාරය හෝ වස්ත්‍රය දන් දෙන අවස්ථාවක් ඒ වගේ අයට උදා වෙන්නෙ නෑ. මේ මොනව දන් දුන්නත් තමන්ට මොනව හරි ඉතිරි වෙනවා. නමුත් නැති බැරි කෙනෙක් තමන්ට කන්න තියෙන එකම ආහාරය, එහෙම නැත්නම් අඳින්න තියෙන එකම ඇඳිවත දන් දුන්න කියන්නෙ ඒ පුද්ගලයට ඒ අවස්ථාවෙ තවත් ආහාරයක්, ඇඳුමක් නෑ. ගන්න වත්කමකුත් නෑ. තමන්ට තියෙන්නෙ මොකක්ද ඒක උපරිමයෙන් දන් දෙනවා. නමුත් ලොකුවට තියෙන කෙනා තව එකක් ගන්න බලාගෙන, තියෙන එක දන් දෙන්න පුළුවන්. එහෙම නැත්නම් තමන්ට තියෙන නිසා දන් දෙන්න පුළුවන්. හැබැයි ඒක දුන්නයි කියල ඒ පුද්ගලයට නැති වෙන්නෙ නෑ. නමුත් එකම සේසත තියෙන කෙනා ඒකත් දන් දුන්නම, මම පුළුවන් විදියට මගෙ අන්තිම සේසතත් දන් දුන්න කියන්නෙ ඒකෙ වටිනාකම වැඩියි. ඒක චිත්ත ප්‍රසාදයෙන් දුන්න මිසක් තියෙන නිසා දුන්න නෙවෙයි. දානෙ සුළු වුනාට ඒක අග්‍රයි, ශ්‍රේෂ්ටයි. එතකොට ඒක විශේෂ වෙනවා. මහ දානපතියො පැහැදීමෙන් දන් දෙන්නෙ නෑ කියලවත්, ඒ අයගෙ දාන අග්‍ර ශ්‍රේෂ්ඨ වෙන්නෙ නෑ කියලවත් මේකෙන් කියන්නෙ නෑ. තමන්ට පුළුවන් විදිහට තමන්ගෙ එකම සේසත, පැහැදීම නිසා දන් දුන්නම ඒක අග්‍ර ශ්‍රේෂ්ඨ වෙන හැටි තමයි මේ පෙන්වා දුන්නෙ.

දැන් මේ විදියට ගුණ දැකල පැහැදුන කොණ්ඩඤ්ඤ බමුණා, නව වතාවක් අග්‍ර ප්‍රමුඛ කොටස දන් දුන්නා. ප්‍රතිඵලය විදියට සියලුම දෙව් සැප සම්පත් එක්ක අවසානයේ පැතුම් පරිදි ගෞතම බුද්ධ සාසනයේ පළමුවෙනි මග ඵල ලාභියා බවට පත් වුනා.

*අපදාන පාලිය 1- අඤ්ඤා කොණ්ඩඤ්ඤ ස්ථවිරාවදානය ඇසුරින් සකස් කළේ:*

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# දහමේ පෙන්වන නීථාර්ථ, නෙයියාර්ථ සහ ව්‍යංගාර්ථ

*(පසුගිය කලාපයෙන් - ලෞකික අභිවෘද්ධිය සලසන වටිනා දහම් කොටස් ත්‍රිපිටකයෙන් ගිලිහී ගිය හැටි....)*

බුදුන් වහන්සේ දහම් දේශනා කරන කොට නීථාර්ථ සහ නෙයියාර්ථ කියල ක්‍රම දෙකකින් යම් අදහසක් ප්‍රකාශ කරන බව පසුගිය කලාපයෙන් පැහැදිලි කළා. නීථාර්ථයෙන් කියන්නෙ මොකක්ද කියල වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම තේරුම් ගන්න පුළුවන්. ඒකට වෙන වෙන අර්ථ නිරූපන දෙන්න ඕන නෑ. කියපු දේ පැහැදිලියි. නමුත් නෙයියාර්ථ කියන එක එහෙම නෙවෙයි. සැඟවිච්ච අදහසක් තමයි ඒකෙන් දෙන්නෙ. ඒක තෝරගන්න අත්ථ, ධම්ම, නිරුක්ති, පටිභාන කියන සිවුපිළිසිඹියා ඥාන යම් පමණකට හරි අවශ්‍යයි. අද වෙන කොට තෝර ගන්න බැරිව පටලවා ගෙන තියෙන්නෙත් මේකම තමයි. ඒ කියන්නෙ නෙයියාර්ථයෙන් කියපු දේ තෝර ගන්න බෑ. මේ වගේ දේවල් ත්‍රිපිටකයෙ බොහෝ තැන්වල සඳහන් වුනත් තෝරා ගැනීමේ හැකියාව නැති නිසාත්, ලෝක සම්මත භාෂා ව්‍යාකරණ නීතිරීතිවලින් සියල්ල අර්ථ දක්වන්න යෑම නිසාත් බොහෝ උදවිය අද වෙන කොට මහා පඹ ගාලක පැටලිලා ඉන්නෙ. ඉතින් සමහර නෙයියාර්ථ තියෙනවා වැදගත්කම කියල නිම කරන්න බෑ. ඒ තරම් වටිනවා. නමුත් හරියට තෝරගෙන නෑ.



උදාහරණ විදියට මඩ වලකින් කර වටක් එරෙනකල් ගිහින්, ආපහු හැරිල එන්න කියල එදා හිටපු පෝට්ල හාමුදුරුවන්ට අවුරුදු 7 ක පොඩි හාමුදුරුනමක් දීපු කර්මස්ථානයක් තියෙනවා. ඒකත් අද වෙන කොට පටලවා ගෙන. මඩ වලට බැහැල ගියා. මඩ වලේ කර වටක් එරෙන කල් ගිහින් ආපහු ආවා. ඊට පස්සෙ මඩ හෝදගන්න කියල කර්මස්ථානයක් දුන්නා. දැන් මේ කතාව ත්‍රිපිටකයෙ තියෙනවා. නමුත් අර්ථය විග්‍රහ කරල නෑ. මොකද ඒක නෙයියාර්ථයක්. එතකොට ඒක කර්මස්ථානයක් වුනේ කොහොමද? ඒකෙ අදහස මොකක්ද? ඇයි මඩ වලට බැහැල යන්න කිව්වෙ? ඇයි කර වටක් එරෙන කල් යන්න කිව්වෙ? ඇයි ආපසු එන්න කිව්වෙ? මේ මොකවත් දන්නෙ නෑ. දැන් ඉතින් මේක තෝරගන්න බැරුව කෙනෙක් මෝඩකමට කියන්න පුළුවන්, ඕක නවක වදයට දීපු දෙයක් කියල. නෙයියාර්ථෙ දන්නෙ නැති නිසා මෝඩකමට ඒ වගේ අදහස් ගන්න පුළුවන්. මොකද අද වෙන කොට භික්ෂූන් වහන්සේලාගෙත් බොහොමයක් අධ්‍යාපන ආයතනවල ඔය කියන නවක වදය තියෙන නිසා ඒකම මෙතනටත් ආදේශ කරන්න පුළුවන්.

දැන් මේ පෝට්ල හාමුදුරුවො කියන්නෙ කකුසඳ, කෝණාගම, කාශ්‍යප කියන බුදුවරයන් වහන්සේලාගේ ශාසනවලත් ත්‍රිපිටකය කට පාඩම් කරගෙන බණ කිය කිය ඇවිදපු, ඒ පුරුද්දට ගෞතම බුද්ධ ශාසනයෙත් ඒ වැඩේම කරපු හාමුදුරු නමක්. නමුත් මේ ත්‍රිපිටකය කිව්වෙ අද තියෙන ත්‍රිපිටකය නෙවෙයි. විනය, සූත්‍ර, අභිධර්ම කියල ඒ කාලයේ වෙන් කර ගත්තු ආකාරයක්. උදාහරණ විදියට එදා විනය වශයෙන් ගත්තෙ රාග විනය, ද්වේශ විනය, මෝහ විනය. නමුත් අද විනය කියන්නෙ 227 ක් සික්ඛා පදවලට. කොහොම හරි මේ පෝට්ල හාමුදුරුවො බණ කිව්වට උන් වහන්සේ නිවන් දකල තිබුනෙත් නෑ. එතකොට බුදුන් වහන්සේ මේ පෝට්ල හාමුදුරුවන්ට තුච්ඡ පෝට්ල කියල තමයි අන්තිමට කතා කළේ. ඒ කියන්නෙ මනා නිග්‍රහයෙන් නිග්‍රහ කළා. පෝට්ල කිව්වෙ පොට්ට වූ ඇට් ගැහිච්ච ළයක් කියන අර්ථයෙන්. (පෝ + ඇට් + ළය =පෝට්ල) එතකොට මෙච්චර කලක් දේශනා කරපු ධර්මයෙන් උන් වහන්සේ තුච්ඡ පෝට්ල වුනේ කොහොමද? හරි ධර්මයක් දේශනා කළා නම් බුදුන් වහන්සේ එහෙම නිග්‍රහ කරන්නෙ නෑ. මොකක් හරි අඩුපාඩුවක් තිබිච්ච නිසයි එහෙම කිව්වෙ. හැබැයි ඒ අඩුපාඩුව උන් වහන්සේ ඒ වෙලාවෙ දැනුම් දුන්නෙ නෑ. මොකද ඒකට සුදුසු අවස්ථාවත් බුදුන් වහන්සේ දැනගෙන හිටියා. ඒ කියන්නෙ මේ පෝට්ල හාමුදුරුවන්ට තවත් පොඩි හාමුදුරු නමකගෙන් තමයි මට්ටු වෙන්න ලැබෙන්නෙ කියන කාරණය බුදුන් වහන්සේ දැනගෙන හිටියා. ඒ නිසා තමයි උන් වහන්සේ නිහඬව අතහැරියෙ.

තමන් බණ දහම් දන්නව කියල මේ පෝට්ල හාමුදුරුවන්ට ලොකු මාන්නයක් තිබුණා. පොඩි හාමුදුරු නමකගෙ මාධ්‍යයෙන් තමයි ඒ මාන්නය අරින්න ඕන. ඒකත් බුදුන් වහන්සේ දැනගෙන හිටිය කියල නිගමනය කරන්න පුළුවන්. ඒ නිසා තමයි තුච්ඡ පෝට්ල කියල විතරක් නිකන් හිටියෙ. පස්සෙ මේ පෝට්ල හාමුදුරුවොම කල්පනා කරන්න පටන් ගත්ත, ඇයි මට බුදුන් වහන්සේ තුච්ඡ පෝට්ල කියල කතා කළේ කියල. මොකද බුදු කෙනෙක් නිකරුනේ එහෙම කෙනෙකුට නිග්‍රහ කරන්නෙ නෑ. කොහොම හරි උන්වහන්සේම හොයාගෙන ගිහින් තමයි, අර පොඩි හාමුදුරුවො තමන්ට මඩ වලේ කර වටක් එරෙනකල් ගිහින් ආපසු හැරිල එන්න කියපු කාරණයෙන් යමක් තේරුම් ගත්තෙ. මේක හොඳට පැහැදිලිව තේරුම් ගන්න පුළුවන් දෙයක්.

**අදත් පෝට්ල හාමුදුරුවො වගේ බණ කියන අය ඉන්නවා. ඒ කියන්නෙ බුදුන් වහන්සේ බණ කිව්වෙ නිවන් දකින්න විතරමයි කියල ඒ අදහසේ ඉඳගෙන තමන් දන්න බව පෙන්වන්න මාන්නක්කාරකමට දේශනා කරනවා.** ''චතුරාර්ය සත්‍යය විතරමයි දේශනා කළේ, නිවන් දකින්න විතරයි දේශනා කළේ, වෙන වෙන බෝධි පූජා පහන් පත්තු කෙරිලි, වන්දනාමාන කර කර ඉන්න කිව්වෙ නෑ, බුදු බණ තියෙන්නෙ

නිවන් දකින්න විතරමයි'' දැන් මෙහෙම දේශනා කර කර කෙලින්ම මිනිස්සු අරිහත්වයට පත් කරන්න උත්සාහ කරනවා. නමුත් අන්තිමට බලන කොට ඒ බණ කියන උදවිය නිවන් දැකලත් නෑ. ඒක තමයි විශේෂත්වය. පෝට්ඨිල හාමුදුරුවොත් මේ වගේ බණ කියපු කෙනෙක්. නමුත් **ඒ ක්‍රමය හරි යන්නෙ නෑ කියල පෙන්වන්න තමයි අර මඩ වලේ කර වටක් එරෙන කල් ගිහින් නැවත ගොඩට එන ක්‍රමය උපමා කරල පෙන්නුවෙ.** ඒ කියන්නෙ කාමය නමැති මඩ වලේ කර වටක් එරිල ඉන්න මිනිස්සු තමයි ලෝකයේ ඉන්නෙ. එතකොට ගොඩ බිම කියන්නෙ නිවන. දැන් ඉතින් මේ මිනිස්සුන්ට කිව්වොත් කෙලින්ම ගොඩට කකුළ තියන්න කියල ඒක කරන්න පුළුවන්ද? මේ වගේ පෝට්ඨිල හාමුදුරුවන්ට මඩ වලක් පෙන්නල කර වටක් එරෙනකල් යන්න කිව්වා. දැන් ආපහු හැරිල එන්න කිව්වම, ආපහු එන හැටි පෝට්ඨිල හාමුදුරුවො හොයල බැලුවා. දැන් එක පාරටම ගොඩ බිමට අඩිය තියන්න බෑ. අඩියෙන් අඩිය ගොඩ පැත්තට තියෙන මඩට අඩිය තිය තියා එන්න ඕන. ඉස්සෙල්ල එක අඩියක් තිව්වා. ඊළඟට තවත් ටිකක් ගොඩ පැත්තට තියෙන මඩට අඩිය තිව්වා. දැන් ටික ටික අර කර වටක් එරිල තිබිච්ච මට්ටම ක්‍රමයෙන් පපු මට්ටමට, බඩ මට්ටමට, ඉණ මට්ටමට, දණහිස මට්ටමට ආවා. ඔය විදියට ඇවිත් තමයි ක්‍රමයෙන් ගොඩට ආවෙ. දැන් අර පොඩි හාමුදුරුවො පෝට්ඨිල හාමුදුරුවන්ගෙන් ප්‍රශ්න අහනවා. නුඹ ගොඩට ආවෙ නැද්ද? ආවා. කොහොමද මේ මඩ වලෙන් ගොඩට ආවෙ? එක පාරටම අඩිය තිව්වද? නෑ. කොහොමද අඩිය තිව්වෙ? මඩ වලේම ගොඩ පැත්තට තියෙන මඩට අඩිය තිව්වා.

මේ තමයි මේ කර්මස්ථානයේ මෙතෙක් කලක් වැහිල තිබිච්ච කොටස. ඒක විසඳල දීපු ආකාරය නුවණට වැටහෙන ක්‍රමයක් තමයි මේ ඉදිරිපත් කරන්නෙ.

එහෙනම් **මේ කාම මඩේ එරිල ඉන්න මිනිස්සුන්ට ඉස්සෙල්ලම කාම මිථ්‍යාචාරය අයින් කර ගන්න කියල කියනව මිසක් පූර්ණ බ්‍රහ්ම චරියාවෙ හැසිරෙන්න කියල කිව්වට හරියන්නෙ නෑ, රහත් වෙන්න කිව්වට වැඩක් නෑ.** ඒ තමයි මාර්ගයේ හැටි. මාර්ගය දීල තියෙන්නෙ අනුපූර්ව ක්‍රමයට යන්න. හරියට සාමාන්‍ය පෙළ විභාගය සමත් වෙලා ඊළඟට උසස් පෙළ කරනව වගේ. සාමාන්‍ය පෙළ සමත් නොවී පහේ පන්තියේ ඉන්න ළමයෙකුට එක පාරටම උසස් පෙළ ප්‍රශ්න පත්‍රයක් දීල මේකට උත්තර ලියපන් කියල කිව්වට හරි යන්නෙ නෑ. මේ වගේ කාමයේ වැතිරිලා ඉන්න කොට එක පාරටම සිවුරු දා ගනින්, රහත් වෙයන් කියල කිව්වට ඒක හරියන්නෙ නෑ. ඒ නිසා තමයි බුදුන් වහන්සේ දේශනා කළේ මහණෙනි, රහතුන්ගෙන් බලාපොරොත්තු වෙන්නා වූ චරිතය නුඹලගෙන් බලාපොරොත්තු වෙන්නෙ නෑ කියල. නුඹල එතැනට යන්න උත්සාහ කරන්න කියල තමයි දේශනා කළේ. එහෙම නැතිව පෘතජ්ජන මානසිකත්වය තියෙන අයගෙන් රහතන් වහන්සේගෙ චරිතය බලාපොරොත්තු වුනේ නෑ. එතැනට යන්න උත්සාහ, වීර්ය වඩන්න ඕන. ඒ වගේ තමයි කර වටක් මඩේ එරිල ඉන්න කෙනා ගොඩ බිමට එන්න උත්සාහ, වීර්ය කරන්නෙ. ඉස්සෙල්ලම එක්තරා මට්ටමකට එන්න උත්සාහ ගන්න ඕන. එතකොට ටිකක් උඩට එනවා. මේ වගේ කාමයේ හැසිරෙන කෙනා ඉස්සෙල්ලම කාම මිථ්‍යාචාරය ඉවත් කරගන්න ඕන. එහෙම නැතිව එක පාරටම කාමය අත් හරින්න බෑ. ඊළඟට බහු භාර්යා සේවනයක් තිබුන නම් ඒක අත්



හැරල, ඒක භාර්යා සේවනයට එනවා. ඊළඟට ඒකත් පුළුවන් තරම් ක්‍රමයෙන් අඩු කර ගන්න උත්සාහ කරනවා. අන්තිමට එහෙම ඇවිත් තමයි සම්පූර්ණ කෙළෙස් සිඳල අරිහත්වයට පත්වෙන්නෙ. ඒ විදියට උපමාව පෙන්නුවා මිසක් එක පාරටම රහතන් වහන්සේ වගේ හැසිරෙන්න කිව්වෙ නෑ. මොකද එහෙම කරන්න බැරි නිසා.

දැන් මෙතනදි කෙනෙකුට තවත් ප්‍රශ්නයක් එන්න පුළුවන්, එතකොට ඒ කාලෙ හිටපු දාරුචීරිය, සන්තති ඇමති වගේ අය එක බණ දේශනාවක් අහන කොටම රහත් වුනේ ඔය කියන අනුපූර්ව ක්‍රමය අනුගමනය කරලද, ඔය මුකුත්ම නැතිව එක බණ දේශනාවක් අහන කොටම අරිහත්වයට පත් වෙච්ච අය හිටියෙ නැද්ද කියල. කාරණය ඇත්ත. නමුත් මේ අනුපූර්ව ක්‍රමය දීල තියෙන්නෙ ප්‍රඥාව පූර්ණ වෙච්ච නැති අයට. බුදුන් වහන්සේට ඉන්ද්‍රිය නානත්වය දකින ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥානය තිබුණු නිසා එදා හිටපු සියල්ලන්ගෙම තත්ත්වය උන් වහන්සේ දැක්කා. එක බණ දේශනාවකින් රහත් වෙන්න, ඒකට සුදුසු ප්‍රඥා ඉන්ද්‍රිය වැඩිච්ච අය උන් වහන්සේ දැක්කා. මේ විදියට ශ්‍රද්ධා, වීර්ය, සති, සමාධි, ප්‍රඥා කියන ඉන්ද්‍රිය 5 ම පූර්ණ නම් ඒ අයට පෙර සසරෙදි පුරුදු කරල තියෙන පුරුද්ද මතු වෙලා එනවා. එහෙම කෙනෙක් දැක්කොත් බුදුන් වහන්සේ ඒ බව දැනගෙනම අග්‍ර ශ්‍රේෂ්ටතම අරිහත් ඵලය පූර්ණ කරගන්න පුළුවන් දහම් දේශනාවක් ඒ අයට එල්ල කරලම දෙනවා. දාරුචීරිය, සන්තති ඇමති කියන්නෙ ඒ වගේ අය. ඒ සියලු දෙනාම කාශ්‍යප බුදුන් වහන්සේගෙ කාලයෙදි අනුපූර්ව ක්‍රමය පූර්ණ කරපු අය. ඒ අයට එක දේශනාවක් ඇහුවත් නිවන පූර්ණ කරගන්න පුළුවන්. නමුත් එහෙම නැති අයට තමයි අර විදියට මුල ඉඳල යන්න අනුපූර්ව ක්‍රමය පෙන්වල දීල තියෙන්නෙ. ඉතින් සමාජය ගත්තම අති බහුතරයක් ඉන්නෙ එහෙම පූර්ණ වෙච්ච නැති, අනුපූර්ව ක්‍රමය අනුගමනය කරන්න ඕන අය.

ඉතින් මේ වගේ **අදත් කවුරුහරි කියනව නම් රහතන් වහන්සේගෙ චරිතෙම කරපන් කියල, ඒ අයට එහෙම ගිහින් කවදාවත් නිවන් දකින්න බෑ. මොකද ඒකට අනුපූර්ව ක්‍රමයක් දීල තියෙනවා.** මේ ක්‍රමයම තමයි අද පුනරුත්ථාපනය (නැවත නගා සිටුවීම) කරනව කියල, වරදට පෙළඹුනු මිනිස්සු ලෞකිකව යහමගට ගන්න යොදා ගන්නෙත්. එතනදිත් අනුපූර්ව ක්‍රමයක් තමයි භාවිතා කරන්නෙ. ඒ කියන්නෙ මනුස්සය ඉස්සෙල්ලම හිටියෙ මත්ද්‍රව්‍ය වගේ මුකුත් භාවිතා කරන්නෙ නැතිව. පස්සෙ ඒවට ඇබ්බැහි වෙලා මනස විකෘති වෙනවා. දැන් නැවතත් අර මුල් තත්ත්වයට උස්සල තියන්න ඕන, නගා සිටුවන්න ඕන. හැබැයි ඒක එක පාරටම කරන්න බෑ. අර වගේ අනුපූර්ව ක්‍රමයකට කරන්න ඕන. එක පාරටම මත් කුඩු භාවිතය නවත්වන්න කිව්වොත් ඒක දරාගන්න බැරිව මනුස්සය පිස්සු වැටෙනවා, මනස විකෘති වෙනවා. මොකද මේ වෙන කොට පුරුදු වෙලා හිටපු අසහනකාරී මානසිකත්වය එක පාරටම හදා ගන්න බෑ. ඒ නිසා මත් පෙත්තට වඩා ටිකක් අඩුවෙන් 75% ක් විතර තියෙන බර අඩු මත් පෙත්තක් දෙනවා. දැන් ඒක මදියි කියල කෑ ගහනවා. නමුත් මොකුත්ම නොදී ඉන්නව වගේ නෙවෙයි, ඒක දරාගන්න පුළුවන්. මේ විදියට ☞

සුමානයක් විතර දෙනකොට අර සාන්ද්‍රණය අධික මත් පෙත්ත දැන් ඕන නෑ. අඩු එකෙන් සෑහෙන්න පුළුවන්. ඊළඟට තවත් බර අඩු 50% ක විතර මත් පෙත්තක් දෙනවා. නැවතත් කෑ ගහනව, අනේ ඒක නම් මදි කියල. හැබැයි ඒකත් දරන්න පුළුවන්. මෙහෙම ටිකෙන් ටික 25%, 10% .... ආදී වශයෙන් අඩු කරල අන්තිමට මොකුත්ම නොදී ඉන්නවා. එතකොට මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම නවත්වන්න පුළුවන්. හැබැයි මුලින්ම මොකුත්ම නොදී හිටිය නම් එහෙම ඒක දරාගන්න බැරිව පිස්සෙක් වෙනවා.

මෙන්න මේ වගේ තමයි රාගයට බැඳිච්ච කෙනා, කර වටක් කාම මඩේ එරිල ඉන්න කෙනා මේ වගේ දැඩි අසහනකාරී තත්ත්වයක තමයි ඉන්නෙ. ඉතින් ඒ පුද්ගලයට එක පාරටම චතුරාර්ය සත්‍යය මේකයි කියල, රහතන් වහන්සේ නමක් කරන්න බෑ. එහෙම ක්‍රමයක් නෑ. අනුපූර්ව චර්යා, අනුපූර්ව ශික්ෂා, අනුපූර්ව සමාධි වශයෙන් ක්‍රමයක් දුන්නෙ ඒකට තමයි. ඒ ඔක්කොම අනුපූර්ව ක්‍රමයට දීල තියෙන්නෙ.

දැන් මේ පෝඨිල හාමුදුරුවන්ගෙ කතාවෙදි ඕක නෙයියාර්ථයෙන් තමයි දුන්නෙ. ඉතින් ඒක මොකක්ද කියල තෝරල දුන්නම තමයි, ඒවං උපසංහරති (එසේ උපමා සංසන්දනයෙන්) කියන සිද්ධාන්තය අනුව මේ කියන කතාව ඇත්ත තමයි කියල වැටහෙන්නෙ. උපමාව සංසන්දනය කරල බැලුවම පෝඨිල හාමුදුරුවන්ට වැටහුණා, ඇත්ත වශයෙන්ම තමන් කරල තියෙන්නෙ මෝඩ වැඩක් කියල. තුච්ඡ පෝඨිල වුනේ ඒකෙන්. ''බුද්ධාන්තර 3 ක් තිස්සෙ මම බණ කිව්වට කියල තියෙන්නෙ මොනවද? මමනෙ වරද්දගෙන තියෙන්නෙ. මටවත් ප්‍රතිඵලයක් නැනෙ!'' මේ විදියට පෝඨිල හාමුදුරුවන්ට කාරණය වැටහුණා. මෙතනදි තවත් විශේෂ කාරණයක් බුද්ධ දේශනාවෙ තියෙනවා. බුදු රජාණන් වහන්සේගෙන් භික්ෂූන් වහන්සේ නමක් අහනවා, අනුන්ට බණ කිව්වම ශ්‍රාවකයාට මොනවද ලැබෙන්නෙ කියල. නිවන් ලැබෙනවා කියනවා. එතකොට දේශනා කරපු දේශකයට මොනවද ලැබෙන්නෙ කියල අහනවා. අමෘතය ලැබෙනවා කියනවා. මේ දෙකම එකයි. නමුත් වචන දෙකකින් කිව්වෙ. අමා මහ නිවන කියලත් අද අපි ඒකට කියනවා. අනුන්ට බණ කියන එකෙන් තමන්ට අමෘතය ලැබෙනවා, නිවන් ලැබෙනවා. හැබැයි බණ හරියට කිව්වනම් තමයි ඒක හරියට ලැබෙන්නෙ. අනුන්ට වැරැද්දුවොත් තමන්ටත් වරදිනවා.

දැන් එතකොට ඇයි මේ එකම නිවන වචන 2 කින් පෙන්නුවෙ? අමෘතය හෙවත් **අමරණීය කියන්නෙ, ඒ දේශනා කරපු දේශකයාණන් වහන්සේගෙ නම මැරෙන්නෙ නෑ කියන එක. ඒ කියන්නෙ ඒ නම සමාජය අතර පවතිනවා.** උදාහරණ විදියට ගත්තොත් ඒ කාලෙ රහතන් වහන්සේලා ලක්ෂ ගණන් අරිහත්වයට පත් වෙලා පිරිනිවන් පෑවත්, ඒ අති මහත් බහුතරයකගෙ නම් ගැන කිසිම ආරංචියක් නෑ. මොකද ඒ අය අතර මහා දේශකයාණන් වහන්සේලා හිටියෙ ඉතා අතලොස්සයි. එතකොට සැරියුත්, මුගලන්, කාශ්‍යප වගේ මහ රහතන් වහන්සේලාගෙ නම් අමරණීයයි. දේශකයාට අමෘතය ලැබෙනව කිව්වෙ ඒකයි. අදත් සමාජයේ යම්කිසි ක්ෂේත්‍රයකින් විශේෂ හැකියාවක් තිබ්බ ප්‍රසිද්ධ කෙනෙක් මියගියාම, අහවලා සදා අමරණීයයි කියල ලෝක සම්මතයේ මිනිස්සු අතර කතා බහ වෙනවා. ඒ කියන්නෙ ඒ පුද්ගලයා මිය ගියත් නම ජනතාව අතර නොමැරෙනවයි කියන එක. මෙන්න මේ වගේ අමෘතය ලැබුනම නම මැරෙන්නෙ නෑ. ඒ ගෞරවනීය නම ලෝකයා අතර පවතිනවා. ඒ නිසා තමයි සැරියුත්, මුගලන්, කාශ්‍යප ආදී මහ රහතන් වහන්සේලාගෙ නම් අදත් අහන්න තියෙන්නෙ. ඒ නම් මතකයෙන් ඈත් නොවිච්ච නිසා. එතකොට ඒ නම් කාලයක් ලෝකයා අතර පවතිනවා. නමුත් ලක්ෂ සංඛ්‍යාත රහතන් වහන්සේලා රහත් වුනත්, නිවන් දැක්කත් උන් වහන්සේලා ගැන ආරංචියක් නෑ, ලෝකයා අතර පවතින නමක් නෑ.

ඒ වගේම පෙර වැඩ හිටපු බුදු පියාණන් වහන්සේලාගේ නම්, කාලයත් සමග කොච්චර දුරස් වුනත්, ඊට පස්සෙ පහළ වෙන එක එක බුදුවරයාණන් වහන්සේලාගෙන් නැවත විද්‍යමාන වෙනවා. කකුසඳ, කෝණාගම, කාශ්‍යප ආදී බුදුවරයන් වහන්සේලා ගැන අපි දන්නෙ, ඊට පස්සෙ පහළ වෙච්ච ගෞතම බුදුන් වහන්සේ විසින් උන් වහන්සේලා ගැන ප්‍රකාශ කරපු නිසා. පෙර හිටපු හැම බුදුවරයන් වහන්සේ නමක් ගැනම ඊට පස්සෙ පහළ වෙන බුදුවරයන් වහන්සේ නමකගෙන් විද්‍යමාන වෙනවා. මොකද ඊට පස්සෙ පහළ වෙන බුදුවරයන් වහන්සේලා විසින් ඒක නැවතත් මතු කරල දෙනවා. ඒ කියන්නෙ ඒ නම් මැරෙන්නෙ නෑ, අමරණීයයි. මේ විදියට ඒ කාලෙ හිටපු අග්‍ර මහා ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගෙ, අසූ මහා ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගෙ නම් අදටත් අමරණීයයි. නමුත් හැම කෙනෙක්ගෙම නම් එහෙම අමරණීය වෙන්නෙ නෑ. ඒකට විශේෂත්වයක් තියෙන්න ඕන.

දැන් මෙතනදි කෙනෙකුට තවත් ප්‍රශ්නයක් එන්න පුළුවන්, එතකොට පෝඨිල හාමුදුරුවන්ගෙ නමත් මේ විදියට ශාසනය තුළ ප්‍රසිද්ධ වෙලා තියෙන්නෙ ඒ නමත් අමරණීය නිසාද කියල. මෙතනදි නම අමරණීයයි, පවතිනවයි කිව්වම කාරණා 2 ක් තියෙනවා. එකක් ගුණ යහපත් හැකියාවන්ගෙන් අග්‍ර නිසා. ඒක තමයි ඉස්සෙල්ල කිව්වෙ. ඒ වගේම **කෙනෙක්ගෙ තිබ්බ නුගුණයක්, අඩුපාඩුවක් නිසාත් ඒ නම ප්‍රසිද්ධ වෙන්න පුළුවන්. නමුත් ඒ අවස්ථාවෙදි ඒක මරණයට පත්වෙන කෙනෙක්ගෙ නමක්. ඒක ප්‍රසිද්ධ වුනයි කියල අමරණීය වෙන්නෙ නෑ. මොකද මිනිස්සු අතර ඒ නම ප්‍රසිද්ධ වෙලා තියෙන්නෙ ගෞරවනීය විදියට නෙවෙයි.** පමාදෝ මච්චුනෝ පදං කියල ප්‍රමාද පුද්ගලයා මැරිච්ච පුද්ගලයෙක් හා සමානයි කිව්වෙත් ඒකයි. ඒ නිසා ඒ පුද්ගලයගෙ නම ප්‍රසිද්ධ වෙලා තිබුණට මැරිච්ච පුද්ගලයෙක්ගෙ ගොඩට තමයි ඒ කාල සීමාවෙදි වැටෙන්නෙ. නමුත් අමරණීය කියන්නෙ ඒක නෙවෙයි. පුද්ගලයගෙ කය මළත් නමට මිනිස්සු ගරු කරනවා. ඒ වගේම නැවතත් සසර ගමනක් නෑ. එතකොට අජර + අමර - අජරාමර වෙනවා. ඒ කියන්නෙ නිවන් දැකල නමත් අමරණීය වෙනවා. නමුත් පුද්ගලයෙක් නෑ. එතකොට පෝඨිල හාමුදුරුවොත් අන්තිමට රහත් වුණා. නමුත් උන් වහන්සේගෙ නම යන්නෙ තවමත් අර පරණ විදියටම, මෙන්න මේ වගේ අඩුපාඩුවක් ඇතිව සසරෙ ආපු කෙනෙක් කියල. එහෙම නැතිව උන් වහන්සේ රහත් වුනාට පස්සෙ වෙච්ච කතා දැන් කියවෙන්නෙ නෑ. අර කලින් වෙච්ච තුච්ඡ පෝඨිල කතාවම තමයි අනෙක් අයට ආදර්ශයක් වෙන්න කියන්නෙ. නමුත් උන් වහන්සෙත් නිවන් දැක්කා.

ඉතින් මේ පෝඨිල හාමුදුරුවොත් මිනිස්සුන්ට බණ කියන කොට අනුපූර්ව ක්‍රමය කපල දාල ගැඹුරුම බණ තමයි කියන්න පටන් ගත්තෙ. ඒ කියන්නෙ නිවන් දකින එක විතරමයි. ඒකට අර අනුපූර්ව ක්‍රමය, පංච සීල ප්‍රතිපත්තිය කිව්වෙ නෑ. නිවන් දකින්න ඕන නම්, ඒව කියල බෑ ප්‍රතිපත්ති රකින්න කියනවා. **මේ වගේ අදත් සමහරු, කවදාවත් මහණ වෙන්නෙ නැතිව නිවන් දකින්න බෑ කියන දෘෂ්ටියේ ඉන්නවා. නමුත් ඒක මොනම ධර්මයකටවත් ගලපන්න බෑ.** ඒ වගේම ගිහියෙක් හොඳ බණක් කිව්වොත් සමහර හාමුදුරුවරු අහනව, ඇයි උඹල ගිහියන්ගෙන් බණ අහන්නෙ? ඇයි ගිහියන්ට වඳින්නෙ? ගිහියො කවද්ද නිවන් දැක්කෙ? නිවන් දකින්න පැවිදි වෙන්න ඕනනෙ..... මේ ආදී වශයෙන්. දහම දන්නෙ නැති නිසා මේ වගේ කතා කියනවා. දහම දන්නව නම් ගිහියො නිවන් දැකපු අවස්ථා කොච්චර නම් දැනගෙන තියෙන්න ඕනද? විශාඛා උපාසිකාව, අනේපිඬු සිටුතුමා, ධම්මික උපාසක, චිත්තගහපති, ද්‍රෝණ බමුණා.... මේ

වගේ ගිහි වතේ ඉඳගෙන නිවන් දැකපු අය එදා කොච්චර නම් හිටියද? එතකොට ඒ සමහර අය බණ කිව්වෙ නැද්ද? තමන් දන්න ටික අනිත් අයටත් කියල දුන්නා. එතකොට ඒකෙන් වෙච්ච වැරැද්ද මොකක්ද? මේ වගේ කරුණු කාරණා හොයල බලන්නෙ නැතිව සමහරු ඊරිසියාවට, කුහකකමට අර වගේ කතා කියනවා. ඒ කියන්නෙ ලාභ, කීර්ති, ප්‍රශංසාවලට ගිජු වුනාම තමන් ඉන්න තැනත් අමතක වෙනවා. තමන්ට ඒව නොලැබෙයි කියන බයෙන් මේ වගේ දහම් විරෝධී කතා කියනවා.

දැන් ඊළඟට ව්‍යංගාර්ථ කියල දෙයක් තියෙනවා. ඒක නීථාර්ථ හා නෙයියාර්ථ එක්ක පටලවා නොගත යුතුයි. අපි වහෙන් ඔරෝ භාෂාව කියල කියනවා. ඒ කියන්නෙ ව්‍යංගාර්ථයෙන්. හැබැයි ඒ වෙන වචනයක් නෙවෙයි, ඒ වචනයම වෙනත් විදියකින් කියනවා. ඒකෙ සැඟවිච්ච අදහසක් නෑ. පොඩි ළමයෙකුට වුනත් තෝර ගන්න පුළුවන්. නමුත් නෙයියාර්ථවලදි එහෙම නෙවෙයි. උදාහරණ විදියට විද්දෙ හාවට වැදුනෙ පඳුරට කියල කිව්වම ඒ අවස්ථාවට අනුකූලව ඒ මොකක්ද කිව්වෙ කියල ඒ වචනවලින්ම තෝර ගන්න බෑ. ඒ අවස්ථාවෙදි ඒකෙන් අදහස් කරපු සැඟවිච්ච අදහසක් තියෙනවා. පිටින් කිව්වෙ වෙන එකක්. ඒක අර්ථ නිරූපනය කරගත්තම තමයි අදහස වැටහෙන්නෙ. ඒක බුදුන් වහන්සෙත් භාවිතා කරපු ක්‍රමයක්. නමුත් මේ ව්‍යංගාර්ථ කියන ඒවා සාමාන්‍ය ලෝකයා තමයි බොහෝ කොටම පාවිච්චි කරන්නෙ. ඒ වගේම ධර්ම දේශනා කරන කොට වුනත් සමහර විට අවශ්‍ය උපමා පෙන්වන්න යොදාගන්න පුළුවන්.

උදාහරණ විදියට ධර්මයේ පෙන්වනවා, **සමහර භික්ෂූන් වහන්සේලා ළඟ තියෙන කුහන ලපන කියල දෙකක්. ඒ කියන්නෙ සමහර භික්ෂූන් වහන්සේලා කුහකකම්වලින් හම්බ කරනවා. සමහරෙක් ළයාන්විත බව පෙන්වල හම්බ කරනවා. ළමයි හුරතල් කරනවා. අනිත් අයගෙ නැති ගුණ කියනවා.** උදාහරණයක් විදියට ගත්තොත් යම්කිසි මුල් පරම්පරාවක හිටපු කෙනෙක් පරිත්‍යාග කරනව අහල තිබිල, ඒ පරම්පරාවෙම වර්තමාන කෙනෙක් පන්සලට ආවොත් ඒක බලාගෙන මෙහෙම කියන්න පුළුවන්. ''ඔය ගොල්ලන්ගෙ පරම්පරාවෙ ඔක්කොම දන් දෙනවනෙ. අත්තල මුත්තල තාත්තල ඔක්කොම එහෙම තමයි ඉතින්. මහ දානපතියො. ඉතින් පුතාල කියල වෙනසක් තියෙනවයි? තාත්ත ආවම නම් රුපියල් දාහක් හමාරක් දීල තමයි යන්නෙ. පුතා වුනත් ඉතින් ඒ විදියනෙ. තාත්තගෙ ගතියනෙ.'' දැන් මෙහෙම ළයාන්විතව කිය කියා වර්ණනා කරනවා. දැන් ඉතින් අර මනුස්සයට නිකන් යන්න බෑ. ඉතින් කීයක් හරි දෙනවා. අන්තිමට කොහොම හරි වර්ණනා කරල කීයක් හරි කඩා ගන්නවා. ඒ වගේම සමහරු කුහක වැඩ කරනවා. ඒ කියන්නෙ තමන් ළඟ නැති ගුණ පෙන්වනවා. එහෙම නැත්නම් අනිත් අය පල් කරනවා, අනිත් අයට අපහාස කරනවා. එතකොට ඒ අපහාසයෙන් බේරෙන්න ඕන නිසා මොනව හරි දීල යනවා. එහෙම නැතිව ශ්‍රද්ධාව නිසා දෙනව නෙවෙයි. මෙහෙම ගති ලක්ෂණ සමහරුන්ට තියෙනවා. ඒ කියන්නෙ යමක් කෙලින්ම නොකිය ව්‍යංගයෙන් කියනවා. ඒවට තමයි ව්‍යංගාර්ථ කියන්නෙ.

දැන් මේකට හොඳ පැරණි කතාවකුත් තියෙනවා. එක්තරා හාමුදුරු නමක් දානෙකට ගෙදරකට වැඩියා. ඉතින් එදා ගෙවල්වලට වැඩියම, අද වගේ මහා පරිමාණයෙන් ලොකුවට දානය දුන්නෙ නෑ. ගෙදරකින් ලැබෙන සාමාන්‍ය දානයත් ඒ කාලෙ ලොකු දෙයක්. දැන් ඉතින් ගෙදරට වැඩියම ගෙදර කවුරුවත් හිටියෙ නෑ. මේ හාමුදුරුවො වඩින බව දැනගෙන ගෙදර උන්දෑ මග හැරල ගිහින්. ඒත් ගෙදර දොර ඇරල දාල. දැන් මේ හාමුදුරුවො, මොනවද අද උයන්න තියෙන්නෙ කියල බලන්න විගහට කුස්සියට ගියා. බලන කොට හොඳ කළු උක් දණ්ඩක් බිත්තියට හේත්තු කරල තියෙනවා. ඊළඟට හාල් එක ඇරල බලන කොට හාල් මුට්ටියකුත් තියෙනවා. තවත් මුට්ටියක මාළු පෙත්තක් තියෙනවා. තව එකක ගිතෙල් තියෙනවා. දැන් මේ හාමුදුරුවො අර ටික ඔක්කොම බලාගෙන, තිබ්බ විදියටම වහල තියල එළියට ඇවිත් මුකුත් නොදන්න ගානට සද්ද නැතිව බොහොම සිල්වත් විදියට හිටියා.

ඔහොම ටික වෙලාවක් ඉන්න කොට අර ගෙදර උන්දෑ ඇවිත් කියනවා, හාමුදුරුවනේ අද නම් වෙන කොහාට හරි වඩින්න වෙයි මෙහෙ උයන්න දේකුත් නෑ කියල. දානෙ දීමෙන් බේරෙන්න තමයි එහෙම කිව්වෙ. දැන් හාමුදුරුවො කියනව, මම හීනයක් දැක්ක ඒක හරියටම හරි කියල. ඒ මොකක්ද හාමුදුරුවනේ කියල අර ගෙදර උන්දෑ අහපුවම, හාමුදුරුවො මෙහෙම විස්තරයක් කළා. ''මම එනකොට නයෙක් දැක්කනෙ ! ඒක කළු උක් දණ්ඩක් වගේ. අර බිත්තියට හේත්තු කරල තියෙන උක් ගහ තියෙන්නෙ ආං .. ඒ වගේ. ඌ පෙනේ කළානෙ ! හරියට අර ලොකු මාළු පෙත්තක් තිබුණෙ, ආං .. ඒ වගේ. ඊළඟට උගේ කටින් සෙම වැක්කෙරෙන්න ගත්තනෙ, හරියට අර එළඟි තෙල් තියෙන මුට්ටිය වගේ. උගේ දත් ටික සුදු පාටයි, හරියට අර හැළියෙ තියෙන හාල් වගේ.'' දැන් හාමුදුරුවො මෙහෙම කියාගෙන ගියාම, මේ ගෙදර උන්දෑ දැනගත්ත මුත් වහන්සේගෙන් නම් බේරෙන්න බෑ කියල. ඒ නිසා මොකද කළේ, හාමුදුරුවනේ මම විගහට උයල දෙන්නම් කියල ගිහින් දානෙ ටික හදල දුන්නා.

දැන් මේ ව්‍යංගාර්ථයෙන් තමයි ඔක්කොම කිව්වෙ. මේව කුහක වැඩ. මේ විදියට අනුන් රවට්ටල, පල් කරල තමන්ගෙ වැඩේ කරගන්නවා. මෙහෙම ගන්න දානෙන් ඇති එලේ මොකක්ද? ඉතින් මේව ගැන විග්‍රහ කරල ධර්ම දේශනා කරන කොට මේ ව්‍යංගාර්ථත් සමහර වෙලාවට ඕන වෙනවා. මොකද මේ වගේ වැරදි වැඩ සමාජයේ තියෙනව කියල පෙන්වන්න. ඉතින් දානෙට මේ වගේ නීචකම් කරල මිනිස්සු රවට්ටල අරගෙන මොනව කරගන්නද? ගුණයක් තිබුණ නම් උන් වහන්සේට වෙන තැනකට වඩින්න තිබුණා. නමුත් ඉතින් ගති ලක්ෂණවල හැටියට එහෙම හිතෙන්නෙත් නෑ. දැන් ඉතින් මේ වගේ කතාවක් අර හාමුදුරුවො කිව්වම ඒ ගෙදර උන්දෑත් බය වෙන්න පුළුවන්, දිව්‍යස් තියෙනවද, කොහොමද මේ ගේ ඇතුලෙ තියෙන ඒව දන්නෙ කියල. මෙතනදි ඒ හාමුදුරුවො තමන් ළඟ නැති ගුණයක් ව්‍යංගයෙන් මවල පෙන්නුවා. ඒ කියන්නෙ, උඹ නෑ කිව්වට මං ඕව ඔක්කොම තියෙනව කියල දන්නව කියල, කෙලින්ම කියන්නෙ නැතිව වෙන ක්‍රමයකට ව්‍යංගාර්ථයෙන් කිව්වා. ඉතින් මේ වගේ වෙලාවට හාමුදුරුවො ළඟ විශේෂ හැකියාවක් තියෙනව කියල හිතාගෙන බොහොම ගරුත්වයෙන් දානෙ දීල කමා කරගන්නත් පුළුවන්. නමුත් මේ වගේ දේවල් භික්ෂූන් වහන්සේලාට කොහෙත්ම ගැලපෙන්නෙ නෑ. මෙහෙම දෙයක් කරල කෙනෙක්ගෙන් දානෙ වේලක් ගන්නව කියන්නෙ මොන තරම් නීච වැඩක්ද? නමුත් අපි ඒක නීචයි කියල කිව්වට හරි යන්නෙ නෑ. ඒ ගුණය නැති කෙනාට ඒක නීචයි කියල පේන්නෙත් නෑ. ඒ වගේ අයට ඒක පේන්නෙ හොඳයි කියල. ''එහෙම තමයි කන්න ඕන. එහෙම කෑවම ඇති වැරැද්ද මොකක්ද? මොනව හරි කරල ඔය තියෙන ඒව ගන්න එපැයි.'' මෙහෙම අදහස් තමයි ගුණ නොවඩපු අයට එන්නෙ. එහෙම නැතිව ඒක නින්දිත වැඩක්, නීච වැඩක්, මා වැන්නෙකුට ගැලපෙන්නෙ නෑ කියල හිතෙන්නෙ නෑ. එහෙම හිතන්න පුළුවන් නම් හොඳයි. නමුත් ගුණ නැති කෙනාට එහෙම හිතන්න හැකියාවකුත් නෑ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

**අභයරතනාලංකාරය - 25**

# ලෝක විනාසයට බියෙන් පළා ගිය දෙව් බඹුන් සහ බුද්ධ රැකවරණය



(පසුගිය කලාපයෙන් - විශ්වය තුළ බුද්ධ ශක්තිය තවමත් නොඅඩුව පවතින බවට සාක්ෂි....)

**- වහරක අභයරතනාලංකාර හිමි**

ලෝකයට මහා විනාසයක් වෙන්න යන කොට බුද්ධෝත්පාද කාලයකදී නම්, බුද්ධ ශක්තිය ක්‍රියාත්මක වෙලා ඒ විනාසය වළක්වන්න ක්‍රමයක් යෙදෙන බව පසුගිය කලාපයෙන් පැහැදිලි කළා. දැන් ඒ වගේම තවත් සිද්ධියක් 2000 වසරේදීත් සිද්ධ වුණා. හැබැයි ඒකත් දිවැසක්, සමාධියක් තිබිච්ච කෙනෙකුට ගෝචර වුණා නම් මිසක් සාමාන්‍ය මිනිස්සුන්ට ගෝචර වෙච්ච දෙයක් නෙවෙයි. මේ විස්තර කරන්නෙ එදා මට අත් දකින්න ලැබිච්ච තවත් ඒ වගේ සිද්ධියක්. ඒ කාලෙ මම පොල්ගහවෙල ගිජිඳාගම කියන ගම් ප්‍රදේශයේ විශේෂ බෝධි පූජා කටයුතු ආදිය මගින් සෙත් ශාන්ති පවත්වමින් හිටපු කාලයක්. 1999 දෙසැම්බර් 31 වන දා රෑ 12 ට මේ වගේ ලෝක විනාසයක් ගැන කතා පැතිරිලා ගිහින් තිබුණා. මොකද එක දහස් නවසිය ගණන් ගෙවිල ගිහින් එක පාරටම 2000 වසර ලැබීම, විවිධාකාරයෙන් නවීන පරිගණක තාක්ෂණය ඇතුලු විද්‍යාවට බලපෑමක් ඇති කරල, විශාල අක්‍රිය වීමක් සිද්ධ වෙන බවට මිනිස්සු අතර මතයක් තිබුණා. ඒකට විවිධාකාර විද්‍යාත්මක හේතු වගේම ගණිතමය හේතුත් ඉදිරිපත් වුණා.

උදාහරණ විදියට ඒ කාලෙදි පරිගණක නවතිනව කියල එක්තරා හේතුවක් ඉදිරිපත් කරල තිබුණා. මොකද මුළු පරිගණක පද්ධතියම, දිනය මත රඳා පවතිනවයි කියල තමයි ඒ කාලෙ කිව්වෙ. එතකොට 1999.12.31 කියන දිනය පරිගණකයේ සටහන් වුනේ 31.12.99 විදියට. ඉතින් 1999.12.31 න් පස්සෙ 2000 වසර ආවම 01.01.00 ආදී ලෙස යොදන කොට, පරිගණකවලට ඒ බිංදු හඳුන ගන්න බැරි වෙලා, 0 වලට වටිනාකමක් දෙන්න බැරිව මුළු පද්ධතියම නවතිනව කියල මතයක් තිබුණා. ඒ කාරණය තුළ ඉඳගෙන තමයි ලෝකයේ සියලුම පරිගණක පද්ධති අක්‍රිය වෙලා අහස් යානා කඩා වැටෙනව, නැව් ගිලෙනව, න්‍යෂ්ටික බලාගාර පුපුරනව... ආදී වශයෙන් මහ විනාසයක් වෙනවයි කියල නිගමනය කළේ. ඉතින් මේ වගේ දෙයක් සිද්ධ වෙනවයි කියන ආරංචිය යන කොට, ඒක යන්නෙ තවත් ලොකු කරල මහා විනාසයක් වෙනවයි කියල.

කොහොම හරි මේ මනුස්ස ලෝකෙ මිනිස්සු අතර ලෝක විනාසය සම්බන්ධයෙන් වෙච්ච කතා බහ වෘක්ෂ දේවතාවන්ටත් ආරංචි වෙලා ඒ අයත් බය වෙලා හිටියෙ. එතනින් ගිහින් ඉහළ මට්ටම්වල දෙවියන් හරහා බ්‍රහ්ම ලෝකෙට යනකල්ම මේ ආරංචිය පැතිර ගිහින් තිබුණා. ඒකෙන් දෙවි දේවතාවො විතරක් නෙවෙයි බ්‍රහ්මයින් පවා කැළඹිලා හිටියෙ. මොකද මිනිස්සුන්ගෙ තියෙන ප්‍රශ්නත් එක්ක ඒ අයත් වික්ෂිප්ත වෙනවා. මනුස්ස ලෝකෙට විනාසයක් වෙනව කියල දැනගත්තොත්, ඒ වගේම මිනිස්සු ගහ මරා ගන්න අදහස් ගත්තොත් ඒක දෙව් බඹ ලෝකවලටත් ගිහින් ඒවත් කැළඹෙනවා. විශේෂයෙන් බ්‍රහ්මයො මනුස්ස ලෝකෙ ඉන්න මිනිස්සු තමන්ගෙ දරුවන් වගේ දකින්නෙ. ඒ වගේම මනුස්සයො විවිධ පිං දහම් කටයුතු කරන කොට ඒ දිහා බලල සතුටු වෙලා, පිං අනුමෝදන් වෙන ස්වභාවයක් ඒ අයටත් තියෙනවා. මේ ආදී හේතු නිසා මනුස්ස ලෝකෙට බැල්ම දාගෙනමයි ඉන්නෙ. ඉතින් මෙහේ මිනිස්සු ලෝකෙ විනාස වෙනවයි කියල කිව්වොත්, ඒ අය ඇත්තටම ඒක විනාස වෙනවද නැද්ද කියල දන්නෙ නෑ. නමුත් මිනිස්සු මෙහෙම කතා වෙන කොට ඒගොල්ලොත් ''අහවල් දවසෙ ලෝක විනාසයක් වෙනවලුනෙ !'' .... මේ ආදී වශයෙන් කතා වෙනවා. එතකොට ඉස්සෙල්ලම මිනිස්සු ඇසුරේ ඉන්න වෘක්ෂ දේවතාවො බය වෙනවා. බය වෙලා ගිහින් හතර වරම් දෙවියන්ට කියනවා. හතර වරම් දෙවියො සක්‍ර දෙවියන්ට කියනවා. මෙහෙම කලබලයක් තියෙනව කියල ඔය විදියට ගිහින් ඉහළ බ්‍රහ්ම තලවලට යනකල්ම ආරංචිය යනවා.

දැන් කෙනෙකුට තවත් ප්‍රශ්නයක් එන්න පුළුවන්, ඒ වගේ වෘක්ෂ දේවතාවන් හරහා ආරංචිය ගන්නෙ මොකටද, දිවැස් තියෙනව නම් ඉහළ තලවල ඉන්න බ්‍රහ්මයින්ට, දෙවියන්ට කෙළින්ම ඒ ආරංචිය දිවැසින් යොමු කරල බලන්න පුළුවන්නෙ කියල. මෙතනදී දේව කාරිය කියල දෙයක් තියෙනවා. හරියට මනුස්ස ලෝකෙ රාජ්‍ය සේවකයන්ගෙ රාජකාරි වැඩ වගේ. ඒ කියන්නෙ මනුස්ස ලෝකෙ රටක රාජ්‍ය නායකයෙක් ගත්තොත්, ඒ නායකයට රටේ සාමාන්‍ය ජනතාව කියන දේවල් කෙලින්ම යන්නෙ නෑ. ඒකට වෙනම නිලධාරි මණ්ඩල පත්කරල ඉන්නවා. ඒ අය හරහා තමයි රටේ නායකයට සාමාන්‍ය ජනතාව කියන දේවල් ආරංචි වෙන්නෙ. මේ වගේ තමයි ඉහළ තලවල ඉන්න දෙවියො බ්‍රහ්මයින්ට, මනුස්ස ලෝකෙ වෙන දේවල් කියන්න වෙනම දේව මණ්ඩල ඉන්නවා. හැබැයි ඉතින් රටේ නායකයාට අවශ්‍ය නම්, ඒ අතර කවුරු හරි විශේෂ පුද්ගලයෙක් ඉන්නව නම්, ඒ පුද්ගලයව කෙලින්ම සම්බන්ධ කරගන්න ක්‍රමත් නැතුව නෙවෙයි. ඒ වගේ දේව බ්‍රහ්ම ලෝකවල දෙවි බඹුන්ටත් කෙලින්ම තොරතුරු දැන ගන්න ක්‍රමත් තියෙනවා. නමුත් සාමාන්‍ය ක්‍රමය තමයි අර වගේ දේව මණ්ඩලයක් හරහා යන එක.

උදාහරණ විදියට ධම්මචක්කප්පවත්තන සූත්‍රය දේශනා කරන කොට චාතුර් මහා රාජික දේවතාවන්ගෙන් පටන් අරගෙන, අකනිට්ඨා බඹ ලොවට යනකල් අනුක්‍රමයෙන් ගියපු හැටි ඒ සූත්‍ර දේශනාවෙම අවසානයේ පැහැදිලිව විග්‍රහ වෙනවා. චාතුර් මහාරාජිකානං දේවානං සද්ධං සුත්වා තාවතිංසා දේවානං ... ☞

යාමානං දේවානං... තුසිතානං දේවානං... නිම්මානරතීනං දේවානං... පරනිම්මිත වසවත්තිනං දේවානං... බ්‍රහ්ම පාරිසජ්ජානං දේවානං... බ්‍රහ්ම පුරෝහිතානං දේවානං... මහා බ්‍රහ්මාණං දේවානං... ආදී වශයෙන් එකින් එකට විග්‍රහ වෙලා අනුපූර්ව ක්‍රමයකට තමයි බුද්ධ දේශනාව වුනත් ගිහින් තියෙන්නෙ.

ඒ වගේම සමහර අවස්ථාවල බුදුන් වහන්සේ යම්කිසි චිත්ත පරිවිතර්කයක් ඇති කරන කොට ඒක සහම්පති බ්‍රහ්මයා මොහොතින් දැකල, දික් කළ අතක් වක් කළ සැනින් බඹ ලොව ඉඳන් බුදුන් වහන්සේ වැඩ ඉන්න තැනට ඇවිත් ඒ කාරණය අනුමත කරල ගියපු අවස්ථාත් ත්‍රිපිටකයේ සඳහන් වෙනවා. එතකොට දේව මණ්ඩල හරහා නැතිව කෙලින්ම සම්බන්ධ වෙච්ච අවස්ථාවකට උදාහරණයක් තමයි ඒ.

සිතිවිලි හිතන කෙනා විශේෂයෙන් හිත දියුණු කරපු කෙනෙක් වෙන්න ඕන කියල එහෙම දේකුත් නෑ. සාමාන්‍ය කෙනෙක් යමක් හිතුවත් ඒ සිතිවිල්ල දෙවියන්ට, බ්‍රහ්මයින්ට ඇහෙනවා. හැබැයි එහෙම ඇහෙන්න නම්, දෙවියො බ්‍රහ්මයො ඒකට හිත යොමු කරගෙන ඉන්න ඕන. එහෙම නැත්නම් අපි ඒ දෙවියන්ගෙ බ්‍රහ්මයින්ගෙ නම සිහි කරල ඒ අයට යොමු කරන්න ඕන.

උදාහරණ විදියට යම් කිසි කෙනෙක් තමන්ට පිහිටක් ඉල්ලල ''අනේ දෙයි හාමුදුරුවනේ! අනේ සක්‍ර දෙවියන්ටවත් පේන්නෙ නැද්ද මට වෙච්ච කරදරය! දෙවියෙක්වත් නැද්ද මගේ දුක බලන්න...'' මේ ආදී වශයෙන් කියන කොට ඒක චිත්ත විප්පාර නාදයක් වශයෙන් එල්ල කරලම යනවා. ගිහින් දෙවියන්ට ඇහෙනවා. එතකොට මේ වගේ චිත්ත පරිවිතර්කයක් නැගෙන කොට, ඒ නැගිච්ච ''මෙච්චර දුෂ්කර ක්‍රියා කරලත්, මේ තරම් මහන්සි වෙලත් මට බුදු වෙන්න බැරි වුනානෙ!'' එතකොට ඒ චිත්ත පරිවිතර්කය අල්ල ගෙන මාරයා මෙහෙම කියනවා. ''ඔබ වහන්සේට දැන් 99% ක් මරණය නියතයි. ජීවත් වෙන්න අවස්ථාව තියෙන්නෙ තවත් 1% ක් විතරයි. ඔබ වහන්සේ ඕක අත් හරින්න. ඇත්ත වශයෙන්ම ඔබ වහන්සේ ගත්තු අදහස බොහොම හොඳයි. ඔබ වහන්සේ සක්විති රජ වෙන්න ලෝකෙට කොච්චර යහපතක්ද?'' මේ ආදී වශයෙන් ඉල්ලීම් කළේ, බෝසතාණන් වහන්සේ අර විදියට හිතන කොට, මේ අධෛර්ය වෙලා බුදු වෙන අදහස අත් හරින්න හදනව කියල හිතාගෙන. එහෙම හිතාගෙන උන් වහන්සේගෙ ඒ අදහසට අනුබල දෙන්න තමයි අර විදියට ඇවිත් කතා කළේ. එතකොට උන් වහන්සේගෙ චිත්ත පරිවිතර්කය අල්ල ගෙන තමයි එහෙම කතා කළේ.



මෙතනදි චිත්ත පරිවිතර්කයක් කියන්නෙ කෙනෙක් සිතන සිතිවිල්ල. ඒ කියන්නෙ විතක්ක විචාර කියල, කෙනෙක් කතාවක් කරන්න ඉස්සෙල්ල ඒ සම්බන්ධයෙන් සිතිවිලි ගෙතෙනවා. එතකොට ඒ ගෙතිච්ච දේ වචනවලින් ප්‍රකාශ කරන්නත් පුළුවන්, නැත්නම් හිතෙන් හිතල නිකන් ඉන්නත් පුළුවන්. හරියට අපි නිකන් ඉන්න වෙලාවට විවිධ සිතිවිලි හිත හිතා ඉන්නව වගේ. එතකොට ඒ ඔක්කොම චිත්ත පරිවිතර්ක. දැන් මේ චිත්ත පරිවිතර්කයක් ඇති වෙන කොට චිත්ත විප්පාර (පැතිරෙන) නාදය කියල එක්තරා ශබ්ද තරංගයක් හැදෙනවා. ඒක අපි යමක් හිතන කොටම සිද්ධ වෙන දෙයක්. හැබැයි ඒක කනට ඇහෙන ශබ්ද තරංගයක් නෙවෙයි, හිතට දැනෙන දෙයක්. ඒ වගේම ඒ තරංගය බොහෝ ඈතට විහිදෙනවා. එතකොට යම් කිසි ශබ්දයක් අපේ කනට ඇහෙනව වගේ, චේතෝපරිය ඥානය හෙවත් පරිච්ත්ත විජානන ඥානය තියෙන කෙනෙකුට, එහෙම නැත්නම් දිව්‍යස් දිවකන් තියෙන කෙනෙකුට ඒ සිතිවිලි අහුවෙනවා. ඒක හිතට දැනෙන කම්පනයක්. ඒකෙන් ඒ හිතපු සිතිවිල්ල මොකක්ද කියල අල්ල ගන්න පුළුවන්. එතකොට අපි මොනව හරි හිතුවොත් දෙවියන්ට, බ්‍රහ්මයින්ට අවශ්‍ය නම් ඒක අල්ල ගන්න පුළුවන්. ඒකට වෙනත් අතරමැදි කෙනෙක් අවශ්‍ය නෑ. කෙනාට අවශ්‍ය නම් ඒක කටින් ප්‍රකාශ කරන්නත් පුළුවන්. එහෙම නැත්නම් කතා නොකර නිකං සිතිවිලි නගන්නත් පුළුවන්. කටින් වචන ප්‍රකාශ කළොත් චිත්ත පරිවිතර්කයයි, ශබ්දයයි දෙකම නැගෙනවා. කතා නොකර හිටියොත් චිත්ත පරිවිතර්කය විතරක් නැගෙනවා. ඒ කොයි විදියට නැගුනත් ඒක ඇහෙනවා. ශබ්දය කටින් පිට නොකළට දෙවියන්ට, බ්‍රහ්මයින්ට සිතිවිලි අල්ල ගන්න පුළුවන්.

දැන් මේ විදියට මාරයාටත් පුළුවන් වුනා බුදුන් වහන්සේගෙ සිතිවිලි අල්ල ගන්න. උදාහරණ විදියට බුදුන් වහන්සේ බෝසත් අවස්ථාවෙ දුෂ්කර ක්‍රියා කරන කොට, උන් වහන්සේ මෙහෙම හිතනව.

දැන් එතකොට මේ කලින් සඳහන් කරපු සහම්පති බ්‍රහ්මයගෙ කතාවෙදි ''ස්වාමීනි, ඒක එසේමයි. මමත් ඕක ඔය විදියටම කාශ්‍යප බුදුන් වහන්සේගෙන් අහල තියෙනවා....'' ආදී වශයෙන් බුදුන් වහන්සේ කරපු චිත්ත පරිවිතර්කය සහම්පති බ්‍රහ්මය අනුමත කළයි කියන්නෙ, තමනුත් ඒකට කැමතියි කියන අදහස. ඒ නිසා අනුමත කළා කියල කිව්වෙ තමනුත් ඒ කාරණය දැන ගෙන හිටි බවට, ඒකට කැමති බවට, ඒක සත්‍යයි කියල තමන්ගෙ චිත්ත ප්‍රසාදය ප්‍රකාශ කිරීමක්. ඒ චිත්ත ප්‍රසාදය පළ කරන්න තමයි සහම්පති බ්‍රහ්මය බුදුන් වහන්සේ ළඟට ආවෙ. එහෙම නැතිව ඒක අනුමත කරල බුදුන් වහන්සේට උපදෙසක් දීල යන්න ආව නෙවෙයි. මොකද මේ කාරණය මෙහෙම පැහැදිලි කළේ නැත්නම්, සමහරු ඒක වැරදියට තේරුම් ගන්න පුළුවන්.

දැන් එතකොට මේ විදියට දෙවියො, බ්‍රහ්මයො මේ මනුස්ස ලෝකෙ කතා බහ වෙන දේවල් මේ ආකාර දෙකටම ලබා ගන්න බවට සාක්ෂි ත්‍රිපිටකයේ තියෙනවා.

දැන් ඉතින් කොහොම හරි මේ ලෝක විනාසය ගැන ආරංචිය ගියාට, මේකෙ ඇත්ත නැත්ත අහගන්න ☞

කෙනෙකුත් ඒ අයට නෑ. ඒ නිසා තමයි ඒ වගේ කාලවලට හිටි ගමන් මනුස්සයින්ට පේන්න දේවතා එළි වගේ දේවල් කැරකිලා යන්නෙ. ඒ කියන්නෙ මනුස්ස ලෝකෙ කතා බහ වෙන දේවල්, සිද්ධ වෙන දේවල් බලාගෙන යන්න ඒ අය එනවා.

මෙතනදි කෙනෙකුට තවත් ප්‍රශ්නයක් එන්න පුළුවන් දිවැසක්, දිව්‍ය ඥානයක් තියේ නම්, මේ වගේ සිද්ධියක ඇත්ත නැත්ත දෙවි බඹුන්ටම බලාගන්න බැරි ඇයි කියල. බුද්ධ දේශනාවෙ පෙන්වල තියෙන දෙයක් තමයි, **දඹදිව වාසී මනුස්සයින් තවුතිසා දෙවුලොව දෙවියන්ට වඩා ඥානයෙන් අග්‍රයි, තවුතිසා වාසී දෙවියන් දඹදිව වාසී මනුස්සයින්ට වඩා රූපයෙන් අග්‍රයි** කියන කාරණය. මෙතනදි දඹදිව වාසී මනුස්සයින් කිව්වෙ ජම්බුද්වීපය කියන මේ පෘථිවියේ ඉන්න සියලුම මනුස්සයින් මිසක් එක් රටක මනුස්සයින් නෙවෙයි. ඒ කියන්නෙ උතුරුකුරු දිවයින, අපරගෝයානය, පූර්වවිදේහය, ජම්බුද්වීපය කියන මනුස්ස ලෝක හතරෙන්, අපි මේ වාසය කරන ජම්බුද්වීපය කියන මනුස්ස ලෝකය ගැන තමයි මේ කිව්වෙ. දැන් මේ අනුව පේනවා, ඥානයෙන් අග්‍ර වෙලා තියෙන්නෙ මනුස්සයො මිසක් දෙවි දේවතාවො නෙවෙයි කියල. ඒ වගේම තමයි ඥානයයි, දිවැසයි කියන්නෙ කාරණා දෙකක්. දිවැසට වඩා ඥානය ප්‍රබලයි. එතකොට ඥානයෙන් අග්‍ර මනුස්සයො කියන දේ තමයි රූපයෙන් අග්‍ර දෙවි දේවතාවොත් අහන්නෙ. දෙවි දේවතාවන්ට මේ වගේ ප්‍රශ්නයක් ආවම ඒක තනිවම විසඳගන්න බෑ. මනුස්සයින්ගෙ ඥානයෙන් කියන යමක් තියේ නම්, මනුස්සයින් ඥානයෙන් අග්‍ර බව දෙවි දේවතාවොත් දන්න නිසාම, මනුස්සයො කියන දේට ඒ අය යටත් වෙනවා, ඒක පිළිගන්නවා. සමහර වෙලාවට මනුස්සයො කියන්නෙ ඇත්තද බොරුද කියල දන්නෙ නැතිව දෙවි දේවතාවො රැවටෙන අවස්ථාත් තියෙනවා.

උදාහරණ විදියට අජිත කේසකම්බලී, මක්ඛලීගෝසාල ආදී වශයෙන් ඒ කාලෙ හිටපු ෂඩ් ශාස්තෘවරු ගැන බැලුවොත්, ඒ අය කියපු සමහර දේවල්වලට රැවටිච්ච සමහර දෙවි දේවතාවො බුදුන් වහන්සේටත් අභියෝග කරල තියෙනවා, ඔබ වහන්සේ විතරක් නෙවෙයි තවත් බුදුවරු ඉන්නව කියල. සංයුක්ත නිකායේ පළවෙනි කාණ්ඩයේ 126 පිටුවේ එන නානා තිත්ථිය සාවක සූත්‍රයේ (නොයෙක් නොයෙක් තීර්ථකයන්ගෙ ශ්‍රාවකයන් ගැන කියවෙන කතා) මේ බව පැහැදිලිව සඳහන් වෙනවා. එතනදි දෙවි දේවතාවො ඇවිත් බුදුන් වහන්සේට අන්‍ය තීර්ථකයන්ගෙ කතා කිව්වම, උන් වහන්සේ ඒව පිළිගන්නෙ නැතුව නිහඬව හිටපු නිසා නොයෙක් කොලොප්පම් කරල ගියපු හැටිත් විස්තර වෙනවා. උන් වහන්සේ ඒව පිළිගන්නෙ නැතිව නිහඬව ඉන්නෙ, අනෙක් අයට ඊර්ෂ්‍යාවෙන්ය කියන කතා පවා කියල ගිහින් තියෙනවා. කොහොම හරි, එහෙම දෙවි දේවතාවුන් අතරින් කරුණු කාරණා තේරුම් ගත් එක් කෙනෙක් විතරක් කමා කරගෙන ගියා. අනිත් අය නිකම්ම දොස් කියල යන්න ගියා.

එතකොට ඒ වගේ අය ඒ කාලෙත් දෙවි දේවතාවන් අතර ඉඳල තියෙනවා. මෙතනින් පේනව, බුදුන් වහන්සේ පිළිගන්නෙ නැතිව වෙනත් අය පිළිගන්න නම් මොන තරම් අඥානකමක් තියෙන්න ඕනද කියල. නමුත් මේ දේවත්වයට පත්වෙන්නෙ පෙර කරපු පිනෙන් වුණත්, අර වගේ දෙයක් තේරුම් ගන්න මානසිකත්වයක්, නුවණක් නැති නිසා තමයි බුදුන් වහන්සේ ප්‍රතික්ෂේප කරල වෙනත් අය ළඟට ගියේ. ඒ කාලෙ විතරක් නෙවෙයි කොයි කාලෙත් ඒ වගේ අය ඉන්නවා. ඒක ලෝක ස්වභාවය. මිනිස්සු විතරක් නෙවෙයි දෙවි දේවතාවොත් විවිධයි. මේ නිසා බැරි වෙලා හරි මනුස්සයෙක් වැරදි විදියට දෘෂ්ටි ගත වුනොත්, ඒක පැතිරිලා විසාල පිරිසකට විනාසයක් වෙන්න පුළුවන්. දෙවි දේවතාවො තමයි ඒකෙන් හුඟක් අමාරුවෙ වැටෙන්නෙ. මොකද මිනිස්සු කියන දේවල් මිනිස්සුන්ට වඩා දෙවි දේවතාවන් පිළිගන්නව වැඩියි. ඒ වගේම මිනිස්සු ඥානයෙන් අග්‍රයි කියල ඒ අය දන්නවා. එතකොට මිනිස්සු වැරදි දෙයක් කියන කොට ඒ පැත්ත ගන්න දෙවි දේවතාවො අමාරුවෙ වැටෙනවා. මොකද එහෙම පැත්තක් ගන්නෙ ඥානවන්තව හිතල බලල නෙවෙයි, තම තමන්ගෙ රුචිකත්වය අනුව. එහෙම වුනාම ඒ අයට ලොකු විනාසයක් වෙනවා.

දැන් මේකට තවත් උදාහරණයක් තියෙනවා. ඒ කාලෙ එක්තරා ගමක හිටපු මිනිස්සු පිරිසක් මත්පැන් පානය කරමින් ඉන්න කොට, තවත් මනුස්සයෙක් එතනට ඇවිත් තමන්ගෙ මගුලක් තියෙන බව අනෙක් පිරිසට කිව්වා. දැන් මොකක්ද මේ මගුල කියන්නෙ කියල ඒ පිරිස අතර කතා වුණා. ඇහෙන ඒවනෙ මගුල් කියන්නෙ කියල එක් කෙනෙක් කියනවා. ඇහෙන ඒව නෙවෙයි බිං දකින ඒව කියල තවත් කෙනෙක් කියනවා. මේ විදියට විවිධාකාර අර්ථ නිරූපනයන් දෙන්න පටන් ගත්තා. මේ වෙලාවෙදි මේ බේබදු පිරිස දිහා බලාගෙන එක්තරා භූතයො කොටසක් හිටියා. ඒ භූතයන්ටත් මේ ප්‍රශ්නයම ආවා. උනුත් අහනව ඇත්තටම මොනවද මේ මගුල් කියන්නෙ කියල. උන් දන්නෙත් නැතුව අර වගේ විවිධ දේවල් කියනවා. අන්තිමට අපිත් දන්නෙ නෑ කියල, වෘක්ෂ දේවතාවන්ගෙන් ගිහින් ඇහුවා. ඒ අයත් දන්නෙ නැතිව, ගිහින් හතර වරම් දෙවියන්ගෙන් ඇහුවා. හතර වරම් දෙවියොත් දන්නෙ නැති නිසා, ගිහින් සක්‍ර දෙවියන්ගෙන් ඇහුවා. සක්‍ර දෙවියොත් දන්නෙ නැති නිසා, බුදුන් වහන්සේගෙන් මේක අහ ගමුයි කියල දේවතාවෙක් යැව්වා. මේ විදියට අර බේබදු මිනිස්සු අතර ඇති වෙච්ච ප්‍රශ්නයක් තමයි සක්‍ර දෙවියන් ළඟටම ගිහින්, අන්තිමට බුදුන් වහන්සේ ළඟට ඇවිත් මංගල කරුණු ඇතුලත් මහා මංගල සූත්‍රය දේශනා කරන්න මුල් වෙලා තියෙන්නෙ. දැන් මෙතනින් පැහැදිලි වෙන තවත් කාරණයක් තමයි, නිකං සාමාන්‍ය මිනිස්සු අතර ඇති වෙන කතා බහ පවා දෙවි දේවතාවන්ට යන බව. එහෙම අපට නොපෙනෙන විවිධ ක්‍රම තියෙනවා.

කොහොම හරි 1999.12.31 රෑ 12 ට මේ වගේ ලෝක විනාසයක් සිද්ධ වෙනවයි කියල එදා කතාවක් පැතිරිලා ගිහින් තිබුණා. එදා මම ගිජ්ඣගම මහ බෝධි පූජාවක් කරමින් හිටපු දවසක්. ඒක හැන්දෑවෙ පටන් අරගෙන පැය 5 - 6 ක් තිස්සෙ පාන්දර වෙනකල් කෙරෙන විශේෂ බෝධි පූජාවක්. දැන් මේ බෝධි පූජාව කරගෙන යන කොට රෑ 12 ට විනාඩි 5 ක් විතර තියා අහස් තලය අරක් ගෙන හිටපු විසාල පිරිසක් එක පාරටම ආගිය අතක් නැතිව ගියා. මුළු අහසම හිස් වෙලා බ්‍රහ්මයෙක්වත් නෑ. වෙන දවස්වලට නම් මේ වගේ බෝධි පූජාවක් කරන කොට ආකාසෙ මැද හැම තැනම දේවතාවො, බ්‍රහ්මයො ඇවිත් පිරිල ඉන්නවා. නමුත් එදා අර වෙලාවට බෝධි පූජාව කරන කොට, මට නිකං හුළං ගියා වගේ දෙයක් දැනුණා. අන්තිමට යොමු කරල බලන කොට අහස් සීමාවෙ කිසි කෙනෙක් නෑ. හිස් වෙලා ගිහින්. ඒක එක පාරටම සිද්ධ වෙච්ච දෙයක්. මේ හිටිය, මේ අතුරුදන් වුණා. මෙහෙම විනාඩි 10 ක් විතර ගියාට පස්සෙ රෑ 12.05 ට නැවතත් අර දේව බ්‍රහ්ම පිරිස් ආවා. ඒ කියන්නෙ කලින් වගේම අහස් තලය පුරාවටම දිස් වුණා.

දැන් එතකොට මොකක්ද මේ වුණේ ? හරියටම රෑ 12 ට ලෝක විනාසයක් එනව කියල කතාව

තිබුණෙ. ඉතින් ඒ අයත් බය වෙලා පැත්ත පළාතකවත් හිටියෙ නෑ. වෙලාසනින්ම පැනල ගියා. ඒ කියන්නෙ මනුස්ස ලෝකෙ අතහැරල ගිහින්. එහෙම ගිහින් විනාඩි 10 ක් යනකල් බලාගෙන ඉඳල ඒ කාලය පන්නල, අනතුරක් නෑ කියල දැනගත්තම තමයි නැවතත් 12.05 ට විතර ආවෙ. දැන් මේකෙන් පේනව, මේ මනුස්සයො වගේම තමයි අනතුරක් දැනුන ගමන් දෙවියො බ්‍රහ්මයොත් ඒක මග හරිනවා. ඒ අයත් සෑහෙන බයෙන් ඉන්නෙ. මොකද එහෙම විනාසයක් ආව නම් ඒ අයගෙ විමානත් විනාස වෙලා ගිහින් ඒ අයටත් මහ කරදරයකට මුහුණ පාන්න සිද්ධ වෙනව කියල ඒ අයට හිතෙනවා. මේ නිසා දෙවියො බ්‍රහ්මයොත් තමන්ට මොකක් වෙයිද කියල පිළිසරණක් බලාපොරොත්තුවෙන් තමයි හැම තිස්සෙම ඉන්නෙ.

ඊළඟට මෙතනදි මට අත්දකින්න ලැබිච්ච තවත් වැදගත් කාරණයක් තියෙනවා. ඒ තමයි මේ දෙවියො බ්‍රහ්මයො මේ වගේ විශේෂ පූජාවකට සම්බන්ධ වෙන ආකාරය. ආකාසෙ ගත්තම සුදු වළාකුළු වගේ මහ ලොකුවට පැත්තක්ම වැහෙන්න බ්‍රහ්මයො ඉන්නවා. නිල් අහස තිබුණත් ඉහළට යන කල්ම සුදු වළාකුලක් හිටිය වගේ පේනවා. ඒ සීමාවෙ ඉන්නෙ බ්‍රහ්මයො. හැබැයි ඒ රූප හැඩරුවින් නෙවෙයි. ආවර්ජනය කරන කොට එහෙම ඉන්න බව පේනවා. සංකේතය තමයි අර සුදු වළාකුළු. ඒ කියන්නෙ ස්වභාවය විදියට යොමු වෙන්නෙ හැම තැනම සුදු වළාකුළක් පිහිටල වගෙයි. ඒ වගේම පහළින් තියෙන ගස් කොළංවල හැම කොළයක් ගානෙම ආසන මැවිල, ඒ ආසනවල දෙව් දේවතාවො ඉන්නවා. භූමාටු, රුක්ෂ දේවතා මට්ටමේ පටන් ඉහළට යනකල්ම ඉන්නවා. බෝධි පූජාව පැවැත්වෙන වෙලාවෙදි ඒ ආසනවලට ඇවිත් දෙව් දේවතාවො අසුන් ගන්නවා. හැම ගහකම කොළයක් කොළයක් ගානෙ කිරණ තියෙනවා. ඒ කිරණවලින් තමයි ඒ අයගෙ පුණ්‍ය ඍද්ධියට අසුන් මැවෙන්නෙ.

ඊළඟට සක්‍ර දෙවියො එන වෙලාවක් තියෙනවා. සක්‍ර දෙවියන්ට කලින් ඉස්සෙල්ලම එන්නෙ සතර වරම් දෙවියො. මිනිස්සුන්ට පේන්නෙ නැති වුනාට ඒ අය ඇවිත් සෙනග අතරෙම ඉන්නවා. ඒ අයගෙ මුහුණුවල ස්වරූපය කිව්වොත් කවාකාරයි. එක්කෙනෙක්ගෙ මූණ නිලට හුරුයි. අනෙක් තුන් දෙනාටම තියෙන්නෙ හඳේ පාට. ඒ තමයි ඒ අයගෙ හැටි. මේ හතර වරම් දෙවියො එන්නෙත් නිකං නෙවෙයි. හරියට රාජ්‍ය නායකයෙක් එන්න ඉස්සෙල්ල, ප්‍රභූ ආරක්ෂක අංශයේ පිරිස් ඇවිත් වට පිටාව පරීක්ෂා කරල යනව වගේ, අසුරයන්ගෙන් මොනව හරි ප්‍රශ්නයක් කරදරයක් තියේද කියල බලන්න තමයි ඉස්සෙල්ලම එන්නෙ. ඒ කියන්නෙ සක්‍ර දෙවියන්ගෙ ආරක්ෂාවට. මේ සතර වරම් දෙවියො ඇවිත් සෙනග අතර ඉඳගෙනම වටේ කැරකිලා රවුමක් යනවා. අපිට එහෙම ඒ අය මොනවත් හොයන බව අහුවෙන්නෙ නෑ. නමුත් සමාධියට දැනෙනව, මේ අසුරයන්ගෙ මොනව හරි උපක්‍රම තියෙනවද කියල තමයි හොයන්නෙ බලන්නෙ කියල. එහෙම හොයල බලල ඉවර වෙලා, නියම අවස්ථාවෙදි තමයි සක්‍ර දෙවියො එතනට සැපත් වෙන්නෙ. හැබැයි මේ ටිකට මහ ලොකු වෙලාවක් යන්නෙ නෑ. ඉතා කෙටි කාලයක් තුලදි මේ සියල්ලම සිද්ධ වෙනවා. සක්‍ර දෙවියො එන්නෙ කිරිගරුඬ වගේ ආසනයක. හරියට අපේ තියෙන කවිච්චියක් වගේ තමයි ඒ ආසනය පා වෙලා එන්නෙ. ඒකෙ දෙවඟනක් වගේ තව කවුරුහරි ඉන්නවා. ඒ ආසනය ආකාසෙම හිටල, සක්‍ර දෙවියො එතන ඉඳන් බැහැල පාවෙලා පහලට එනවා. ඒ කියන්නෙ සෙනග ඉන්න සීමාවටම එනවා. එහෙම ඇවිත් බෝධි පූජාවට ගරු කරනවා. ඒ ගරුත්වය නිසාම තමයි අර විදියට ආසනයෙන් බැහැල පහළට එන්නෙ. සමහර වෙලාවට එහෙම ඇවිත් අවට තියෙන බුද්ධ ආසනවල තැන්පත් කරල තියෙන මල්, පහන් ආදියට නමස්කාර කරල හිටි ගමන් අතුරුදන් වෙනවා.

ඒ වගේම පුනරුත්ථාපනය කරන්න ඉන්න ප්‍රබල සැඩපරුෂ අලි ඇතුන් වගේ ලොකු යක්ෂයො, අමනුස්සයො, අලි බඳින දම්වැල් වගේ මහා දම්වැල්වලින් බැඳගෙන පෝලිමේ අරගෙන ඇවිත්, අර චාතුර් මහා රාජික පාලක දේවතාවන්ගෙ භාරයේ තියාගෙන රැකවල්ලාගෙන ඈත ඉඳන් ඉන්නවා. ඒ අයට යන්න එන්න, දුවන්න පනින්න බැරිවෙන විදියට තමයි ඒ රැකවල් දාගෙන ඉන්නෙ. මොකද මේ වගේ වටිනා පූජාවකට බාධා කරන්න පුළුවන් නිසා. ඒ වගේම ඒ බෝධි පූජාව බලාගෙන ඒ අයටත් අනුමෝදන් වෙන්න එක්ක තමයි, අර විදියට පූජාවට හුඟක් ඈතින් ක්ෂිතිජයේ පහළ මට්ටමේ තියාගෙන ඉන්නෙ. හරියට, පූජාවක් පැවැත්වෙන අවස්ථාවකදි පුංචි ළමයි සද්ද කරයි, බාධ කරයි කියල දෙමවුපියො ඒ අයව ඈතට ගෙනිහින් පැත්තක තියාගෙන වන්දවනව වගේ වැඩක්. දැන් මේ කියන කාරණා ඔක්කොම, හරියට චිත්‍රපටයක දර්ශන පෙළක් වගේ පැහැදිලිවම සමාධියට පේනවා. මේ වගේ දේවල් බුදු දහමෙත් සඳහන් වෙනවා. මම ඒ විදියට පුද්ගලිකව අත් දැකපු අවස්ථාවක් තමයි මේ කිව්වෙ.



ඒ වගේම තමයි සමහර සම්‍යක්දෘෂ්ටික දෙව් දේවතාවො බණ අහන්න, පිරිත් අහන්න බොහොම කැමතියි. සමහර වෙලාවට ඒ අය වඩාත් කැමති බණ දහම් කොටස් තියෙනවා. මනුස්සයො අතරත් විවිධ බණ දහම් කොටස්වලට කැමති විවිධ පිරිස් ඉන්නව වගේ, ඒ අය අතරත් සමහර බණ දහම් කොටස්වලට හිත ගියපු පිරිස් ඉන්නවා. එතකොට ඒ තමන් කැමති දේශනාවක් යන කොට, ඒ අය ඒක අහන්න විශේෂයෙන් මනුස්ස ලෝකෙට එනවා. මේ වගේ සිද්ධියක් මීට අවුරුදු 5 - 6 කට විතර ඉස්සර මම වැඩ හිටපු පන්සලේදි සිද්ධ වුණා. දවසක් නිරෝධයයි, නිරෝධ සමාපත්තිය ගැනයි සාකච්ඡාවක් ගියා. ඒ කියන්නෙ බණ අහන්න ආපු එක්තරා පිංවත් පිරිසක් මුල් කරගෙන රාත්‍රී කාලයේ සිද්ධ වෙච්ච සාකච්ඡාවක්. එක්තරා දේවතාවෙක් මේක අහන්න බොහොම කැමැත්තෙන් හිටියා. දැන් මේ සාකච්ඡාව කළේ මම හිටපු කුටියට යාබද සාලයේ. රෑ වෙච්ච නිසා ඒ සාලෙ එළිමහන් දොරත් වහල තිබුණෙ. පිරිස ඇතුලෙ ඉඳගෙන තමයි සාකච්ඡාවට ඇහුම් කන් දුන්නෙ. එහෙම සාකච්ඡාව කෙරිල අවසන් වෙනවත් එක්කම, එක පාරටම අර වහල තිබිච්ච දොර

ඇරුණා. ඒ වෙලාවෙ එතන හිටපු තවත් හාමුදුරු නමක්, මෙතනින් බැහැල කවුද දොර ඇරගෙන ආවෙ කියල අහල, ආපු කෙනා දේවතාවෙක් නම් පේන්න යන්න කියල කිව්වා. කියන කොටම මහ විසාල එළියක් පන්සලේ උඩ දිසාවෙ පටන් පහළ දිසාවට වේගෙන් ඇදිල ගියා. එහෙම ගිහින් පහළ තිබ්බ ධර්ම ශාලාව පැත්තෙන් කැරකිලා ගියා. මේ වෙලාවෙදී ඒ ධර්ම ශාලාව පැත්තෙ මොනව හරි වැඩ කටයුත්තක නිරත වෙලා හිටපු උපාසක මහත්තුරු දෙන්නෙක්, මේ විසාල එළිය දැකල ඇඟ හැම තැනම හිරිවැටිල ගිහින් මං ඉන්න දිහාවට පැනල ආවා. නමුත් ඇවිත් බණ අහන කොට එහෙම මුකුත් එළියක් පේන්න නෑ. ඒ කියන්නෙ ඒ දේවතාව අර බණ අහනව කියල පෙන්නුම් කරල විතරක් යන්න ගියා. මේ වගේ අපි නොහිතන දේවල් මේ විශ්වයේ අනන්තවත් සිද්ධ වෙනවා. **යම්කිසි සමාධියක්, දිවැසක් තියෙන කෙනෙකුට මේ වගේ දේවල් ඒ අයගෙ දිවැස්, සමාධි මට්ටම්වලට අනුව දැක බලා ගන්න පුළුවන්.**

ඊළඟට යම්කිසි බයක්, තැති ගැන්මක්, කරදරයක් ඇති වුනාම ඒක නැතිකරගන්න පුළුවන් ගාථා තියෙන බවත් මීට පෙර විග්‍රහ කළා. ඒ කියන්නෙ ඒ වෙලාවට ඒ ගාථාව සිහි කළාම, හේතු යෙදිච්ච විදියට තමන්ට තියෙන කරදර බාධක දුරු වෙනවා. චන්ද්‍ර සූර්ය පිරිත කියන්නෙත් ඒ වගේ මහ බලවත් ගාථා කොටස් අඩංගු පිරිත් කොටස් 2 ක්. මීට කලිනුත් මේ ගැන කෙටි විග්‍රහයක් කළා. ඒ කියන්නෙ රාහු අසුරේන්ද්‍රයා, චන්ද්‍ර සූර්ය දිව්‍ය රාජයො අල්ලන්න එන කොට, ඒ අය බය වෙලා බුදු පිළිසරණ ඉල්ලගෙන කෑ ගහපු අවස්ථාවක් තමයි මේකෙන් කියවෙන්නෙ. ඉතින් අපිට වුනත් මහ බාධකයක් ඇවිත් කරදරකාරී මානසිකත්වයක් ඇති වෙන කොට, මේ ගාථාව සිහි කරල පිළිසරණක් ලබාගන්න පුළුවන්. මටත් ඒ වගේ කරදරයකට මුහුණ පාන්න සිද්ධ වෙච්ච එක්තරා අවස්ථාවක, මේ ගාථාව සිහි කරල පිළිසරණ ලබාගත්තු ආකාරය තමයි දැන් මේ කෙටියෙන් විස්තර කරන්නෙ.

පසුගිය දවසක මට බොහොම අමාරු වුණා. ඒ කියන්නෙ ඇති වෙච්ච කායික අපහසුතාවයක්. ඇඟේ වේදනාව වැඩි වෙලා මම නිදාගෙන හිටියෙ බොහොම අමාරුවෙන්. අම්මෝ කියල නිතරම කෑ ගැහෙනවා. ඒ අතර අමනුස්සයොත් ඇවිත් වට කරගෙන. මොකද මේ වගේ අමාරුකම් එද්දි ඒ අයත් ඇවිත් කරදර කරනවා. කවුද ඉන්නෙ කියන එක හරියටම හොයන්න බෑ. නමුත් මාර බන්ධනත් එක්ක අමනුස්ස පිරිසුත් සම්බන්ධ වෙලා හිටියා. ඒ අමනුස්සයින්ගෙ විවිධාකාර බය ගැන්වීම්, කොලොප්පම් කිරීම් තිබුණා. ''බුදුන් පස්සෙ ගිහින් හරියනවද? දැන්වත් තේරෙනවද වේදනාව?'' ඔය වගේ අදහස් තමයි හඟවන්නෙ. මොකද ඒ අයත් කය දුර්වල වෙන වෙලාවක් බලල තමයි මේ වගේ වැඩවලට එන්නෙ. බුදුන් වහන්සේටත් කර්ම විපාක ඵල දෙනකොට වසවර්ති මාරයා ඇවිත්, දැන්වත් වේදනාව තේරෙනවද කියල අහපු තැන් ධර්මයේ සඳහන් වෙනවා. උන් වහන්සේට ගල් පෙරලල වෙහෙස වෙලා සැතපිලා ඉන්න වෙලාවෙදී, ඇයි නිදාගෙන ඉන්නෙ? ඇයි ඇහැරිලා ඉන්න බැරිද?... මේ ආදී වශයෙන් මාර දිව්‍ය පුත්‍රයා කොලොප්පම් කරල ගිහින් තියෙනවා. මේ වගේ වෙලාවට තමයි අපි බුදු පිහිට ඉල්ලන්නෙ. එහෙම අමාරු වුනාම ඉවසන්නම බැරි තැන, මම මේ පිහිට ඉල්ලන ගාථාව සිහි කළා.

**නමෝ තේ බුද්ධ වීරත්ථු -**
**විප්පමුත්තෝසි සබ්බධී**
**සම්බාධපටිපන්නෝස්මී -**
**තස්ස මේ සරණං භවාතී**

බුද්ධ වීරයාණෙනි, ඔබ වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් විශේෂයෙන් මිදුනු සේක. ඔබ වහන්සේට නමස්කාර වේවා. මම සම්බාධකයකට (හිරිහැරයකට) පැමිණියේ වෙමි. ඒ මට පිළිසරණ වුව මැනවි. මේ තමයි ගාථාවෙ සිංහල තේරුම. (වැඩි විස්තර අවශ්‍ය නම් පිරුවාණා පොත් වහන්සේ තුළින් බලාගන්න පුළුවන්.)

දැන් මම මේ ගාථාව තුන් වතාවක් සිහි කරන කොට, අර තිබ්බ අමාරුව දන්නෙම නැතිව පහවෙලා මට නින්ද ගියා. නමුත් ඒක සාමාන්‍යයෙන් නින්ද යන වෙලාවකුත් නෙවෙයි. අමාරුව ඒ තරම් වැඩියි. නින්ද ගිහින් බලන කොට මට විශේෂ දර්ශනයක් පෙනුණා. ඒ කියන්නෙ රත්රන් කූඩුවක් වගේ එකක මම කොටු වෙලා, ඇතුළට වෙලා ඒකත් එක්ක පාවෙන්න පටන් ගත්තා. ඒක හරියට 2 x 4 පොලු වගේ, රත්රන් පොලුවලින් වට වෙච්ච ආරක්ෂක කූඩුවක්. ඒක ඇතුලෙ ඉන්න කොට මගේ අතට රත්රන් කඩුවක් මැවිල ආවා. හැබැයි ඒ කපන්න කොටන්න නෙවෙයි. මහ රැකවරණයක් ඇතිව ඉන්නවා කියන එක පෙන්වන්න. අනෙක් අය ඒක දැක්කම බය වෙනවා. දැන් මම ඒ කඩුවත් අතේ තියාගෙන ඉන්න කොට අර චණ්ඩිකම්, ලොකුකම් පෙන්වන්න ආපු අය ඈත් වුණා. මට බයක් නෑ ඒ අය ළඟට යන්න. මොකද වටේටම රත්රන් කූඩුවකින් කොටු වෙලා. ඒ තරම් ආරක්ෂාවක්. දැන් මේ විදියට කඩුවත් අතේ තියාගෙන රවුමක් කැරකිලා නින්දෙන් අවදි වුණාට පස්සෙ තමයි දැනගත්තෙ, මම මේ දැක්කෙ හීනයක් කියල. හැබැයි හීනයක් කියල කිව්වට හීනයයි, හැබෑ ලෝකයයි දෙකම එකට එකතු වෙන වෙලාවක් තියෙනවා. ඒ කියන්නෙ හැබෑ ලෝකයේ ස්වභාවය හීන ලෝකයෙන් දකිනවා. ඒ කියන්නෙ ගුප්ත ලෝකය. ඒක හීනයක් වගේ තමයි දකින්නෙ. නිදිද නැද්ද කියලත් හරියටම කියන්න බෑ. නින්ද යන්න ගිහින් නිකං බොහොම සුව පහසු අවස්ථාවක් ආව වගේ තමයි දැනුනෙ. ඊළඟට, කෝ මේ ඇඟේ අමාරුව කියල බලන කොට ඒක කොහොම නැති වුනාද කියල හිතාගන්නත් බෑ. අර විනාඩි ගණනට ඒක නැතිවෙලා ගිහින්. මේ කිව්වෙ මගේ අත්දැකීමක්. **මේ ගාථාව දැන් වැඩිය භාවිතාවෙ නැති වුණාට බොහොම බලවත් ආරක්ෂක ගාථාවක්. අසනීපයකදී, කරදරයකදී පාවිච්චි කරන්න හුඟක් හොඳයි.**

දැන් මේ වගේ කාරණාවලින් ඔප්පු වෙනව මේ බුද්ධ ආරක්ෂාව, රැකවරණය අදත් ක්‍රියාත්මක වෙන බව. මොකද බුදුන් වහන්සේ පිරිනිවන් පෑවට උන් වහන්සේගෙ ගුණ රුව තවමත් ක්‍රියාත්මකයි. ඒ ගුණස්කන්ධය තවමත් විශ්වයේ තියෙනවා. බුදුන් වහන්සේගෙ යම් කිසි ශ්‍රාවකයෙක්, යම්කිසි පිහිටක් ඉල්ලන කොට ඒකට පිහිටක් රැකවරණයක් අදත් විශ්වයේ සිට ක්‍රියාත්මක වෙනවා. මේ වෙන කොට පිංවත් පිරිස් මේව ගැන දන්නෙ නැතිව, බොහෝ කොටම අතරමං වෙලා ඉබාගාතෙ යන නිසා, ඒ අයටත් අස්වැසිල්ලක්, පිහිටක් වෙන්න කියල තමයි මේ බුද්ධ ගාථාවෙ තියෙන වටිනාකම මේ විදියට අත්දැකීම් එක්ක හෙළි කළේ. මොකද මේකට වියදමක් යන්නෙත් නෑ, කාගෙවත් පස්සෙන් යන්න ඕනත් නෑ, කිසි මහන්සියකුත් නෑ. තමන්ටම ඒ ගුණ සිහි කරල පිහිට, රැකවරණය ලබාගන්න පුළුවන්. මේ වගේ බොහොම පහසුවෙන් බුද්ධ රැකවරණය, ආශිර්වාදය ලබාගන්න පුළුවන් බුද්ධෝත්පාද කාලයක තමයි අපි මේ ජීවත් වෙන්නෙ. නමුත් බොහොමයක් උදවිය ඒක දන්නෙ නෑ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

**සටහන**
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# තුන් දොස් කුපිත වීමෙන් හටගන්නා ලෙඩ රෝගවල ස්වභාවය දහම් ඇසින්...

*(පසුගිය කලාපයෙන් - අණවින කොඩිවින, සාප කිරීම් ආදිය හැමෝටම නොවදින්න හේතුව සහ කර්ම විපාකයන්ගේ වෙනස්කම් නිසා ඇතිවන ලෙඩ රෝග කරදර...)*

පසුගිය කලාපයෙන් විස්තර කරපු ලිපියෙන් වා, පිත්, සෙම් මුල් කරගෙන රෝග හටගන්නා තවත් ක්‍රමයක් තියෙන බවත් සඳහන් කළා. දැන් මේ විස්තර කරන්න යන්නෙ ඒ ක්‍රමය මුල්කරගෙන රෝග හටගන්න හැටිත්, තුන් දොස් කියල හැඳින්වෙන ලෝභ, ද්වේශ, මෝහ සමග ඒවාට තියෙන සම්බන්ධයත් හෙළිදරව් කරන්න.



ජන සමාජයේ කාට හරි රෝගයක් හැදුනම තුන් දොස් කිපිලයි කියල හඳුන්වන සිරිතක් අපේ පැරැන්නන් අතර තිබුණා. මෙතනදි තුන් දොස් කියල හැඳින්වුනේ සාමාන්‍යයෙන් හැමෝම වගේ දන්න වාතය, පිත, සෙම කියන මේ කාරණා තුන වුනත්, තවත් ගැඹුරට විග්‍රහ කරල බලන කොට මේ තුන හට ගන්නත් බලපාන තවත් මූල කාරණා 3 ක් ලෝභ, ද්වේශ, මෝහ කියල දහමේ සඳහන් වෙනවා. හැබැයි මෙතනදි වා, පිත්, සෙම් කියල ව්‍යවහාරයේ පහසුවට හැඳින්වුවට ලෝභ, ද්වේශ, මෝහ එක්ක සම්බන්ධ වෙන කොට ලෝභයට සෙමත්, ද්වේශයට පිතත්, මෝහයට වාතයත් විදියට තමයි සම්බන්ධ වෙන්නෙ. දැන් මේ එකින් එක විග්‍රහ කරල ගත්තොත්,

මෝහය සම්බන්ධ වෙන්නෙ වාතයට. මේ දෙකේම සමාන ගති ස්වභාවයක් තියෙනවා. ඒ තමයි නන්නත්තාර බව. ඒ කියන්නෙ වාතය කොතැනකවත් රැඳෙන්නෙ නෑ, අල්ල ගන්න බෑ, ඔහේ යනවා, යන තැනක් කියලත් නෑ. මොනව හරි හේතු ඵලයක් විදියට යෙදුණොත් ඒ යෙදිච්ච පැත්තට ගමන් කරනව මිසක් නිශ්චිත ගමනක් නෑ. ඒ තමයි වාතයේ ස්වභාවය. ඒ වගේම දැඩි මෝහාධික මෝඩ පුද්ගලයෙක් ගත්තොත්, ඒ පුද්ගලයටත් මම, මගෙ කියල මුකුත් ආසාවෙන් අල්ල ගැනීමක් නෑ. හැබැයි එහෙම අල්ල ගැනීමක් නැත්තෙ ලෝකයේ යථා ස්වභාවය දැනගෙන අතහැරල නෙවෙයි, ඒ සඳහා අවශ්‍ය හැකියාවක්, මානසිකත්වයක් නැති නිසා. **ඒ දැඩි මෝහය කියන හේතුවේ එක් ඵලයක් තමයි මන්ද බුද්ධික බව. ඒ කියන්නෙ දැඩි මෝහයෙන් අන්ධ වෙලා කරපු කර්මයක විපාකයක්.** දැන් ඒ ගති ලක්ෂණ තමයි වාතයට තියෙන්නෙත්. ඒ වගේම වාතයට සුවඳක් ආවොත් සුවඳ ගහනවා, ගඳක් ආවොත් ගඳ ගහනවා. එක පැත්තකට පීඩනයක් ආවොත් අනෙක් පැත්තට තෙරපිලා යනවා. මේ වගේ එක තැනක රැඳීමක්, කිසිම දෙයක අයිතියක් නෑ. වෙනත් දෙයක ආධාරයෙන් තමයි වාතයෙන් වැඩ ගන්නෙ. ඒ කියන්නෙ වෙනත් දෙයක ආධාරයක් නැතිව වාතයට කිසිම දෙයක් තනියෙන් කරන්න බෑ. හැම වෙලේම හේතු ඵලයක් වශයෙන් ක්‍රියාත්මක වෙමින් තව එකක ප්‍රතිඵලයක් පෙන්වනවා. උදාහරණ විදියට එක පැත්තකට අඩු පීඩනයක් ඇතිවෙන විදියට උෂ්ණත්වය වැඩි කළොත් උෂ්ණත්වය තමයි ප්‍රධාන වෙන්නෙ. උෂ්ණත්වය ආපුවම පීඩනය අඩු වෙනවා. එතකොට පිටින් වාතය එතැනට ඇදල එනවා. ඒකෙන් හුළඟක් හට ගන්නවා. ජල වාෂ්ප එතැනට ඇදල එනවා. එතකොට ජල වාෂ්ප නිකන් අරගෙන යන්න වාතයට හැකියාවක් නෑ. තවත් මොකක් හරි ආධාර කරගන්න වෙනවා.





දැන් එතකොට මේකෙන් පේනව, වාතයට තියෙන්නෙ හැම වෙලේම නන්නත්තාර වෙච්ච ස්වභාවයක් කියල. මෝහාධිකයගෙ ස්වභාවයත් මේ විදියෙ තමයි. මෝහය වැඩි වුනාම තමයි වාතය කුපිත වෙන්නෙ. වාතය කිව්වම අති සියුම් වාතයක් තියෙනවා. ඒව ඒ තරම් ප්‍රභල නෑ. උදාහරණ විදියට අපි හුස්ම ගන්නවා. ඒ වගේම දෙවි දේවතාවොත් හුස්ම ගන්නවා, වාතය පරිහරණය කරනවා. හැබැයි පරිහරණය කළාට මිනිස්සුන්ට වගේ වාත කැක්කුම්, රුදෙන තැන්, වාත ගඳ ගැහිලි වගේ ඒව නෑ. ආස්වාස ප්‍රාස්වාස වායුවක් විතරයි තියෙන්නෙ. ඒකත් නැත්තෙ බ්‍රහ්මයින්ට විතරයි. බ්‍රහ්මයො ඒ ස්වභාවය ඉක්මවල නිදහස් වෙලා ඉන්නෙ. නමුත් බ්‍රහ්ම ලෝකයෙන් මෙහා තියෙන කාම ලෝකයේ දාහය නිවන්න වාතය අවශ්‍යයි. ඒකෙනුත් අති සියුම් මට්ටමක් විතරයි දෙවි දේවතාවන්ට අවශ්‍ය.

ඒ වගේම මේ වාත අමාරු ගත්තම කර්ම විපාක වශයෙන් මනුස්සයින්ට වගේම සතර අපාගත තිරිසන්, ප්‍රේත ආදී කොට්ඨාශවලටත් හැදෙන්න පුළුවන්. ඒ අයටත් වාත ගෙඩි, වාත අමාරු තියෙනවා. කර්ම ශක්තයෙන් හටගන්න කර්මජ වායුව සහ උතුජ වායුව තමයි ඒකට මුල් වෙන්නෙ. ඒකෙන් තමයි ඒ විදියට රෝග හටගන්නෙ.

ඊළඟට මේ වාතය ගත්තමත් විවිධ අවස්ථා තියෙනවා. වා + අත =වාත කිව්වම අර්ථයෙන් වැය වෙලා ගියා කියන අදහස තමයි එන්නෙ. ඒකෙත් විවිධ අවස්ථා තියෙනවා. සුලං, පවන් කියන්නෙත් ඒ වගේ අවස්ථා 2 ක්, අර්ථ 2 ක්. සැඩ සුලං කියනව මිසක් සැඩ පවන් කියන්නෙ නෑ. සුලං බොහොම සැරයි. ඒ වගේම මඳ

☞

පවන් කියලයි කියන්නෙ. පවනෙ ස්වභාවය තමයි මඳ බව. හුලං ගහනවා, පවන් සලනවා. මේ ක්‍රම 2 ක්. පව + අන් - පවන්, සුල + අන් - සුලං. අන් කියන්නෙ අවිද්‍යා තණ්හා ආහාරය. **පාපයට ආහාරය තමයි පවන් කියන්නෙ.** ඒක සියුම් සුවයක් එක්ක තමයි ලෝභයට, පාපයට ඇදල දාන්නෙ. එතකොට ඒක සලා හරින්න ඕන. ඒකයි පවන් සලනවා කියන්නෙ. ඒ කියන්නෙ පාපයට ආහාර වෙන දේවල් සලා හරිනවා. එතකොට හුලං ගහනවා. **ලෝභ, ද්වේශ, මෝහ කියන උලට ආහාරය තමයි හුලං කියන්නෙ.** ඒකෙ ස්වභාවය තමයි අපට ගහන එක. ඒකෙන් අපට බැට දෙනවා. පාපය අපට බැට දෙනවා. එතකොට සුලංවල ස්වභාවය දැනගෙන ඒකෙන් අපට ගහන බව දැනගන්න ඕන. ඒක බොහොම සැඩයි කියල දැන ගෙන ඒකෙන් වළකින්න ඕන. ඒක අර වගේ සලාහරින්න බෑ. ඒකට ධර්මයෙන් ගහන්න ඕන. අධර්මයෙන් ගැහුවොත් පාපය තවත් වැඩි වෙනවා. මොකද ඒක අරකට වඩා ප්‍රභලයි. ඒ නිසා සැඩ සුළඟින් වළකින්න ඕන, ඈත් වෙලා මග හරින්න ඕන. පවන් සලා හැරියට ලොකු සැඩ සුළඟක් සලා හරින්න බෑ. ඒකෙන් මග හැරල ආරක්ෂා වෙන්න ඕන.

එහෙනම් උල් කියන ලෝභ, ද්වේශ, මෝහයන්ගෙන් වෙන් වෙලා කටයුතු කළාම සැඩ සුලං නිසා එන විනාශයත් නතර වෙනවා. ඒ නිසා **සැඩ සුලං, සුළි සුලංවලින් එන විනාශයන්ගෙන් වළකින්න තියෙන එක් ක්‍රමයක් තමයි මනුස්සයින් ලෝභ, ද්වේශ, මෝහයන්ගෙන් තොරව ජීවත්වීම.** එතකොට සසරෙ කරපු අනන්තරයක් තිබුණත් දැන් කෙරෙන සමනන්තරයක් නැති නිසා ස්වභාවිකව ඒ වගේ සැඩ සුලං, සුළි සුලං ආදියෙන් එන විනාශයන්ට හේතු නැතිව යනවා.

ඒ වගේම පවන් කියන එක සලා හැරිය යුතු බව දැනගන්න ඕන. එතකොට වාතයේම තියෙන ගති ලක්ෂණ 2 ක් තමයි මේ. ඒ නිසා තමයි **''අවන්පතින් පවන් සැලේ - වටාපතින් හුලං ගැසේ''** කියල කියන්නෙ. මේ ක්‍රම 2 ක්. අව+ අන් + පත - අවන් පත - පටිච්ච සමුප්පාද නිරෝධය තමයි වටාපතේ අනිත් පැත්තෙ තියෙන්නෙ. ඒ තමයි අවන්පත. **සසර ආපු අවිද්‍යා තණ්හා ආහාර අව කරනවයි කියන්නෙ ඉවත් කරනවා කියන එක. ඒ ආහාරය ඉවත් කරන එක තමයි අවන්පතින් කරන්නෙ. ඒ කියන්නෙ පටිච්ච සමුප්පාද නිරෝධය.** අවිද්‍යායත්වේව අසේස විරාග නිරෝධා, සංඛාර නිරෝධෝ, විඤ්ඤාණ නිරෝධෝ කියල කියන්නෙ ඒ චක්‍රය. ඒක තමයි අවන් පතේ තියෙන ධර්ම චක්‍රයෙන් පෙන්වන්නෙ. ඒ කියන්නෙ පාපයන්ගෙන් වෙන් වෙන පැත්ත. එතකොට සසරින් නිදහස්.

වට + ආ + පත - වටාපත. වට කියන්නෙ සංසාරය. සංසාරයේ ආපු ආකාරය පෙන්වන්නෙ පටිච්ච සමුප්පාද චක්‍රයෙන්. ඒක තමයි ඒ පැත්තෙ තියෙන ධර්ම චක්‍රයෙන් පෙන්වන්නෙ. ඒකෙන් අවිද්‍යා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං.... ආදී වශයෙන් සංසාරය ගොඩ නැගෙන චක්‍රය පෙන්වනවා. ඒක උල් කියන ලෝභ, ද්වේශ, මෝහත් එක්ක සම්බන්ධයි. අනන්ත සංසාරෙ අපිට ඒවායින් ගහපු එකම තමයි කළේ. දැනුත් මේ උල් කියන ආහාරවලින් අපට වද දෙන එකමයි, ගහන එකමයි කරන්නෙ. ඒ නිසා තමයි හුලං ගහනවයි කියන්නෙ. ඒක පෙන්වන්නෙ වටාපතින්. වටාපතින් හුලං ගැසේ කිව්වෙ ඒකයි. එතකොට **සසර ගමන මේ උල්වලින් ගුටි කකා ආපු හැටි වටාපතින් දැනගෙන, අවන්පතින් ඒකෙන් ඉවත් වෙන හැටි දැනගන්න ඕන.** ඒ නිසා අවන්පතින් පවන් සලන්න ඕන. අවන්පත කියන්නෙ වටාපතට කියන තවත් නමක්. හැබැයි අදහස් 2 ක්. එකකින් කියවෙන අදහසේ අනිත් පැත්ත තමයි අනිකෙන් කියන්නෙ. මේ **එකම උපකරණයේ දෙපැත්තෙ වටාපතයි, අවන්පතයි 2 ම තියෙනවා. මේ 2 ම වාතය මුල් කරගෙන හැදිච්ච වචන 2 ක්.**

එතකොට මේ කියන වටාපතයි, අවන්පතයි 2 තමයි අපි නිතරම අවබෝධ කරගන්න ඕන. භික්ෂූන් වහන්සේ නමක් කොහේ වැඩියත් වටාපත අරගෙන යන්න හේතුව ඒකයි. බණ කියන කොට ගන්නෙත් ඒකම තමයි. සසර ආපු හැටි සිහි කරල, සසරෙන් වෙන් වෙන හැටි බලන්න ඉස්සෙල්ලම වටාපත බලල, ඊළඟට අවන්පත බලනවා. අද ඕකෙන් දාඩිය ඉවත් කරන්න පවන් සැලුවත් එදා ප්‍රධාන කාරණය වුනේ මේ දහම දකින එක. මේක නිතර බලන්න තියෙන පාඩමක්. මොකද ධර්ම දේශනාවක් කරන්න ඕන පටිච්ච සමුප්පාද චක්‍රය මුල් කරගෙන ලෝකය හැදෙන හැටියි, පටිච්ච සමුප්පාද නිරෝධයෙන් ලෝකයෙන් වෙන් වෙන හැටියි පෙන්නුම් කරල. ඒ දෙකට අවශ්‍යම කාරණය තමයි මේ වටාපතයි අවන්පතයි කියන දෙපැත්තෙන් සිහි කරන්නෙ.

එදා නිතර භාවිතා කරන්න තල් පතේ ලියල තියාගත්තු එක තමයි පසු කාලයක මුල් කාරණය අමතක කරල, දාඩිය නිවා ගන්න විතරක් භාවිතා කරන්න පුරුදු වුණේ. නමුත් මූලික වටාපත කියන්නෙ අර වගේ දහම පෙන්වන, දහම් අවබෝධ කරගන්න තිබිච්ච සටහනක්. ඒ සටහන බොහොම වැදගත්. නිවන් දකින බණ කියන්න ඒ ටික හොඳටම ප්‍රමාණවත්. ඒක තමයි නිතරම පෙරල පෙරල බලන්නෙ. වටාපත පැත්ත පෙරළල බැලුවම පේනව, අනේ මේ සසර ගමන හැදෙන හැටිනෙ කියල. එතකොට ඒක සිහිවෙනවා. ඊළඟට අවන්පත පෙරළල බලන කොට නිවන් මාර්ගය මේකනෙ කියල වැටහෙනවා. මේ දෙක මාරුවෙන් මාරුවට බල බලා ආවර්ජනය කරනවා. මේ දෙක තමයි නිවන් දකින්න තිබිච්ච අත්‍යවශ්‍යම කොටස. ඉතින් තර්කවාද කර කර ඉන්න දෙයක් තිබුනෙ නෑ. මේ පැති 2 හරව ගත්තම ඕක තමයි නිවනට මග කියල වැටහෙනවා. ඉතින් එදා භික්ෂූන් වහන්සේලා වටාපතේ මේ දෙපැත්ත තමයි බල බලා හිටියෙ. එක පැත්තක් බලල ලෝකෙ හැටි දැනගත්තා. අනිත් පැත්ත බලල ලෝකෙන් මිදෙන හැටි දැනගත්තා. ආවර්ජනය කළේ මේ දෙක. නමුත් එදා තිබිච්ච වටාපත වෙනුවට අද සමාජයේ තියෙන සමහර වටාපත්වල නමට විතරක් චක්‍ර ලකුණක් දාල තියෙනවා. එහෙම නැත්නම් බෝ කොළයක් විතරක් දාල තියෙනවා. ඕක වන වනා ඉන්නව මිසක් වටාපතේ තිබිච්ච වැදගත්කම, දහම් අරුත දන්නෙ නෑ. ඒක අද වෙන කොට වැහිල ගිහින්.

ඊළඟට අවන්පත ගන්නෙ පවන් සලන්න. යම්කිසි කෙනෙකුට සුවපත් වේවා කියල ආශිර්වාද කරන්නෙ අවන්පත තියෙන පැත්තෙන්. ඒ පැත්ත තමයි ආශිර්වාද කරන්න ගන්නෙ. ඒකට වටාපත තියෙන පැත්ත යොදා ගන්නෙ නෑ. ඒ වගේම ඒ කාලෙ ගෝලයට තරවටු කරන්න ගත්තෙ වටාපත පැත්ත. වටාපත පැත්තෙන් හිමින් තට්ටු කරල තමයි වැරැද්ද පෙන්වා දුන්නෙ. ''මොකක්ද උඹ ඔය කරන්නෙ? ඕක සසර ගමනට හේතු වෙනව කියල දැන ගනින්. ඕකෙන් ඉවත් වෙයන්....'' මේ ආදී වශයෙන් වටාපත පැත්තෙන් පුංචි තට්ටුවක් දාල තමයි වරදෙ ස්වභාවය පෙන්වා දුන්නෙ. එතකොට අපි ආපු අනන්ත සංසාරෙ අපට පහර දුන්නෙත් මේ වටාපතින් පෙන්වන කාරණාවලින් තමයි. ඒ වගේම දැනුත් සංකේතයක් වශයෙන් වටාපතින් තට්ටුවක් දාල තමයි ඒක මතක් කරල දෙන්නෙ. ඒක රිදවන්න කරන එකක් නෙවෙයි. යහමගට ගන්න කරන පොඩි තරවටුවක්. මේක ඒ කාලෙ තිබිච්ච ක්‍රමයක්. අද වගේ කෝටු අරගෙන ගැහුවෙ නෑ, අතින් පයින් ගැහුවෙ නෑ. පොඩි තට්ටුවක් දාල අර වටාපතේ තියෙන දේ කියල දීල, ඒකෙන් අහක් වෙන්න සසර ගමනෙ හැටි සිහිගන්වනවා. ඊට පස්සෙ වැඳල සමාව ගත්තම, සුවපත් වේවා කියල අවන්පතින් ආශිර්වාද කරනවා. පවන් සැලීමෙන් ඒක පෙන්වනවා.

ඒ වගේම විසභාග අරමුණු ☞

කියල දෙයක් තියෙනවා. ඒ කියන්නෙ කාම අරමුණු. මොකද භික්ෂූන් වහන්සේ නමක් බණ කියන්න වැඩියම, දානෙකට වැඩියම කාන්තාවන්ගෙ විවිධාකාර හැසිරීම් දකින්න පුළුවන්. ඒ වගේම සැඟවිය යුතු තැන් දකින්න පුළුවන්. ඒවට කියනව විසභාග අරමුණු කියල. ඒ වගේ අවස්ථාවක් එන කොටම ටක් ගාල ඉස්සරහට ගන්නෙ අර වටාපත පැත්ත. සසර ගමන හැදෙන්නෙ මේ වගේ කාම කෙළෙස්වලින් නේද කියල වටාපතේ තියෙන ඒ චක්‍රය සිහි කරනවා. එතකොට එතනදි කාරණා 2 ක් සිද්ධ වෙනවා. එකක් අර විසභාග අරමුණු ඇහැට පෙනීම වැළකෙනවා. වටාපතින් ඒක වැහෙනවා. එහෙම වැහෙනවත් එක්කම, වටාපතින් පෙන්වන සසර ගමනට මේව නේද හේතු වෙන්නෙ කියල වැටහීමත් සමගම දෙවන කාරණයත් සිද්ධ වෙනවා. ඒ නිසා මේ වටාපත ආධාර කරගෙන එදා හිටපු භික්ෂූන් වහන්සේලා වටිනා ප්‍රයෝජන ගත්තා. භික්ෂූන් වහන්සේ නමක් අතේ වටාපත තිබුණෙ ප්‍රධාන වශයෙන්ම මේ වගේ කාරණාවලට. ඒ වගේම තමන්ට එන දාඩිය කාන්සිය ඉවත් කරගන්න, මැසි මදුරුවන් හෝහපුටුවන් වැහුවොත් පහසුවෙන් පළවා හරින්න වගේ කාරණාත් ඒකෙන් සිද්ධ වුණා. මේ වගේ එදා වටාපතින් හුගක් ප්‍රයෝජන ගත්තා.

කොහොම හරි එදා වටාපතක් පරිහරණය කරන්න ගත්තෙ ධර්මය සිහි කිරීම ප්‍රධාන කරගෙන. නමුත් අද වෙන කොට ඒක වැහිල ගිහින්. අද ඒක නමට විතරක් සංකේතයක් විදියට ගේනවා. නමුත් අදත්, එදා වගේ ධර්මය සිහි කිරීම ප්‍රධාන වුනානම් ලොකු වටිනාකමක් එනවා. එතකොට යෝ පටිච්ච සමුප්පාදං පස්සති සෝ ධම්මං පස්සති කිව්ව කාරණය සිද්ධ වෙනවා. ඊළඟට යෝ ධම්මං පස්සති සෝ මං පස්සති කියන, යමෙක් ධර්මය දකීද හේ මා දකී කියන බුදුන් දැකීම පරමාර්ථ අන්දමින් සිද්ධ වෙනවා. මේ විදියට **ධර්මය දැකීම, බුදුන් දැකීම එදා තිබ්බිච්ච වටාපතිනුත් සිද්ධ වුණා.**

ඊළඟට ලෝභය ගත්තොත්, රාගයේම බලවත් දූෂ්‍ය කොටස තමයි ලෝභ කියන්නෙ. රාගය සමග දැඩිව මමත්වයෙන් බැඳුනම ලෝභ වෙනවා. ඒ ලෝභයත් එක්ක සම්බන්ධ වෙන්නෙ සෙම. අපි සේම කියල වචනයක් පාවිච්චි කරනවා. මේකෙන් හඳුන්වන්නෙ හැම වෙලේම යම්කිසි ශාන්තියක්, ශාන්ත භූමියක් (ක්ෂේම භූමියක්) කියන අදහස. නමුත් මේ කාම ලෝකයේ ඉන්න අය මෙතනදි සේමයක් වශයෙන් ගන්නෙ මල්වතු, ලස්සන උද්‍යාන වගේ ස්ථානවලට ගිහින් බොහොම සන්තෝසෙන් ලෞකික වශයෙන් පංචකාම සුවයක් ලබන්නා වූ අවස්ථාවලට තමයි. එතකොට ඒක ඒ අයට සේමයක් වගේ. එතකොට අර ශාන්තව තිබ්බිච්ච සේමය කුපිත වෙනවා. ඒ කියන්නෙ දැඩි රාග (ලෝභය) පැත්තට ඇලෙන බැඳෙන ස්වභාවය තමයි ඒකෙ ගති ලක්ෂණය. දැඩි රාගය කිව්වම රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියන මේ 5 ටම ඇලීම අයිති වෙනවා. එතකොට සෙමවල තියෙන්නෙත් එහෙම ගති ස්වභාවයක්. නමුත් මේ මස් ලේ කයක් පවත්වන්න සෙම අවශ්‍යයි. ශරීර සුවයට ඒක අවශ්‍යයි. ඒ නිසා කොහොමත් ඒක ශරීරයේ තියෙනවා. නමුත් අර විදියට කුපිත වුනාම තමයි සෙම් රෝග ඇවිස්සෙන්නෙ.

ඒ වගේම **දැඩි රාග ආස්වාදයෙන් බැඳිල ඒ ගැන හිත හිතා ඉන්න කොට, සෙම හලා හලා ඉන්නව කියල කතාවක් අද ජන සමාජයේ තියෙනවා. ලෝභය සෙමට සම්බන්ධ බවට ඒකත් සාක්ෂියක්.** උදාහරණයක් විදියට කෙනෙක් දානයක් දෙන්න ගිහින්, ඒ අස්සෙ ලස්සනට හොඳට ඇඳල පැළඳල ඉන්න තරුණියො දැකල, අර දානෙ දීම දෙවෙනි කරල කාම අදහස් මතු වෙලා ඒ අය දිහා බල බලා ආස්වාද විඳින්න පුළුවන්. එතකොට දානෙත් දෙනවා. ප්‍රධාන කාරණය දන් දීම වුනානම් ඒකෙන් සුදු විපාකයක් (පින් විපාකයක්) එනවා. හැබැයි අර විදියට කාමය මුල් කරගෙන ඇති වෙච්ච විසම ස්වභාවය නිසා කළු විපාකයකුත් (පාපයක්) පරිවාර වෙනවා. ඊළඟට මනුස්ස වෙලා උපන්නත් අර රාගික බව නිසා සෙම් රෝග ඇති ශරීරයක් ලැබෙන්න ඒ කාරණය හේතු වෙනවා. ඒ වගේ ගති ලක්ෂණ තමයි මුලින්ම මේ සෙම් රෝගවලට මුල් වෙන්නෙ. පුද්ගලයා හැම වෙලේම පැවැත්ම සඳහා ලෝකයට බැඳෙනවා. ඒ තමයි ඇලෙන ගතිය. ආසාවෙන් ලෝභයට බහිනවා. තමන් සතු කරගන්නව මිසක් අනුන්ට දෙන්නෙ නෑ. ඒ වස්තුව කෙරෙහි ආසාව වැඩි වුණාම ඒක තමන් සතුව තියා ගන්නවා මිසක් අනිකෙකුට දෙන්නෙ නෑ කියන හැඟීමක් එනවා.

මෙතනදි ලෝභය කියන ලක්ෂණය ගත්තොත් මිනිස්සු වැඩිපුරම ලෝභකම් කරන, ඇලෙන බැඳෙන දේවල් තියෙනවා. උදාහරණයක් විදියට මනුස්සයෙක්ගෙන් ඕන තරම් දේවල් ඉල්ලන්න පුළුවන්. දේපල ඉල්ලුවොත් දෙනවා, සල්ලි ඉල්ලුවොත් දෙනවා. හැබැයි තමන්ගෙ භාර්යාව ඉල්ලුවොත් දෙන්නෙ නෑ. ඒ වෙලාවෙදි මරාගන්න තරමට හරි අමාරුයි. නමුත් අර කලින් කියපු වගේ සමහර මෝහාධික මෝඩ පුද්ගලයො ඉන්නව, නිකන් හුළඟට නන්නත්තාර වෙලා ගියා වගේ ඒ අයගෙත් අල්ල ගැනීමක් නෑ. ඒ වගේ මනුස්සයින්ට ඕනෙත් මොකක් හරි ඔහේ ලැබෙන හැටියට ජීවත් වෙන්න. ඒ වගේ අයට තමන්ගෙ භාර්යාවයි කියල හැඟීමකුත් නෑ. වෙන කවුරුවත් ගෙනිච්චත් ගැටලුවක් නෑ. ඒ ගැන හොයන්න යන්නෙත් නෑ. හැබැයි ඒ හොඳ පැත්තට නෙවෙයි. නන්නත්තාර වෙච්ච නිසා නරක පැත්තට. මෝහය නිසාම ඒක තේරුම් ගන්න පුළුවන්කමක් නෑ. කොහේ ගියත් මෝඩය වගේ ඔහේ ඉන්නවා. නමුත් ලෝභය අධික පුද්ගලයා එහෙම නෙවෙයි. ඒ පුද්ගලය හැම වෙලේම ලෝ + අබ්බ - ලෝකයේ එල්බගෙන ඉන්නවා. ඇස, කන, දිව, නාසය, ශරීරය, මන, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම කියන ලෝකයට අයිති ආස්වාද දෙන සියලු දේවල් බදාගෙන එල්ලිලා ඉන්නවා. ඒ තමයි ඇලෙන ගතිය හෙවත් සෙම් ගතිය.

ඊළඟට ද්වේශය මුල් කරගෙන තමයි ප්‍රධාන වශයෙන්ම පිත් රෝග හටගන්නෙ. මේ පිත කියන එකත් විශේෂයෙන්ම තියෙන්නෙ, කල්ල සුක්ඛං කල්ල සුක්ඛ විපාකං කියන කළු සුදු විපාක තියෙන මේ මනුස්ස ලෝකයේ. කළු කියන්නෙ පවු පැත්ත. සුදු කියන්නෙ පිං පැත්ත. කළු සුදු කියන්නෙ මේ දෙකේ මිශ්‍රනය. මෙතනදි සුදු විපාකයෙන් මනුස්ස වෙනවා. ඒ කියන්නෙ පුණ්‍ය කර්මයක්. මොකද කවදාවත් පාප කර්මයකින් මනුස්ස ශරීරයක් ලබන්න බෑ. හැබැයි කළු විපාක කියන ඒව පරිවාර කර ගන්නවා. එතකොට කළු සුදු විපාක කියන මේ දෙකම මිනිස් උප්පත්තිය සමග බැඳෙනවා. මිනිස් උපතට ආවට පස්සෙ පරිවාර කර්ම වශයෙන් ගත්තු ලෝභ, ද්වේශ, මෝහවලින් තමයි වා, පිත්, සෙම් විසම වීමෙන් මේ මස් ලේ කයේ රෝග ඇති වෙන්නෙ.

උදාහරණ විදියට කෙනෙක් දානයක් දෙන්න සූදානම් වෙලා, මොනව හරි අඩු පාඩුවක් දැකල තරහ ගිහින් දොස් කියන්න පුළුවන්. වෙලාවට බඩු මුට්ටු ගෙනත් දුන්නෙ නෑ කියල හරි වෙනත් මොකක් හරි අඩුපාඩුවක් නිසා ද්වේශයෙන් කෙනෙකුට දොස් කියන්න, නින්දා කරන්න පුළුවන්. එතකොට ඒක පවක්, කළු විපාකයක්. ලෑස්ති වෙලා හිටපු ප්‍රධාන කාරණය දන් දීම. හැබැයි අර කළු විපාකයත් දානයට සම්බන්ධ පරිවාර කර්මයක් වෙනවා. දන් එතකොට ඒ පුද්ගලය ප්‍රධාන කුසලයකින් මනුස්සයෙක් වෙලා උපන්නත්, අර කළු විපාකය ඇඳල ඇවිත් සැඩ පරුෂ වෙනවා, කළු වෙනවා, ශරීරය ඇද කුද වෙනවා, පිත් ආබාධයන් එනවා. උපදින මනුස්සයට ඒ වගේ ගති ලක්ෂණ එනවා. ද්වේශ සහගත වුනාම පිත් කුපිත ශරීරයන් ඇතිව උපදිනවා.

පිත කියන වචනය ගත්තමත් හොඳ පැත්තෙ අර්ථ වගේම නරක ☞

පැත්තටත් අර්ථ තියෙනවා. නීල, පීත... ආදී වර්ණ ගත්තමත් හොඳ නරක කියල දෙපැත්තක් තියෙනවා. උදාහරණ විදියට **සදහම් පානයට හිත ආවොත් පා + හිත - පීත කියනවා. එතකොට ඒක නිවන් පැත්තට, සුගති පැත්තට හේතු වෙනවා. ඒ වගේම පංච කාම පානයට හිත ආවොත් ඒ අර්ථයෙනුත් පීත කියනවා. ඒක නරක පැත්තට.** උදාහරණ විදියට සෙම නරක් වෙලා හටගන්න සෙංගමාලයට කහ උණ කියල කියනවා. ඒක කහ පාටයි. ඒකත් පීත. එතකොට මෙතනදි ඇති වෙන කහ පාට තියෙන්නෙ නරක පැත්තට. ඒක රාගය උපනිශ්‍රය කරගෙන ද්වේශය නැගීමෙන් ඇතිවන විපාකයක්.

උදාහරණ විදියට වෙනත් කෙනෙකුගෙ භාර්යාවක් හෝ ස්වාමිපුරුෂයෙක් නිසා තවත් කෙනෙකුට රාග අදහස් පහළ වෙලා, ඒ තමන්ගෙ අදහස් ඉෂ්ට කරගන්න බැරි වුනාම ද්වේශයෙන් පළිගන්න පුළුවන්. ඒ වගේ විසම කාම පානයට හිත ආවම ඒකෙන් හට ගත්තු පීත තමයි නරක පැත්ත. ඒකත් කහ පාටයි. හැබැයි සදහම් පානයට හිත ආවොත් බුදු රජාණන් වහන්සේගෙ පීත ලක්ෂණය තමයි ඒකෙන් නැගෙන්නෙ. ඒකත් කහ පාටක්. නමුත් බොහොම ප්‍රියමනාප පැහැයක්. සිවුරු පැහැයෙන් පෙන්වන්නෙත් සදහම් පානයට හිත. ඒක යහපතට හේතු වෙනවා. දුක්කමත් ප්‍රියයි මනාපයි. හැබැයි අර සෙංගමාලය නිසා ඇති වන කහපාට දුක්කමත් අප්‍රියයි. එතකොට මේ දෙකටම වර්ණය සම්බන්ධයි.

ඒ වගේම පිත විස වුනාම රතු වෙනවා. ඒක තමයි රත් පිත කියන්නෙ. ඒ තවත් අර්ථයක්. ඒකෙන් ලේ ධාතුව විස කරනවා. රත් පිත විස වුනාම ලෙඩ රෝග වැඩියි. විස වුනාම රතු වීම පිතේ ස්වභාවය. සෙම් අමාරුවට වඩා ඒක අමාරුයි. ඒ වගේම පි + අත්ත - පිත්ත කියන්නෙ පිරිහුණු අත්තය. මේ තවත් අර්ථයක්. එතනදි පානය කරන අර්ථය නෙවෙයි, පිරිහුණු අර්ථය එන්නෙ. හැබැයි පානය කරන්න ගිහින් තමයි පිරිහුණේ. ඒ වගේම පහත් දේට හිතවත් අර්ථයෙනුත් පා + හිත - පීත කියනවා. මේ වගේ නිරුක්ති කිහිපයක් දෙන්නත් පුළුවන්. හැබැයි නිරුක්තිය දෙන කොට තැනට සුදුසු විදියට තමයි ගන්න ඕන. අත්ථ ධම්ම නිරුත්තාභිලාපේ ඥානං නිරුක්ති පටිසම්භිදා ඥානං කියල කිව්වෙත් තැනට සුදුසු විදියට නිරුක්ති ගන්න කියන එක. එතකොට යම් තැනකදි ඒ වචනයෙන් කියවෙන්නෙ අනර්ථයක් නම් අනර්ථයට ගැලපෙන නිරුක්තිය ගන්න ඕන. පිත්ත කිව්වමත් ඒකයි ස්වභාවය. පිරිහුණු අත්තය හෙවත් පිරිහුණු අත්බැවක ස්වභාවය තමයි පෙන්වන්නෙ. ඒ කියන්නෙ මෙතනදි එන්නෙ ද්වේශය නිසා ඇති වෙච්ච පිරිහීම. ලෝභ, ද්වේශ, මෝහ කියන මේ තුනෙන්ම පිරිහීම ඇති වෙන්න පුළුවන්.

ඒ වගේම නීල ගත්තමත් දෙපැත්තක් තියෙනවා. **ළය නිවිච්ච ලක්ෂණයෙන් (නි + ළය) නීල කියනවා.** නිවිච්ච ළයක් තිබීම රහතන් වහන්සේගෙ ලක්ෂණයක්. ඒ වගේම යමෙක් ළඟ තියෙන අනුකම්පා විරහිත ස්වභාවය නිසා හිතක් පපුවක් නැති කෙනෙක් කියල කියනවා. එතකොට **ළයක් නැති අර්ථයෙනුත් (න + ළය) නීල කියනවා.** ඒක විසයි. මේ වගේ ලෝකෙ තියෙන නිල් පාටෙත් හොඳ නරක දෙපැත්තම තියෙනවා.



එතකොට මේ වා, පිත්, සෙම් කියන 3 න් වඩාත් දඩි වෙන්නෙ පිත. ඒ කියන්නෙ ද්වේශය. පිත ඉහට ගැහුවොත් පිස්සු ඔල්මාදය හැදෙනවා. ඒ වගේම හිස තුවාල වෙලා ඉස්ම ගලනවා. පයට බැස්සොත් පය පුපුරනවා, ඉස්ම ගලනවා. ඒක ක්ෂණිකවම තමයි එන්නෙ. දැන් මේ 3 න් එකක් විතරක් නරකයි කියනව නෙවෙයි. මේ තුනම නරකයි. නමුත් නරක අතිනුත් බලවත් වෙන්නෙ පිත. මොකද ක්ෂණයකින් තමයි නැගෙන්නෙ. නැගුණට පස්සෙ හරි අමාරුයි.

ඊළඟ කාරණය තමයි ප්‍රධාන වශයෙන්ම මස් ලේ කය තියෙන සත්ව කොට්ඨාශවලට තමයි මේ වා, පිත්, සෙම්වලින් කැක්කුම්, රෝග ඇති වෙන්නෙ. ඒ නිසා තමයි වා, පිත්, සෙම් නැති තණ්හා, රතී, රගා කියන මරඟනන් ඇවිල්ලත්, මට පාද පරිචාරිකාවන් වෙන්න කියල ආරාධනා කරපු වෙලාවෙදි, ඇස් කොනකින්වත් ඒ දිහා නොබලපු මම, මේ මාගන්දිය වගේ වා, පිත්, සෙම් ගුලියක් තියෙන ස්ත්‍රියකගෙ පයින්වත් පා පහසක් ගන්නවද කියල බුදුන් වහන්සේ නිගරුවක් කළේ. (පාද පරිචාරිකා කියන්නෙ හැම තිස්සෙම ඇලිල බැඳිල පස්සෙන්ම යන ස්වභාවය. පාද පරිචාරිකාවො කියල ස්ත්‍රීන්ට කියන්නෙත් ඒකයි. ඒ කියන්නෙ, කොහෙද ගියේ? මොකද කළේ?... ආදී වශයෙන් යන හැම තැනම හොයනව, බලනවා. ඒ තමයි පාද පරිචාරිකාවෙ හැටි. ඒකත් ස්ත්‍රී ගති ලක්ෂණයක්. හැබැයි යහපත් පැත්තට පාද පරිචාරිකාවෙ යෙදෙන ස්ත්‍රීන් නැතුව නෙවෙයි. ඒ කියන්නෙ ස්වාමියගෙ ආරක්ෂාවට, යහපත් වැඩවලට ඒ වගේ පස්සෙන් යනවා. නමුත් මෙතන කිව්වෙ රාග අර්ථයෙන්.)

එතකොට වා, පිත්, සෙම් රෝග නැති දෙවඟනන් කියල දෙවඟනන්ගෙ ස්වභාවය පෙන්වා තියෙනවා. දෙවියන්ට වා, පිත්, සෙම් රෝග නැහැයි කියල පෙන්වන්න එක සාක්ෂියක් තමයි මේ. මනුස්ස වගේ මස්, ලේ කයක් සහිත කොට්ඨාශවලට තමයි මේ රෝග බොහෝ කොටම තියෙන්නෙ. වා, පිත්, සෙම් ශරීරයක් දෙවියන්ට නෑ. ''ඇසිපිය හෙළන පමණින් නොවෙති දෙවඟන'' කියල, දෙවියො ඇසිපිය ගහන්නෙත් නෑ කිව්වෙ ඒකයි. ඒ කියන්නෙ ඇසිපිය ගහන්න තරම් දාහයක් නෑ, ඇස් දැවිල්ලක් නෑ. ඒ ඇස් දැවිල්ල නැත්තෙ අර කියන පිත් විස ඒ අයට නැති නිසා.

දැන් ඊළඟට මෙතනින් වාතයට මෝහය තමයි සම්බන්ධ වෙන්නෙ. ඒක සම්බන්ධ වෙන්නෙත් තුන් ආකාරයකට. 1. ලෝභ - මෝහ 2. ද්වේශ - මෝහ 3. පූර්ණ මෝහ

මෙතනින් පූර්ණ මෝහ අවස්ථාව තමයි අර කලින් කිව්ව විදියට නන්නත්තාර වෙන්නෙ. එතකොට ලෝභයත් එක්ක මෝහය බැඳුනම එන ලෝභ - මෝහයට තමයි පවන් කිව්වෙ. දන්නෙම නැතිව ලෝභයෙන් පාපයට වැටෙනවා. ඒක සලන්න ඕන. ඊළඟට ද්වේශ - මෝහ තමයි සුලං. උලට ආහාර දෙන්නෙ ද්වේශයෙන්. ඒ තමයි ඇවිලෙන ස්වභාවය, කඩා බිඳගෙන යන ස්වභාවය. මේ විදියට පවන්, සුලං කියන 2 ඇති වෙන්නෙ ලෝභ - මෝහ, ද්වේශ - මෝහ කියන දෙකෙන්. තනිකරම මෝහ මූලික වුනාම ඒක තමයි මුලින් විස්තර කරපු වාතයේ ☞

ස්වභාවය. වැය වුනු අත කොහේ හරි යනවා. ඒ වගේ තමයි වාතය කුපිත වුනාම මොනව වෙනවද කියල දන්නෙ නෑ. ඒ තරම් මෝහය අධිකයි. නන්නත්තාර වෙලා පිස්සු වැටෙනව කියන්නෙ ඒ වගේ අවස්ථාවලට තමයි. **කු + පිත - කුපිත - ''කු'' කියන පහත් බවට පරිවර්තනය වෙනවා.** ඒ කියන්නෙ ලෝභ, ද්වේශ, මෝහ තුනෙන්ම පහත් බවට පරිවර්තනය වෙනවා. වාත කුපිත, සෙම් කුපිත, පිත් කුපිත කියන්නෙ ඒව තමයි. තුන් දොස් කිපෙනවයි කිව්වෙත් ඒකයි. මේ තුන සමනය වුනානම් ඒවායින් ඇතිවන රෝගත් ඉවරයි. රාගක්ඛයෝ නිබ්බාණං, ද්වේශක්ඛයෝ නිබ්බාණං, මෝහක්ඛයෝ නිබ්බාණං කියල රාග, ද්වේශ, මෝහ ක්‍ෂය කිරීම තමයි නිවන කිව්වෙ. ඒ තමයි ලෙඩ රෝග නැති තැන.

දැන් මේ කියන වා, පිත්, සෙම් තුන මේ හැම මනුස්සයෙකුගෙම ශරීරයේ තියෙනවා. ඒක රෝගයක් නෙවෙයි. ඒ නිසා එහෙම තිබ්බ්ච පලියට ලෙඩ රෝග හැදෙන්නෙ නෑ. ඒක කුපිත වෙන මට්ටමට ආවම තමයි ලෙඩ හැදෙන්නෙ. එතකල් ප්‍රශ්නයක් නෑ. ඒ කියන්නෙ **රෝ හෙවත් රෞද්‍ර බව අග්‍ර කරගත්තම තමයි රෝග වෙන්නෙ.** එතකොට රහතන් වහන්සේගෙ ශරීරයෙත් මේ වා, පිත්, සෙම් තියෙනවා. නමුත් ඒ තියෙන්නෙ පෙර ගොඩ නැගිච්ච විපාක කයට මිසක් අලුතින් ගොඩ නගන කර්මයකින් නෙවෙයි. ඒ විපාක ඵල දෙන කොට රහතන් වහන්සේටත් ඒ හේතුවෙන් ලෙඩ රෝග හැදෙන්න පුළුවන්. ඒ පෙර කරපු කර්මවල විපාකය. නමුත් අලුතින් කර්ම රැස් කිරීමක් නැති නිසා, තියෙන කයට රාග, ද්වේශ, මෝහ මුල් කරගෙන අධික රෝගාබාධ හැදීමක් එන්නෙ නෑ.

ඊළඟට මේ ලෝභ (සෙම), ද්වේශ (පිත), මෝහ (වාත) කියන තුන නගින බහින ආකාරයත් එකිනෙකට වෙනස්. **ලෝභය හෙමින් නැගල හෙමින් බහිනවා. සෙම රෝගත් එකපාරටම හැදෙන්නෙ නෑ. හෙමින් හැදෙන්නෙ.** කල්ගත වෙච්ච සෙම් රෝග කියන ඒවා හැදෙන්න කාලයක් යනවා. හැබැයි බහින්නත් ඒ වගේම කල් යනවා. ඒ කියන්නෙ කල් ගත වෙච්ච සෙම, පපුවෙ සෙම, සෙම් ගෙඩි වගේ ඒවට හුඟක් කල් වෙදකම් කරන්න වෙනවා. කල් ගත වෙච්ච සෙම හදිසියට අයින් කරන්න බෑ. එතකොට ඒක පෙර කරපු ලෝභ කර්මයක විපාකයක්, එහෙම නැත්නම් දැන් කරන ලෝභ කර්මයක් නිසා එන්නෙ.

ඊළඟට **ද්වේශය වේගයෙන් නැගෙනවා. ඒ වගේම එක පාරටම වේගයෙන් බහිනවා.** ඒ තමයි ද්වේශයේ හැටි. අපි කියනව ක්‍ෂණික කෝපය කියල. ඒ වගේ ක්‍ෂණික කෝපය ආවම කෙනෙක් ඉතා සුළු වෙලාවකදි මහ විනාසයක් කරන්න පුළුවන්. හැබැයි තත්පර ගණනින්, විනාඩි ගණනින් ඒ ස්වභාවය ඉවත් වෙනවා. එතකොට ඒ පුද්ගලයම සමහරවිට කියනව, තමන්ට මොනව වුණාද කියල හිතාගන්නත් බෑ කියල. ඒ කියන්නෙ අර ද්වේශය ක්‍ෂණයකින් නැගල ක්‍ෂණයකින් බැහැල ගිහින්. ඒ තමයි ද්වේශයේ හැටි. පිත් රෝගත් මේ වගේ. එතකොට මේකෙන් එන රෝගත් පෙර කරපු ද්වේශ කර්මයක විපාකයක්, එහෙම නැත්නම් දැන් කරන ද්වේශ කර්මයක් නිසා එන්නෙ.

ඊළඟට **මෝහය ගත්තොත් වේගයෙන් නැගල හෙමින් බහිනවා.** ඒ කියන්නෙ මෝහය කියන එක ලේසියෙන් නැතිවෙන්නෙ නෑ. හැබැයි නැගෙන්නෙ එක පාරටම. උදාහරණ විදියට එක පාරටම කෙනෙක්ගෙ තියෙන මොකක් හරි බඩු මුට්ටුවක් කැඩිල බිඳිල විනාශ වුනොත්, ඒ පුද්ගලයා මෝහාධිකයෙක් නම්, ඒකට දැඩිව බැඳිල හිටපු නිසා, අනේ මට වෙච්ච දෙයක් කියල මහා කම්පනයක් එක පාරටම එන්න පුළුවන්. එහෙම ආවට පස්සෙ ඒක ලේසියෙන් යන්නෙ නෑ. තමන්ට පාඩුවක් එක පාරටම එනකොට ඒ පුද්ගලයා ඒ වස්තුවට බැඳිල තිබ්බ්ච දැඩි බලාපොරොත්තුව නිසා, එක පාරටම හදවතේ පීඩනයක් එනවා. පීඩනයක් කියන්නෙ වායුවක්. එතකොට පෙර විපාක වශයෙනුත්, දැන් කෙරෙන කර්ම වශයෙනුත් ඒක හැදෙනවා. මේ වගේ වාත අමාරුවත් ඉක්මනට හැදෙනවා. නමුත් ඒක බහින්නෙ, අඩු වෙන්නෙ හෙමින්.

දැන් මේ විදියට ලෝභ, ද්වේශ, මෝහ කියන ලක්‍ෂණ 3 ම, මේවා කුපිත වීමෙන් ඇතිවන ඒ ඒ ලෙඩ රෝගවලුත් තියෙනවා. රහතන් වහන්සේටත් පෙර කර්ම විපාක වශයෙන් ලෝභ, ද්වේශ, මෝහ තුනෙන් ලෙඩ රෝග එනවා. නමුත් අලුත් ඒව නෑ. හැබැයි සාමාන්‍ය උදවියට පෙර විපාකවලින් වගේම දැන් කෙරෙන කර්මවල විපාක වශයෙනුත් ලෙඩ රෝග එනවා. මේ නිසා රහතන් වහන්සේට රෝග අඩුයි. හේතුව දැන් ලෝභ, ද්වේශ, මෝහ එක්ක සම්බන්ධ නොවීම. නමුත් සාමාන්‍ය අයට පෙර විපාක සහ දැන් තියෙන ලෝභ, ද්වේශ, මෝහවල විපාක නිසා ලෙඩ රෝග වැඩියි.

*වෑරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නිතිඥ චන්දන සිරිවර්ධන**

# කොක් සංඛාරයේ හැටි....







**උපාසක වෙසින් සුදු ඇඳගෙන යනවා**
**ගිහින් හැම තැනම එක දාගෙන එනවා**
**එම සංකරය මුල් වී කය හිමි වෙනවා**
**සුදු පාටින් කොකුන් මේ ලෙස බිහි වෙනවා**

**පැවිදි වෙසින් කහ ඇඳගෙන දුව යන්නෝ**
**ගිහින් හැම තැනම එක දාගෙන එන්නෝ**
**එම අය හට මෙලෙස ගති කය හිමි වෙන්නෝ**
**හොට කහ පැහැ කොකුන් ඉපදෙනවා මෙන්නෝ**

පබැඳුම: **මුරුතමුරේ ධම්මින්ද හිමි**

# කොස්වලින් රුධිර පීඩනය, දියවැඩියාව, බඩේ අජීර්ණය, අංශභාගය ඇතුලු රෝග ගණනාවකට ප්‍රතිකර්ම...

රුධිර පීඩනය සහ දියවැඩියාව පාලනයටත්, බඩේ අජීර්ණය, අංශ භාගය ඇතුලු රෝග ගණනාවකටත් පහසුවෙන් සකස් කර ගන්න පුළුවන් ඉතා ප්‍රත්‍යක්ෂ ඖෂධ කිහිපයක් තමයි මේ හෙළිදරව් කරන්නෙ. මේ ඖෂධත් මීට කලකට පෙර වහරක අභයරතනාලංකාර හිමියන් සමාධියෙන් දැකපු, අත්දැකීම් සහිත ඖෂධ කිහිපයක්. කොස් ගහ මුල් කරගෙන හට ගන්න වරක ගහෙන් ලබා ගන්න මේ ඖෂධ ගැන දැනගන්න පෙර කොස්, වැල, වරක ආදී අපේ පැරණි ස්වභාවික ආහාරවල අපි නොදන්න ධර්මානුකූල පැත්ත දැන ගැනීමත් වැදගත්.

ඉස්සර හිටපු මනුස්සයින්ට තවත් කෙනෙක්ගෙ දුකක් කරදරයක් දැකල පපුව උණුවෙන, පපුව හෝස් ගාන ගති ලක්ෂණයක් තිබුනා. ඒක අනුකම්පා සහගත හොඳ ගති ලක්ෂණයක්. නමුත් කාලයක් යනකොට මනුස්සයින් තණ්හාවෙන්, ආසාවෙන් ලෝකය බදාගන්න ගිහින්, අර කියපු හෝස් ගාන ගති ලක්ෂණය ගිලිහිලා ගියා, දුරස් වෙලා ගියා. ඒ විදියට **හෝස් ගාන ගති ලක්ෂණය ගිලිහුනාම, දැන් කෝ හෝස් කියල අහන්න ගත්තා. කෝ හෝස් කියන ගති ලක්ෂණයෙ තිබ්බ්ච ශක්තිය තමයි කොස් විදියට ශාකයක තැන්පත් වුණේ.** ඒ වගේම මේ හෝස් ගාන ගතිය එඩිතර ගතියක්. ඒ කියන්නෙ කෙනෙක් කරදරයකට පත්වෙනකොට පැනල උදව් උපකාර කරන ගතියක්. එතකොට එතෙන වැලක් වගේ ඉඳල ඒක කරන්න බෑ. ඒකට කෙලින් තියෙන ගති ස්වභාවයක් තියෙන්න ඕන. ඒ නිසා මේ කොස් කියන එකත් කෙලින් තියෙන ගහක් විදියට තමයි පිහිටියේ. මේ තමයි කොස් ගහ හැදෙන්න මුල් වෙච්ච හේතුව.

හැබැයි ඕක පොත්වල පෙන්නල නෑ. ද්‍රව්‍ය පදාර්ථ ඥානයට අහුවෙන දෙයක්. එදා හිටපු ඍෂිවරුත් මේ කාරණය දැක්කා. ඒ කියන්නෙ යම් කිසි ද්‍රව්‍යයක් හැදිච්ච පදයකට අර්ථයක් තියෙනවා. ඒ අර්ථය බැලුවම ඒක තමයි පද නිරුක්තිය කියන්නෙ. ඒක දකින ඥානය තමයි ද්‍රව්‍ය පදාර්ථ ඥානය කියන්නෙ. ඒකෙන් හොයාගන්න පුළුවන්, ඒ ද්‍රව්‍ය පදාර්ථය හැදෙන්න මුල් වෙච්ච හේතුව. මේ කාරණය දැකපු ඍෂිවරු තමයි විවිධ ලෙඩ රෝගවලට බෙහෙත් ලෝකයට හඳුන්වා



දුන්නෙ. ඒ ඥානය පහළ වුනාම ගහේ විවිධ කොටස් හඳුන්වන පද නිරුක්ති දකිනවා. කොස් කියන්නෙ මොකක්ද? වැල, වරක කියන්නෙ මොකක්ද? නැට්ට කියන්නෙ මොකක්ද?... මේ ආදී වශයෙන් ඒ ඒ අංගවල අර්ථයන් දකිනවා.

දැන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, කොස් හැදිච්ච හැටි පද නිරුක්තියෙන් ඔය විදියට දෙන්න පුළුවන් නම්, හෙරළි කියන වචනය කොස්වලට ආවෙ කොහොමද කියල. මෙතනදි මේ කොස් කියන වචනය කොස් ගහ පහළ වෙච්ච ආදී මුල් කාලයේ ඉඳලම තිබ්බ්ච වචනයක්. ඒක තමයි කොස්වලට තිබ්බ්ච මුල්ම වචනය. නමුත් ඒ කාලෙ මිනිස්සු කොස් තිබුනට කෑවෙ නෑ. උයල කෑමට ගන්න හැටි දැනගෙන හිටියෙ නෑ. ගෙඩි ඉදිල වැටුනම ඒක අහුලගෙන කනව මිසක්, කඩා ගෙන තම්බගෙන කන බවක් දැන ගෙන හිටියෙ නෑ. එහෙම කාලයක් තිබුණා.

මේ ආරංචිය සක්‍ර දෙවියන්ටත් ගියා. ඉතින් සක්‍ර දෙවියො දවසක් මහළු බමුණෙක්ගෙ වෙසක් මවාගෙන බැමිණියක් ඉන්න සාමාන්‍ය ගෙදරකට ඇවිත්, කන්න මොනව හරි දෙයක් ඉල්ලුවා. ඉල්ලුවට කන්න උයන්න දෙයක් නෑ කියල ඒ බැමිණිය කිව්වා. එතකොට ඒ මහළු බමුණා, අර තියෙන්නෙ ඕන තරම්, ඇයි උයන්න දෙයක් නෑ කියන්නෙ කියල, ළඟ තිබ්බ්ච කොස් ගහක කොස් ගෙඩියක් පෙන්නුවා. ඕව කන්න පුළුවන් දෙයක්ද කියල පුදුම වෙලා ඒ බැමිණිය අහන කොට, අන්න අර ගෙඩිය කඩල මදුළු ටික ගලවල තම්බන්න කියල මේ මහළු බමුණා, ඒක කන්න ගන්න හැටිත් කියල දුන්නා. දැන් මේක තැම්බෙන කොට සුවඳ ඉවසන්න බැරිව, අර බැමිණිය හොරෙන් වටපිට බලල, මහළු බමුණාට දෙන්නත් ඉස්සෙල්ල කෑවා. එතකොට ඒ බමුණා ඒක දැකල ළඟට ඇවිත්, හෙර ළිය කෑව නේද කියල අර හොරෙන් කාපු ගති ලක්ෂණය කියල යන්න ගියා. ඉතින් ගෙදර මනුස්සයා ආවම මේ බැමිණිය, මහළු බමුණෙක් ඇවිත් අනේ මට හෙර ළිය කියල යන්න ගියා කියල අර කථාව කිව්වා. උඹ හොරෙන් කෑව නේද කියල ඒ මනුස්සයත්, අර තම්බපු කොස් ටික දැකල, හෙර ළියම තමයි බං මේව නම් කන්න හොඳ ජාතියක් කියල කන්න ගත්තා. එදායින් පස්සෙ තමයි මේක මිනිස්සු අතර ව්‍යාප්ත වුනේ. එතකොට හෙරළි කියන වචනෙ හැදුනෙත් ඊට පස්සෙ.

☞

ඊළඟට මේ කොස් වර්ගත් දෙකක් තියෙනවා. වැල, වරක කියන්නෙ ඒ දෙක. ඒ කියන්නෙ අර හොස් ගාන ගති ලක්ෂණය තිබ්ච්ච මුල් කාලෙ, කෙනෙක්ගෙ දුකක් කරදරයක් දැකල වැළපෙන ගති ස්වභාවයක් තිබුනා. ඒකත් කාලයක් යනකොට අර විදියටම ගිලිහිලා ගිහින්, අන්තිමට මනුස්සයෙකුට දුකක් කරදරයක් වුනාමත් වැළපෙන්නෙ නැතිව හිටියා, හදවත උණුවෙන්නෙ නැතිව ගියා. අනේ අප්පේ මේ මනුස්සයට වෙච්ච දෙයක්!... මේ ආදී වශයෙන් එන හැඟීම් නැති වෙලා ගිහින්, තමන් තනියෙන් ආත්මාර්ථයෙන් ගොඩ ගහගත්තා. එතකොට ඒ **වැළපෙන ගති ලක්ෂණයේ තිබ්ච්ච ශක්තිය, ගුණය ශරීරයෙන් පිටවෙලා ගිහින් වැල විදියට තැන්පත් වුනා.** ඒ තමයි කොස්වලින් වැල හැදිච්ච හැටි. එතකොට මොන දේටත් නිතර වැළපෙන ගති ලක්ෂණය තියෙන සමහර උදවිය ඉන්නවා. ඉතින් මේ කොස්වලින් එන වැල ආහාරයක් විදියට ගත්තම, අර ගිලිහිලා ගියපු ශක්තිය ශරීරයට ඇවිත් වැළපීම මුල් කරගෙන හට ගන්න රෝග ලක්ෂණ අඩු වෙන්න හේතු වෙනවා.

ඉස්සර වැළපෙනවා කිව්වෙ අනුන්ගෙ දුකේදි වැළපීම. නමුත් දැන් එහෙම නෙවෙයි. අනුන්ට දුකක් දුන්නම ඒ දුන්න මිනිහත් අන්තිමට කරගන්න දෙයක් නැතිව වැළපෙනවා. ඊළඟට ඒක සෝකයක් බවට පත් වෙනවා. ඒ කියන්නෙ අනුන්ගෙ දුකේදි වැළපෙන ගතිය ගිලිහිලා ගිහින්, ඒක තැන්පත් වුනාට පස්සෙ, දැන් කවුරුවත් වැළපෙන්නෙ නැතිව ''අනේ කවුරුවත් උදව් කරන්න නැනෙ, මං මෙච්චර දහ දුක් විඳිනව, කවුරුවත් මං දිහා බලන්නෙ නැනෙ, අයියෝ මට වෙච්ච දෙයක්....'' ආදී වශයෙන් කියල තමන්ට තමන්ම සෝක කරන්න පටන් ගත්තා. දැන් ඒ සෝක වීම දැකලත්, ඕකට හෙණ ගැහිල ගියත් කමක් නෑ කියල මිනිස්සු සෝක නොකර ඉන්න පටන් ගත්තා. ඒ කියන්නෙ අන්තිමට සෝක වෙන කෙනා කෙරෙහි අනිත් අය සෝක නොකර හිටියා. අර කලින් තිබ්ච්ච වැළපෙන්නෙ නැති ගතිය දැන් තවත් දරුණු වෙලා. අර වගේ විඳින දුක දැකලත් මිනිස්සු දැන් ඒ දිහා බලන්නෙ නෑ. ඒක හුඟක් දරුණු තත්වයක්. නමුත් කලින් එහෙම නෑ. නැති බැරි මිනිහෙකුට දුකක් කරදරයක් ආවම, ඇත්ත වශයෙන්ම කවුරුවත් නැද්ද මේ මනුස්සයට පිහිට වෙන්න කියල තමන්ගෙත් හිතේ සෝකයක් හටගත්තා. නමුත් ඊට පස්සෙ ඒකත් නැති වෙලා ගියා. කොච්චර අඳෝනා නැඟුවත් පැත්ත බලන්නෙ නැතිව ගියා. **දයානුකම්පාවෙන්, අනුන්ගෙ දුකේදි සෝක වෙන ගතිය ගිලිහිලා ගියා. එතකොට ඒ ගුණය ගිලිහිලා ගිහින් සෝක නොකරන නිසා, අසෝක කියල ගහක් හැදිල ඒ ගහේ තැන්පත් වුණා.**

මෙතනදි වැළපීම සහ සෝක කිරීම කියන්නෙ කාරණා 2 ක්. කෙනෙක් වැළපෙන කොට තමන්ට කවුරුහරි පිහිටක් වෙයි කියල බලාපොරොත්තුවක් ඇති වෙනවා. ඒ නිසා තමයි කොච්චරවත් අඬ අඬා තමන්ගෙ දුක කියන්නෙ. වැලක





ස්වභාවයත් එහෙමයි. ඒ කියන්නෙ පිහිටට මොකක හරි එතෙන්න බලනවා. **වැලක ස්වභාවය පෙන්වීම තමයි වැළපීම කියන්නෙ.**

මේකෙත් අවස්ථා 2 ක් තියෙනවා. එකක් තමයි තමන්ට පෞද්ගලිකව පිහිටක් ගන්න බලාපොරොත්තුවෙන් වැළපීම. ඒක තමයි අන්තිමට සෝකයක් බවට පත්වෙන්නෙ. අනෙක දයානුකම්පාව නිසා අනුන්ට පිහිට වෙන්න ගිහින් උදව් ඉල්ලා වැළපීම. එහෙම අනුන්ට පිහිට වෙන බලාපොරොත්තුවෙන් කරන වැළපීමේ එක් අවස්ථාවක් තමයි වැළඳගැනීම. ඒ කියන්නෙ මේ අද වගේ නිකං බදාගන්න එක නෙවෙයි. වැල ඇඳගන්නවා. වැලක් එතෙනව වගේ පිහිට වෙනවා. වැලක ස්වභාවය තමයි වැළඳගැනීමටත් තියෙන්නෙ. ඊළඟට එහෙම වැළපිලත් කවුරුවත් පිහිට වෙන්නෙ නැති වුනාම, **තමන්ට තිබ්ච්ච සුවය ක්ෂය වෙලා ගියාම ඊළඟට සෝක කරනවා. ඒක වැළපීම ඉක්මවා යනවා.** දැන් ඉතින් කාටවත් කිව්වයි කියල පිහිටක් ගන්න බෑ. කිව්වට වැඩකුත් නෑ. ඉතින් ඇහුවත් කියන්නෙ නෑ. ලොක්කා සොක්කා වුනයි කියල මිනිස්සු අතර කතාවකුත් තියෙනවා. ඒ කියන්නෙ ලොකුකමින් බැහැල අන්තිමට පල්ලෙහාට ගිහින් සුවය ක්ෂය වුනයි කියන එක. සුවය ක්ෂය වුනාම එන සෝකයත් ඒ වගේ. ''සෝකයට බටුයෙහිද? මුදලක් පැරදුනෙහිද? උදව් කරන්න කෙනෙක් නැද්ද? ඇයි මේ කතා නොකර ඉන්නෙ? ඇයි මේ හුදෙකලාව ඉන්නෙ...?'' මේ ආදී වශයෙන් බුදුන් වහන්සේ අරිහත් ඵල සමාධියෙන් හුදෙකලාව ඉන්න කොටත්, ඒක තෝර ගන්න බැරිව මරඟනන් ඇවිත් බුදුන් වහන්සේගෙන් මේ විදියට ඇහුවෙත්, සෝකයේ ලක්ෂණත් ඒ වගේ නිසා. එතකොට මරඟනන් හිතුවෙ උන් වහන්සේට මොකක් හරි කරදරයක් වෙලා සෝකයට පත් වෙලා එහෙම ඉන්නව කියල.

ඒ වගේම අසෝක කිව්වමත් දෙපැත්තක් තියෙනවා. කෙනෙකුගෙ කරදරයකදි සෝක වෙන්නෙ නැති නරක පැත්ත එකක්. ඒ කියන්නෙ, ඕකට හෙණ ගැහිල ගියත් කමක් නෑ, මං මගේ වැඩේ කරගන්නවා කියන අදහසින් තණ්හාව නිසා ගොඩ වඩාගන්න සෝක නොකිරීම. අනෙක අසෝකං විරජං ඛේමං කියල හඳුන්වන, නිවන් දැක්ක කෙනෙක්ගෙ සෝක නොකිරීම. ඒක හොඳ පැත්ත. ඒ යථාවබෝධය ලැබිච්ච නිසා. එතකොට අර කියපු නරක අදහස් නිසා, කලින් තිබිල පිටවෙච්ච හොඳ ශක්තිය තමයි ලෝකෙ අසෝක කියන ගස් වර්ගය හටගන්න හේතු වුනේ. එතකොට ඒකෙන් කර්ම විපාක විදියට ඇතිවෙන රෝගාබාධවලට අසෝක බෙහෙතක් වෙනවා. ඒ නිසා මේ අසෝක ගහේ, දියවැඩියාව වගේ අමාරුකම්වලට තවත් බෙහෙතක් තියෙනවා. මොකද දියවැඩියාව කියන්නෙ ලෝකෙ වැඩියෙන් බදාගන්න, ගොඩ ගහගන්න ගිහින් ඇති වෙච්ච කර්ම විපාකයක්. මේ කාරණය දැන් දන්නෙ නැති වුනත් අසෝක ගහේ මල්, පොතු ආදී කොටස් දනටත් ඒ වගේ බෙහෙත්වලට යොදා ගන්නෙ මේ හේතුව නිසා.

ඊළඟට කවුරුවත් උදව් ☞

කරන්නෙ නෑ කියල සෝක කරන කොට, පලයල්ලකො ගිහින් උදව් කරපල්ල කියල වැඩිහිටි අය අණ දෙන්න පටන් ගත්තා. එතකොට ගිහින් උදව් කරන්න පටන් ගත්තා. එහෙම ගුණයක්වත් එදා තිබුණා. නමුත් තවත් කාලයක් යනකොට අණ දුන්නත් ගණන් ගන්නෙ නැතිව හිටියා. ''අණ දෙන එකත් වදයක්නෙ! මොකක්ද මේ අපිට දෙන වදේ?'' ඊළඟට මෙහෙම කියන්න පටන් ගත්තා. ඒ නිසා **වදෙන් දීපු අණත් ඊළඟට නැති වෙලා ගියා. ඒ නිසා ඒකට හිමි ශක්තිය පිටවෙලා ගිහින් ඒක අණවද - අනෝදා කියල තැන්පත් වුණා.** අද මේ කාරණය දන්නෙ නැති වුනත්, අනෝදා කියන්නෙ දියවැඩියාවටත් හොඳ බේතක්.

සේවිකාවන්ට එහෙම කළා වෙන්නත් පුළුවන්. මොකද ඉස්සර ඉඳන් තිබිච්ච බෙදා හදාගෙන කෑමේ ගතිය නැති වෙලා ගෙවල් දොරවල්වල හිටපු වහල්ලුන්ට, සේවකයින්ට ලුණු කුඩුයි බතුයි කන්න දීපු කාලයක් තිබුණා. ඉතින් ලුණු කුඩුයි බතුයි කියන්නෙ කන්න පුළුවන් දෙයක් නෙවෙයි, කරන්න දෙයක් නැතිකමට කන දෙයක්. විශේෂයෙන් ඉස්සර හිටපු සමහර රජවරු, සිටුවරු තමන්ගෙ දාසියන්ට කන්න දුන්නෙ නෑ. හොඳ ආහාර කන්න දුන්නෙ නෑ. මොනව හරි අහක යන දෙයක් ආවට ගියාට තමයි කන්න දුන්නෙ. ඒක පාපයක්. ඒය අය දන්නෙ නැති වුනාට ඒකෙ විපාකය කවද හරි ගෙවන්න වෙනවා. විපාකය විදියට අර වගේ ලෙඩ කවදහරි **වෙලා ගියා. එතකොට ඒ ශක්තිය තමයි පිට වෙලා ගිහින් ලුණුවිල ශාකයේ තැන්පත් වුණේ.** නමුත් ඉතින් කරගන්න දෙයක් නැතිකමට, දාහයෙන් කැකෑරෙන ගතියෙන් තමයි ඒ ආහාර ගත්තෙ. එපා කියන්නෙත් නෑ, හා කියන්නෙත් නෑ. කැමැත්තෙන් නෙවෙයි භාර ගත්තෙ. හිතේ තරහ, දැඩි ගතිය කැකෑරුණාට පිට කරන්න බයයි, නැගී සිටින්න තරම් ශක්තියක් නෑ. මේ නිසා වැලටත් නැති, ගහටත් නැති ස්වභාවයක් ලුණුවිල ශාකයට ආවා. ඒ පිහිටපු ශක්තිය නිසා රුධිර පීඩනයට, අම්ල පිත්ත ප්‍රධාහයට (ගැස්ට්‍රයිටිස්) මේ ලුණුවිල හොඳ ඖෂධයක් වෙනවා. ලුණුවිල තම්බල බීමට හෝ ව්‍යංජනයක් විදිහට කන්න ගන්න පුළුවන්.

ඒ වගේම කොස්වල අනෙක් වර්ගය තමයි වරක කියන්නෙ. ඉස්සර මිනිස්සු ළඟ තිබිච්ච ගති ගුණයක් තමයි, මොනව හරි ආහාරයක් ගන්න කොට හැමෝටම බෙදල දීල කන එක. හතුරු වෙලා, තරහ වෙලා හිටියත් කෑම කන වෙලාවට ඒ හතුරු කම්, තරහ මරහ තියා ගත්තෙ නෑ. ඒ වෙලාවට හතුරට වුනත් වරෙන් වරෙන් කාපං කියන ගති ලක්‍ෂණයක් තිබුණා. ඒක යහපත් ගති ලක්ෂණයක්. නමුත් පස්සෙ කාලෙක ඒ ගති ලක්ෂණයත් මිනිස්සුන්ගෙන් ගිලිහිලා ගියා. ඒ විදියට **වරෙන් කාපං කියන ගති ලක්ෂණයේ තිබිච්ච ශක්තිය පිටවෙලා ගිහින් තමයි වරක විදියට කොස් ගහේ තැන්පත් වුනේ.** වරක කියන ද්‍රව්‍ය පදාර්ථයට තියෙන පද නිරුක්තිය තමයි මේ.

මේ විදියට බෙහෙත් හොයන්න, යමක් හටගන්න මුල් වෙච්ච හේතුව බලන්න ඕන. ඒකෙන් තමයි ඒ ගිලිහිච්ච ගති ලක්ෂණය අල්ල ගෙන ඒකට අදාළ බෙහෙත හොයාගන්නෙ. එතකොට මනුස්සයින්ගෙ යම්කිසි හොඳ ගති ගුණයක් තිබිල පස්සෙ කාලෙක ඒක ගිලිහිලා ගියාම, ඒ ගුණය නිසා ලැබිච්ච රැකවරණයක් තිබුණානම් දැන් ඒක නැතිවෙලා යනවා. ඊට පස්සෙ ඒක රෝගයක් බවට පත්වෙනවා. ඊළඟට ඒක විසබීජයකින් හරි වෙනත් ක්‍රමයකින් හරි සසර කර්ම වේගයක් ආවම ඇදිල එනවා. දියවැඩියාව, රුධිර පීඩනය කියන්නෙත් ඒ වගේ සසරෙ ආපු කර්ම වේගයක්. එක්කො අනුන්ට කන්න දෙන්නෙ නැතිව ඒ අයව පීඩනයට පත් කරල, තමන් තනියෙන් ගොඩගහගෙන කාපු අවස්ථාවක් වෙන්න පුළුවන්. ගුණ වඩපු උතුමන්, දෙමව්පිය, ගුරුවරුන් වගේ වැදගත් අයට එහෙම නොදී කෑව වෙන්නත් පුළුවන්. එහෙම නැත්නම් තමන් ළඟ වැඩ කරපු සේවක



හැදෙනවා. ඒකට විපාකය විදියට තමන්ටත් ප්‍රිය මනාපෙට කන්න බැරි වෙන්න සීනි, ලුණු නැතිව කන්න බොන්න සිද්ධ වෙන රෝගයක් එනවා. දියවැඩියාව, රුධිර පීඩනය හැදුනමත් මොකවත් ප්‍රියමනාප දෙයක් තමන්ගෙ හිතේ හැටියට කන්න බොන්න බෑ. හැම පැත්තෙන්ම පාලනය වෙන්න සිද්ධ වෙනවා. මේ තමයි ඒ කර්ම වේගයට විපාක විදියට එන රෝගවල හැටි.

හැබැයි මේ විදියට ලුණු කුඩුයි, බතුයි කන්න දෙන්න ඉස්සෙල්ල, එහෙම කන්න දෙන්න එපා කියල අදහසක් තිබුණා. ඒ කියන්නෙ මුල් කාලයේ. ඒ නිසා මුල්ම කාලවල වැඩ කරපු දාසි දස්සන්ට වුනත් එහෙම ලුණු කුඩුයි බතුයි කන්න දුන්නෙ නැතිව හොඳට කන්න දුන්නා. නමුත් තවත් කාලයක් ගිහින් **ලුණු කුඩුයි, බතුයි දෙන්න ගත්තම ආහාර වේල ලුණු**

ඊළඟට තව ටික කාලයක් යන කොට, ඒ දාසි දස්සන් ලුණු වෙච්ච ආහාර ප්‍රතික්ෂේප කරල නැගී සිටින්න පටන් ගත්තා. ඒ කියන්නෙ **දැඩිව ලුණු වරය නසන්න පටන් ගත්තා. එතකොට ඒ ශක්තිය ගිහින් ලුණුවරණ කියල ශාකයක් හැදිල ඒකෙ තැන්පත් වුනා.** දැඩි ගතිය නිසා ඒක ගහක් වුණා. මේ කාරණය දන්නෙ නැති වුනත් අදත් කායික තැල්මට ඉතා හොඳ ඖෂධයක් තමයි මේ ලුණුවරණ. ඒ කියන්නෙ එදා ලුණු වරය නසන්න නැගී සිටින කොට ලොකු සටනක් දීල ගුටි කාල, අතපය තලාගෙන තමයි ඒක කරන්න වුනේ. ඒ නිසා තමයි මේ ලුණුවරණ ශාකය තැල්මට ඖෂධයක් වෙන්නෙ. ලුණුවරණ ගහේ පොත්ත තලල ලුණු බිංදු කීපයකුත් එකතු කරල තැල්ම තියෙන තැන බැන්දම සනීප වෙනවා.

එතකොට වරක කියන්නෙ අනිත් මිනිස්සුන්ටත් අඬ ගහල කන්න දීපු ගති ලක්ෂණයක්. එහෙම අයට අර වගේ රෝගයක් හැදෙන්න විදියක් නෑ. නමුත් ඒ ශක්තිය පිටවෙලා ගිහින් තමයි වරක කියල තැන්පත් වුනේ. එදා තිබිච්ච ඒ හොඳ ගති ලක්ෂණයට අදාල ශක්තියේ කොටසක් තමයි නෂ්ටාවශේෂ කියල දැන් වරක ගහේ කොළවල නැට්ටෙ පිහිටන්නෙ. නෂ්ටාවශේෂ හෙවත් නැට්ට කිව්වෙ ඉතිරි කොටස. මිනිස්සු ළඟ තිබිච්ච අර කියපු ගුණයේ නෂ්ටාවශේෂයත් නැති වුනාම ඒක රෝගයක් බවට පත්වෙනවා. එතකොට ඒ ශක්තිය ගිහින් නැට්ටෙ තැන්පත් වෙනවා. හොඳ නරක දෙකම තැන්පත් වෙන්නෙ මේ විදියට. ඉස්සෙල්ලම හොඳ ගති ලක්ෂණ තමයි විශ්වයට විහිදුනේ, දුරස් වුනේ. ඒක තමයි ශාකවල තැන්පත් වුනේ. එතකොට ඒව දැන් ශරීරයේ නෑ. මිනිස්සුන්ගෙ ඒ ශක්තිය අඩු වුනාට පස්සෙ ශරීර දුර්වල වෙනවා. හැබැයි

කොළේ නැට්ටෙ ඒ ශක්තියෙන් කොටසක් තැන්පත් වෙලා තියෙනවා.

දැන් මේ රෝගයට ප්‍රතිකර්ම විදියට ප්‍රයෝග සම්පත්තියක් වශයෙන් අර ගිලිහිච්ච ශක්තිය ආපසු ශරීරයට දෙනවා. එහෙම දෙනකල් හොඳයි. නැවතත් රෝගය උත්සන්න වෙනකොට නැවතත් දෙන්න වෙනවා. දැන් එතකොට මේකට ගන්නෙ වරක ගහේ ඉදිච්ච කොළ බිම වැටුනට පස්සෙ, අඟල් භාගයක් විතර කොළේ ගහට සම්බන්ධ වෙන නැට්ට කොටස. හැබැයි වැටිච්ච කොළ විතරයි ගන්නෙ. ගහෙන් කඩල ගන්නෙ නෑ. මොකද ගහෙන් කඩන කොළේ කොහොල්ලෑ තියෙනවා. කොළේ ඉදුණම ඒ කොහොල්ලෑ ගහට උරාගන්නවා. ගහට උරාගෙන ඒ ඉදිච්ච කොළේ විතරයි බිමට වැටෙන්නෙ. බිම වැටිච්ච කොළේ නැට්ටෙ තමයි බේතට අවශ්‍ය ඖෂධ කොටස තියෙන්නෙ. දැන් මේ වගේ ඉදිල වැටිච්ච කොළවල තියෙන අග නැටි කොටස් ටික කඩා ගන්නවා. ඒක හෝදල පිරිසිදු කරල, ටිකක් තෙත මාත්තු කරල, මී පැණි ටිකක් එක්ක අඹරනවා. මී පැණි හුඟක් දාන්නෙ නෑ. ගුලි කරන්න පුළුවන් ගානට දම්මම ප්‍රමාණවත්. මොකද නැට්ටෙත් තෙතමනය ටිකක් තියෙන නිසා. දැන් මේක අඹරල කෝපි ඇටයක් පමණ ප්‍රමාණයට ගුලි හදනවා. ඒ හදපු ගුලි ස්වභාවික අව්වෙ වේල ගන්නවා. කෘත්‍රිමව රත් කරන්නෙ, ගින්නෙ තියන්නෙ නෑ. මොකද මී පැණි යොදා ගන්න කොට අවු රශ්මියට වඩා රත් කරන්න හොඳ නෑ. මී පැණි තියෙද්දි ගන්න වැඩිම රස්නය තමයි අවු රශ්මිය.

දැන් මේ විදියට වේළල අරගෙන උදේ, දවල්, රෑට කෑමට පස්සෙ ගුලි එක බැගින් ගන්නවා. මේක රුධිර පීඩනයයි, දියවැඩියාවයි දෙකම පාලනයට හොඳ ප්‍රත්‍යක්ෂ බෙහෙතක්. හරියටම මෙච්චර කාලයක් ගන්න ඕන කියලත් නෑ. සාමාන්‍යයෙන් මාස එක හමාරක් විතර ගත්තම ප්‍රමාණවත්. පුද්ගලයගෙ කර්ම බලවේගය අනුව ඒකත් වෙනස් වෙන්න පුළුවන්. කර්ම විපාකය ගෙවෙන කාලයක් ආවොත් නිට්ටාවටම සනීප වෙන්නත් පුළුවන්. එහෙම නැත්නම් බේත ගන්නකල් පාලනය වෙලා තියෙනවා. ඒ නිසා අතරින් පතර ගන්නත් පුළුවන්. මොකද මේ කොස් කොළ නැටි කියන්නෙ හොයා ගන්න බැරි දෙයක්වත්, මුදල් වියදම් වෙන දෙයක්වත් නෙවෙයි. නිකන් අපතෙ යන්න ඕන තරම් තියෙනවා. ඒ නිසා පහසුවෙන් හොයාගන්න පුළුවන්. අතුරු ආබාධත් නෑ. වියදමකුත් නෑ. වැඩි මහන්සියකුත් නෑ. මේක සම්පූර්ණයෙන්ම ඖෂධීය ශක්තියක්. මොනම බෙහෙතකටවත් විස වෙන දෙයක් නෙවෙයි.

ඒ වගේම පැහිච්ච කොස් ගෙඩියෙන්, මේ වගේම තවත් බෙහෙතක් හදාගන්න පුළුවන්. ඒකට යොදා ගන්නෙත් වරක කොස් ගහක ගෙඩි. කොස් ගෙඩිය පලල මදුළු ටික ගලවල ඉවත් කළාම, ඉතිරි වෙන සුදු කොස් ඉරි ටිකත් කපල ඉවත් කරනවා. ඊට පස්සෙ පිට කටුවත් අයින් කළාම ඒ අතර සුදු මසක් තියෙනවා. හරියටම කියනවනම්, පිට කොස් කට්ට රැහැල අයින් කළාම ඊළඟට තියෙන සුදු මස් කොටස. දැන් මේ කොටස අරගෙන පුංචි තීරුවලට කපල අවු රශ්මියෙන් වේල ගන්නවා. ඊළඟට කබලෙ දාල රන් වන් පාට වෙනකල් බදිනවා. බැදල කුඩු කරගන්නවා. දැන් උණු වතුරෙන් තම්බල සීනි නොදා රොඩ්ඩත් එක්කම හෝ නැතිව බොන්න ගන්න පුළුවන්. හරියට තේ කහට



බොනව වගේ. නටාගත් උණු වතුරෙන් තේ හදනව වගේ මේකත් හදාගන්න පුළුවන්. කෝපි කුඩු තියා ගන්නව වගේ කාලයක් තියා ගන්නත් පුළුවන්. පාවිච්චි කරන්න කාලයක් කියලත් නෑ. ලැබිච්ච අවස්ථාවලට බොන්න ගන්න පුළුවන්. එතකොට මේ ඖෂධීය පානය බඩේ අජීර්ණ, අධික පිපාසය, අම්ල පිත්ත ප්‍රධාහය (ගැස්ට්‍රයිටිස්), බඩේ දැවිල්ල, දියවැඩියාව වගේ ආබාධවලට හුඟක් හොඳයි. කිසිම අතුරු ආබාධයක් නෑ.

ඒ වගේම කොස් ගහේ ළපටි අවස්ථාවේ එන පළා පතුරු කියන පුංචි කොස් ගැට තියෙනවා. කලින් වගේම වරක ගහක, ඒ වගේ තියෙන පුංචි කොස් ගැට ගෙඩි පිටින් කඩාගෙන හෝදල පිරිසිදු කරගෙන, එහෙම්ම පෙති ගහල වේලල බැදල කුඩු කරගෙන, අර වගේම බොන්න ගන්න පුළුවන්. හොඳ වෙන්නෙ නැතිව තිබිච්ච, කල්ගත වෙච්ච බඩේ අජීර්ණවලට මේක ප්‍රත්‍යක්ෂ ඖෂධයක්. හැබැයි මේ පුංචි කොස් ගැට කඩනව කියන්නෙ ලොකු පාඩුවක්. මොකද කොස් ගැටයක් කියන්නෙ ඉදිරියෙදි සෑහෙන ඵල ප්‍රයෝජන ගන්න පුළුවන් ලොකු ගෙඩියක පුංචි කොටසක්. ඒ නිසා අත්‍යවශ්‍යම අවස්ථාවක මිසක් ඒ වගේ පුංචි ගැට වැඩිපුර කඩල නාස්ති කරන්න හොඳ නෑ. නමුත් අර වගේ කල් ගත වෙච්ච, සනීප කරන්න බැරි වෙච්ච අජීරණ රෝග තියෙන කොට, ඒ වගේ අත්‍යවශ්‍ය අවස්ථාවලදි ඒකත් බේතක් විදියට ගන්න පුළුවන්. එහෙම විශේෂ නොවන අවස්ථාවලදි, අර කලින් සඳහන් කළා වගේ කොස් කටුව සහ ඉරි ටික ඉවත් කරල, ඒ අතර තියෙන සුදු මස කොටස යොදා ගන්න පුළුවන්.

ඊළඟට වරක ගහේ ළපටි කොළවල දළු අරගෙන, හෝදල මලවල, අවශ්‍ය නම් සාමාන්‍යයෙන් එකතු කරන අඩුම කුඩුම දාල, මැල්ලුමක් විදියට හදල ආහාරත් එක්ක දුන්නම, ඒක අංසභාගය හැදිල දුර්වල වෙලා ඉන්න අයටත්, ස්නායු රෝගවලින් පෙළෙන අයටත් ඉතා හොඳ ප්‍රත්‍යක්ෂ ඖෂධයක් වෙනවා. ඒ විදියට දවසකට එක වේලක් දුන්නම ප්‍රමාණවත්. හැබැයි මේක වාජීකරණ ගුණයෙන් යුක්ත නිසා අසනීප අය විතරක් භාවිතා කිරීම වඩා සුදුසුයි. මේ සම්බන්ධයෙන් අභයරතනාලංකාර හිමියන්ගෙ සත්‍ය අත්දැකීමක් උන් වහන්සේ මේ විදියට හෙළි කළා.

''මම වේයන්ගොඩ ප්‍රදේශයේ වෙදකම් කරන කාලෙ මුකුත්ම කතා කර ගන්න බැරි, හැරමිටියෙන්වත් යා ගන්න බැරි, කාගෙ හරි අත් වාරුවකින් යන අංසභාගෙ හැදිච්ච වෙද මහත්තයෙක් හිටියා. ඒ මහත්තය මුල් කරගෙන තමයි මේ බේත ඉස්සෙල්ලම සමාධියට ආවෙ. ඉතින් සති 2 ක් විතර වරක ගහේ දළු අරගෙන මැල්ලුමක් හදල අර විදියට දුන්නම, හැරමිටියකින්වත් යා ගන්න බැරිව හිටපු කෙනා බස්තමක් වගේ හැරමිටිය පාවිච්චි කරන්න පටන් ගත්තා. ඊළඟට හොඳට වේගයෙන් කතා කරන්න පටන් ගත්තා. ශරීරයට ශක්තිය ඇවිත් හොඳට යන්න එන්න පුළුවන් වුණා. අන්තිමට ලෙඩක් තිබුණද කියලවත් හොයා ගන්න බැරිව ගියා. ඉතින් වෙන මුකුත් බේතක් දුන්නෙත් නෑ. ඕක විතරමයි දුන්නෙ.''

දැන් ඉතින් මේ විදියට පැරණි කාලෙ පටන් තිබිච්ච වටිනා ආහාර, බෙහෙත් ඖෂධ වශයෙන් ගන්න හැටි දහමට අනුව දැනගෙන, ඒවායින් ඵල ප්‍රයෝජන අරගෙන, මෙලොව වශයෙන් අභිවෘද්ධිය සළසගෙන නිකන් ඉන්නෙ නැතිව, ලෝකෝත්තර යහපත උදාකර ගන්න උත්සාහ කරන්න.

**සටහන:**

**නීතිඥ චන්දන සිරිවර්ධන**


# මරණයත් උපතත් අතර සිදුවන සංකීර්ණ ක්‍රියාදාමය...

*(පසුගිය කලාපයෙන්: ගන්ධබ්බයා හෙවත් අන්තරාභවිකයා සම්බන්ධ ගැටලුව නිවැරැදි දහම් ඇසින් ...)*

මස් ලේ සහිත ඝනීභවනය වෙච්ච කරජ කාය ඇති පුද්ගලයෙක් කය බහා තබා මියගියාට පසු, නැවත ගැබක ඔක්කන්ති වීම අතර කාලයක ගන්ධබ්බ අවස්ථාවක් තියෙනව කියල පිළිගන්න බොහෝ පින්වතුන් අකමැති වෙන්නෙ, චුතිය මියයන තැනත්, පටිසන්ධිය කොහේ හෝ මවු ගැබකත් සිදුවන බව හිතන නිසා. ඊළඟ කරුණ තමයි චුති-පටිසන්ධි අතර චිත්තක්ෂණයකවත් අතරක් නැති බව අභිධර්මයේ පෙන්වා තිබීම. මේ ගැටළුව විසඳ ගන්න පටිසන්ධිය කොහේ සිදුවෙනවද, පටිසන්ධි මොහොතකට අවශ්‍ය වෙන්නෙ මොනවද කියල ධර්මානුකූලව පැහැදිලි කර ගන්න ඕන. ඒ වගේම ඔක්කන්තිය කියන්නෙ මොකක්ද, ඊට අවශ්‍ය මොනවද කියන කාරණයත් දැන ගන්න ඕන. පටිසන්ධියත්, ඔක්කන්තියත් කියන්නෙ දෙකක්ද, එකක්ද කියලත් දැනගන්න ඕන. මේවා විග්‍රහ කරන කොට අභිධර්මයේ පෙන්වන චිත්ත නියමයන්ට පටහැනි නොවන විදියට කරුණු ඉදිරිපත් කරන්නත් ඕන. මේ විස්තරය බොහොම ගැඹුරු නිසා සමහර උදවියට තේරුම් ගන්න අපහසු වෙන්න පුළුවන්. ඒ නිසා යම් තරමකට හරි තේරුම් ගන්න පහසු වෙන්න, අභිධර්මයේ එන සමහර වචනවල තේරුම සරලව හා නිරුක්ති සහිතව පළමුවෙන්ම දැන ගැනීම වැදගත්.

චුතිය කියන වචනය ගත්තොත් ''චු'' කියන එකෙන් අදහස් කරන්නෙ යම්කිසි පහත් දේවල්, ආස්වාද සහිත දේවල්. ඒ පහත් දේවල් තැබුවා කියන එක තමයි චු + තිබ්බා - චුති කියන්නෙ. ඒ කියන්නෙ මෙච්චර කලක් අල්ලගෙන හිටපු අත්භවය අත හැරියා කියන එක. ඊළඟට පටිසන්ධි කියන්නෙ එකතු වෙලා බැඳෙනවා කියන එක. ඒ කියන්නෙ ඊළඟ භවයට එකතු වුණා. ඔක්කන්තිය කියන වචනයෙන් පෙන්වන්නෙ යම් කිසි තැනකට ඇතුල් වීමක්. ඒ කියන්නෙ ගන්ධබ්බයා මවු කුසට ඇතුල් වීම. චිත්ත වීථියක් කියන්නෙ සිතිවිලි යම්කිසි ක්‍රමානුකූල රටාවකට ක්‍රියාත්මක වෙන ආකාරය. මේ චිත්ත වීථියකට චිත්තක්ෂණ 17 ක් තියෙනවා.

චිත්ක්ෂණයක් කියන්නෙ චිත්ත වීථියක අවස්ථා 17 න් එකක්. පංචද්වාර චිත්ත වීථියක් හටගන්නව නම් මේ වගේ ක්ෂණ 17 ක් එකතු වෙලා තමයි හට ගන්නෙ. මේ ක්ෂණ 17 ක සම්පිණ්ඩනයක් තමයි එක චිත්ත වීථියක් කියන්නෙ. ඊළඟට මේ 17 ක කම්පන එකතුව ක්‍රියාත්මක වෙන්නෙ හෘද රූපය ඇසුරු කර ගෙන. එක චිත්ත වීථියකට එක හෘද රූපයයි. හෘද රූපය කියන එක පැහැදිලි කරනව නම්, මේ කම්පන 17 ක (චිත්තක්ෂණ) එකතුව



හෙවත් ගැස්සීමේ රූපය (කම්පන රූපය) තියෙන්නෙ අපේ හදවත ඇසුරේ තියෙන කිරණමය හදවතේ. අපේ මස් ලේ හදවත කියන්නෙ කර්මජ කයේ තියෙන ආකෘතිය. මේ මස් ලේ කයේ හදවත ක්‍රියාත්මක වෙන්නෙ කර්මජ කයේ තියෙන හදවත් ආකෘතියත් එක්ක. ඒ කර්මජ කයේ තමයි මේ හෘද රූපය කියන එක ක්‍රියාත්මක වෙන්නෙ. බාහිරින් තියෙන මස් ලේ කයට ඒක ආධාර වෙනවා.

මේක උදාහරණයකින් පැහැදිලි කරනව නම්, බ්ලේඩ් එකක් අරගෙන මොකක් හරි අස්සකට ගහල අත හැරියම ටිං... ගාල ශබ්දයක් එක්ක එතැන නැති රූපයක් අපට මැවිල පේනවා. ඒක වෙන්නෙ කම්පනය වෙන කොට. ඒ කියන්නෙ ගැස්සීම නිසා හටගන්න රූපයක්. මෙන්න මේ වගේ වස්තු රූපයක මොනව හරි කම්පනයක් ආපු ගමන් ගැස්සීමක් එනවා. ඒ ගැස්සීම සිද්ධ වෙන්නෙ 17 වතාවයි. උදාහරණයකින් කියනව නම් යකඩ තහඩුවකට ගැහුවම එන ගැස්මයි, ලීයකට ගැහුවම එන ගැස්මයි... ආදී වශයෙන් ඒ ඒ ද්‍රව්‍යවලට ආවේනික ගැස්මක් තියෙනවා. අන්න ඒ වගේ එක අරමුණක් ස්පර්ෂ වෙනකොට වස්තු රූපයේ කම්පනය 17 වතාවක් හෙවත් හෘද රූප 1 යි. කවදාවත් ඊට වැඩි වෙන්නෙත් නෑ, අඩු වෙන්නෙත් නෑ. ඒ 17 ගිහින් ඉවර වෙන කල් තවත් පහරක් ඒකට වදින්නෙත් නෑ. ඒ තමයි වස්තු රූපයේ ස්වභාවය.

හෘද රූපය කියල කියන්නෙ මේ ඇහින්, කනින්, නාසයෙන් ආදී ඉන්ද්‍රියන්ගෙන් ගන්නා වූ ප්‍රසාද රූප (ඇසක, කනක ආදී වශයෙන් පැහැයක් හෙවත් ඒ ඒ ඉන්ද්‍රියන්ගේ ස්වභාවය සටහන් වන ආකාරය) වැදීමෙන් හට ගන්නා වූ කම්පන සංඛ්‍යාතය. ඒ කියන්නෙ රූපයක්, ශබ්දයක්, ගන්ධයක් ආදී වශයෙන්. ඒක ක්‍රියාත්මක වෙන්නෙ හෘද රූපය ඇසුරු කරගෙන. මෙතනදී මේ මොකක් හරි එක කම්පනයයි එක වරකට ගන්නෙ. ඒ කියන්නෙ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියන මේ මොකෙන් හරි එකයි. ඒ එකක් ඉවර වෙන කල් තව කම්පනයක් වදින්නෙ නෑ. හරියට එක රේල් පාරක ගමන් කරන කෝච්චි දෙකක් එක විටම යන්න බැරුව එකක් පස්සෙ එකක් යනව වගේ. නමුත් මේ ක්‍රියාවලිය අධි වේගවත් නිසා අපට වෙන් කරල තේරුම් ගන්න බෑ. මේ නිසා **කෙනෙක් යම් ආහාරයක් ගන්න ගමන් රූපවාහිනියක් බලන්න, ඒකෙන් නිකුත් වන හඬ අහන්න, යම් කිසි සුවඳක් ආඝ්‍රහණය කරන්න, විදුලි පංකාවක් දැම්මොත් ඒකෙන් කයට ස්පර්ශයක් ලබන්න කියන මේ ඔක්කොම එකවිට කෙරෙනව වගේ පෙනුනට හැම විටම එක ක්ෂණයක මේ පහෙන් එක වේදනාවයි ගන්නෙ.** හෘද රූපයේ සහ වස්තු රූපයේ මේ සිද්ධාන්තය ඥාන ගෝචර දෙයක් මිසක් පොත්පත්වල සඳහන් වෙන්නෙ නෑ.

ඊළඟට චක්ඛුද්වාර, සෝතද්වාර, ඝානද්වාර, ජිව්හාද්වාර, කායද්වාර ආදී වශයෙන් පංචද්වාර කියල කියනවා. මෙතනදි ද්වාර කියන්නෙ ඇතුල් කරනවා කියන එක. රූප ඇතුල් කරන්නෙ චක්ඛුද්වාරයෙන්. ශබ්දය ඇතුල් කරන්නෙ සෝතද්වාරයෙන්. මේ ආදී වශයෙන් ඒ ඇතුල් කරන ද්වාරයේ නමින් චිත්ත වීථිය හඳුන්වනවා. හැබැයි මේ මොන පහෙන් ඇතුල් වුනත්, අන්තිමට ඒක ගන්නෙ මනසින්. අදාල වර්ගය පෙන්වන්න විතරක් ඇතුල් වෙච්ච ද්වාරයේ නමින් හඳුන්වනවා. මේ පහෙන් ඇතුල් වන හැම තරංගයක්ම ගිහින් අන්තිමට මනසට තමයි වදින්නෙ. හරියට මාතර මුදලාලියි, ගාල්ලෙ මුදලාලියි, බෙන්තර මුදලාලියි මේ ඔක්කොම කොළඹ ඉන්නවා, නමුත් කඩේ නම දාල තියෙන්නෙ මාතර කඩේ, ගාල්ලෙ කඩේ, බෙන්තර කඩේ ආදී වශයෙන්. මේ වගේ තමයි මොකෙන් ගත්තත් අවසානයේ සියල්ල මනසින්මයි ක්‍රියාත්මක වෙන්නෙ. මේ නිසාම තමයි චක්ඛුංච පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං කියල කියන්නෙ. මේ හැම එකකටම මනස සම්බන්ධයි. චක්ඛුංච කියල කියන්නෙ ඇහේ ක්‍රියා මාත්‍රය. රූපේච කියල කියන්නෙ රූපයේ ක්‍රියා මාත්‍රය.

පංචේන්ද්‍රියන්ට අරමුණක් ගැටුන මොහොතක පහලවෙන අනුරූප චිත්ත වීථිය චිත්තක්ෂණ 17 කින් යුක්තයි. මේ චිත්තක්ෂණ 17 අතරමග කඩවීමක් හෝ අමතර චිත්ත වීථියක හට ගැනීමක් හෝ කිසි විටෙකත් සිද්ධ වෙන්නෙ නෑ. ඒ ඒ චිත්ත වීථිය සමග පහලවෙන හෘද රූපය චිත්තක්ෂණ 17 අවසන් වෙන කල්ම ක්‍රියාත්මක වෙනවා. එක විට හෘද රූප 2 ක් සත්ත්වයෙකුට පහල වෙන්නෙත් නෑ. මේ අනුරූප චිත්ත වීථි මොනවද කියනව නම්, ඇස මුල් කරගෙන රූපාරම්මනයක් (රූප අරමුණක් හෙවත් - රූප මාත්‍රයක්) ගැටීමෙන් පහල වෙන්නෙ චක්ඛුද්වාර චිත්ත වීථියක්. කනට ශබ්දාරම්මනයක් ගැටීමෙන් පහල වෙන්නෙ සෝතද්වාර චිත්ත වීථියක්. නාසයට ගන්ධාරම්මනයක් ගැටීමෙන් පහල වෙන්නෙ ඝානද්වාර චිත්ත වීථියක්. මේ විදියට රසාරම්මනයක් ගැටීමෙන් ජිව්හාද්වාර චිත්ත වීථියකුත්, කයට පොට්ඨබ්බාරම්මනයක් ගැටීමෙන් කායද්වාර චිත්ත වීථියකුත් පහල වෙනවා. යම් ද්වාරයකට අනුරූප අරමුණ ගැටුනම පහලවෙන චිත්ත වීථිය අවසන් වෙන කල් තවත් ද්වාරයකින් අරමුණු ගැටිල චිත්ත වීථි දෙකක් හෝ කිහිපයක් එකවිට කිසිවිටකත් පහල වෙන්නෙ නෑ.

කෙනෙක් සිටින අත්බැවකින් යම් මොහොතක චුත වෙනව නම්, ඉහත කියපු ද්වාර පහෙන් මොකක් හෝ එකකට අරමුණක් ගැටිල ඒ අත්භවයේ අවසාන චිත්ත වීථිය පහල වෙනවා. මේකට මරණාසන්න චිත්ත වීථිය කියලත් කියනවා. මිනිස් භවයක අවසාන මොහොතේ ශබ්ද අරමුණක් මුල් කරගෙන චිත්ත වීථියක් නැගුන නම් ඒක ඒ මිනිස් භවයේ අවසාන චිත්ත වීථිය වෙනවා. ඒ චිත්ත වීථියට හිමි චිත්තක්ෂණ 17 ක ආයු තියෙන හෘද රූපය, ඒ මරණාසන්න කයේ හෘදය වස්තුව ඇසුරු කරගෙන පහල වෙනවා. චිත්තක්ෂණ 17 අවසන් වෙලා හෘද රූපය කෙළවර වෙනකල් තව කිසි තැනක නැවතත් හෘද රූපයක් පහල වෙන්නෙ නෑ. ඒ අවසාන චිත්ත වීථිය පහල වෙන්නෙ මේ විදියට.

කනට ශබ්ද අරමුණක් වැදීමත් සමගම අවසාන චිත්ත වීථිය ආරම්භ වෙනව නම්, ඒ චිත්ත වීථියට අදාල චිත්ක්ෂණ 17 -

**1. අතීත භවාංග 2. භවාංග චලන 3. භවාංග උපච්ඡේද 4. පංචද්වාර ආවර්ජන 5. සෝත විඤ්ඤාණ 6. සම්පටිච්චන 7. සන්තීරණ 8. වොත්ථපන 9. ජවන 10. ජවන 11. ජවන 12. ජවන 13. ජවන 14. චුති 15. පටිසන්ධි 16. භවාංග 17. භවාංග**

දැන් ඉතින් මේ වචන ටික මෙහෙම නිකං කිව්වට තේරෙන්නෙ නැති නිසා, මේ චිත්තක්ෂණ දාහතේ තේරුම නිරුක්ති සහිතව යම් පමණකට දැන ගැනීම වැදගත්. මේ චිත්ක්ෂණයක් වදින කොට ඒකට අදාල ස්වභාවික වස්තු රූපයක් තියෙනවා. ඒක කර්මජයි. උපතින් හටගත්තු ඒ වස්තු රූපය පුද්ගලයා මැරෙන කල්ම යම් කිසි වේගයකින් භ්‍රමණය වෙනවා. භවාංග වෙවී තියෙනව කියන්නෙ භවයට අංග වෙවී තියෙනවයි කියන එක. ඒක කර්ම ශක්තියෙන් තමයි දිගටම ක්‍රියාත්මක වෙන්නෙ. එහෙම ක්‍රියාත්මක වෙන අතර තුරදි හැම වෙලේම රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියන මේ මොකක් හරි බුක්ති විඳින්න මනස ඒ බලාපොරොත්තුවෙන් තමයි ඉන්නෙ. හැම වෙලේම මොකක් හරි අරමුණක් එනකල් ලෑස්ති පිට ඉන්නවා. එතකොට පළමුවෙන්ම ඒක අදාල ද්වාරයට වැදිල වස්තු රූපයට වදින කොට මරණාසන්න මොහොතෙ තිබ්බ්ච එක තමයි දැන් තියෙන්නෙ. ඒක ආසේවනය වෙවී යනවා. ඒ වගේම ඒකෙ තියෙන බලය අනුව වදින වේගය අඩු වැඩි වෙනවා. එහෙම වැදිල ක්‍රියාත්මක වෙන කොට ඒ වස්තු රූපය වටා තවත් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියල ප්‍රසාද රූප 5 ක් ක්‍රියාත්මක වෙනවා.

නමුත් අටුවාවල මේ ප්‍රසාද රූප විග්‍රහ කරල තියෙන්නෙ කනේ තියෙන, ඇහේ තියෙන ආදී වශයෙන්. නමුත් ඇහේ, කනේ එහෙම හිත් හට ගන්නෙ නෑ. ඔක්කොම හිත් හට ගන්නෙ එකම තැනක. ඒක තමයි මේ ඇහේ, කනේ... ආදී වශයෙන් පටලවා ගෙන තියෙන්නෙ. බුද්ධ දේශනාවෙ පෙළවල තියෙනවා පිඳුරු ගින්න, තෙල් ගින්න, දර ගින්න ආදී වශයෙන් කිව්වට ගින්න එකමයි කියල. ඒ වගේම මේ චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය ආදී වශයෙන් වෙන් කරල කිව්වට එකම විඤ්ඤාණය කියලත් පෙන්වා තියෙනවා. අටුවා ලියන කොට මේක වරද්දගෙන තමයි චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය ආදී වශයෙන් වෙන් කරල ඒවා ඇසේ, කනේ ආදී වශයෙන් හටගන්නව කියල හදාගෙන තියෙන්නෙ. නමුත් ඇහේ, කනේ හිත් හට ගන්නෙ නෑ. ඒවා ද්වාර විතරයි. ඒවායින් කරන්නෙ අරමුණු ගැනීම විතරයි. එහෙම අරමුණු ගත්තට පස්සෙ වස්තු රූපය ඇසුරේ තමයි මේ ප්‍රසාද රූප තියෙන්නෙ.

උදාහරණයක් විදියට අපි වස්තු රූපයට යම් කිසි පහරක් දුන්නම ඒ පහරින් තමයි වස්තු රූපය කම්පනය වෙන්නෙ. ඒ කියන්නෙ පංචද්වාරවලින් මොකක් හරි එකකින් ඇතුල් වෙනවා. ඒ හැම ද්වාරයකින්ම ස්පර්ශයක් එනවා. ඒ ස්පර්ශය මනසට දැනෙනවා. ඒ ස්පර්ශයෙන් ලැබෙන කම්පන 17 තමයි මේ චිත්තක්ෂණ කියන්නෙ. උදාහරණයක් විදියට ගණ්ඨාරයක් වගේ දේකට හීන් කම්බියකින් එක පාරක් තට්ටු කළොත් කීං... කියල ශබ්දයක් යන්තම් එනවා. ඊට වඩා ටිකක් ලොකු අඟලක විතර ඇණයකින් තට්ටුවක් දැම්මොත් ටිං... කියල ශබ්දයක් එනවා. ඊටත් වඩා ලොකු ඇඟිල්ලක් විතර ඇණයකින් තට්ටු කළොත් ඩං... ගාන ශබ්දයක් එනවා. මේ විදියට ගිහින් පස් වෙනියට ඒ ගණ්ඨාරයට ඔරොත්තු දෙන ලොකු යකඩයකින් තට්ටු කළොත් ඩාං... කියන ශබ්දයක් එනවා. කොච්චර සැර අවස්ථා 5 කින් වුනත්, ශබ්ද 5 ක් ආවට වස්තු රූපයට ඒ හැම අවස්ථාවකදීම තියෙන්නෙ කම්පන වාර 17 බැගින්. ඒක කම්පන නියමයක්. හයියෙන් ගැහුවොත් එන ශබ්දය වැඩියි. හෙමින් ගැහුවොත් ශබ්දය අඩුයි. හැබැයි කම්පන වාර ගණන සමානයි. මේ විදියට සෑම වස්තුවකටම අදාල ස්වභාවික සංඛ්‍යාතය පිළිබඳ නවීන විද්‍යාවේ එන එක්තරා නියමයක් තියෙනවා. නමුත් වස්තු රූපයට අදාල කම්පන වාර 17 බුදුන් වහන්සේගේ අනාවරණ ඥානයට මිසක් වෙන කාටවත් හොයා ගන්න පුළුවන් දෙයක් ☞

නෙවෙයි. නමුත් අපි ඒ අනුසාරයෙන් දැකල තමයි මේක මෙහෙම වෙලා තියෙන්නෙ කියල කියන්නෙ.

කොහොම හරි මේ කම්පන වාර 17 තමයි භුක්තිය කියල කියන්නෙ. ස්පර්ශයක්, ගැස්මක් එන කොට ඒක පංචද්වාරවලින් අරන් අන්තිමට මනෝද්වාරයට තමයි යන්නෙ. එතන තමයි වස්තු රූපය පිහිටල තියෙන්නෙ. වස්තු රූපය එහෙ මෙහෙ හෙල්ලුනොත් මනෝද්වාරයේ ස්පර්ශ එකක් වෙනවා. ඒ වගේ කම්පන වාර 17 ට ස්පර්ශ 17 ක් එනවා. මනෝද්වාරය තුළ වස්තු රූපය හෙල්ලෙන කොට තමයි මනසට ඒක ස්පර්ශ වෙන්නෙ. චිත්ත වීථියකට එක වතාවක් වුනාම ඒකෙ තියෙන කම්පන වාර 17 ට, 17 වතාවක් ස්පර්ශ වෙනවා. හැබැයි එහෙම ස්පර්ශ වුනාට මුල් 3 ආවර්ජනය නොකරන නිසා මනසට දැනෙන්නෙ නෑ. ඒ නිසා දැනෙන්නෙ ස්පර්ශ 14 යි, වේදනා 14 යි, සංඥා 14 යි, චේතනා 14 යි. මේ විදියට ඔක්කොම 14 බැගින් දැනෙනවා. ඒ කියන්නෙ ස්පර්ශ 1 ක් දැනෙන්න වේදනා 1 ක් එනවා. ඒක හඳුන ගන්න සංඥා 1 ක් එනවා. ඒක ගොඩනගන්න චේතනා 1 ක් එනවා. මේ විදියට තමයි මේ ස්පර්ශ, වේදනා, සංඥා, චේතනා කියන මේවා එන්නෙ. මේ වගේ එකකට හට ගත්තු ස්පර්ශ, වේදනා, සංඥා, චේතනා කියන මේවා ඒ අදාල චිත්තක්ෂණයට මිසක් වෙනත් චිත්තක්ෂණයකට යන්නෙ නෑ. මේ සියල්ලම සහජාතයි, එකට ගොඩනැගෙන්නෙ. එතකොට පළවෙනි චිත්ත වීථියේ චිත්තක්ෂණයට අයිති මේ හතර, දෙවන චිත්තක්ෂණයට යන්නෙ නෑ. ඒක කම්පනයත් එක්කම ආව ගියා එච්චරයි. මේ කම්පනය ඉස්සෙල්ලම දෙන එක තමයි අරමුණෙන් කරන්නෙ. අරමුණෙන් කම්පනය දෙන කොට වස්තු රූපයේ ජීවය පවත්වන්න ශක්තියක් තියෙන්න ඕන. දැනට හැදිල තියෙන කර්ම ශක්තියෙන් තමයි ඒක ජීවත් වෙන්නෙ.

මේ විදියට 14 වෙනියට එන චුති චිත්තක්ෂණයෙදි වස්තු රූපයේ චුත වෙන වෙලාව එන කොට අර තිබ්බ කර්ම ශක්තියේ වේගය ඉවරයි. හැබැයි මුලින් කර්ම ශක්තිය තිබ්බ නිසා තමයි මේ කම්පනය සිද්ධ වුනේ. දැන් ඒ මුල් ශක්තියෙන්ම 17 ට යන කල්ම හෙල්ලෙනවා. චුත (14) කියන තැනට එන කොට කර්ම ශක්තියෙන් චුත වුනත් කම්පනය දිගටම තියෙනවා. හරියට අපි රෝදයක් කරකව කව ඉඳල එක පාරටම අත හැරියත්, අර මුලින් දීපු ශක්තියෙන් තවත් වෙලාවක් ඒ රෝදය කරකැවෙනව වගේ. එතකොට අර මුලින් තිබ්බ (අතීතයේ) කර්ම ශක්තියේ කම්පනය දිගටම වෙන නිසා තමයි ඒ මුල් චිත්තක්ෂණයට අතීත භවාංග කියල කියන්නෙ. ඒකෙන් අර 17 ම කම්පනය වෙලා තමයි නවතින්නෙ. හැබැයි 17 අතර තුරේ චුති කියන තැනට එනකොට කර්ම ශක්තිය ඉවරයි. නව කර්ම ශක්තිය ආරම්භ කරන්නෙ පටිසන්ධි කියන අවස්ථාවෙ. මෙන්න මෙතනදි තමයි ඉදිරියෙදි විග්‍රහ වෙන කාය, භාව, වස්තු කියන දසකවල පරිවර්තනය සිද්ධ වෙන්නෙ.



දැන් එතකොට පටිසන්ධියෙන් පස්සෙ අලුත් භවයට අංග වෙන භවාංග දෙකක් යනවා. එතකොට පටිසන්ධිය කරන්නෙ කර්ම බලයෙන්. අතීත භවාංගයෙන් කරන්නෙ මේ කම්පනය කරන එක විතරයි. මේක අද තෝරගන්න බැරිව තමයි කෙනෙක් මැරෙන කොට, කුඩැල්ල එක තැනක් අත් හරිනවත් එක්කම තවත් තැනක් අල්ල ගන්නව වගේ, මැරෙන කොටම පටිසන්ධිය බඬේ සිද්ධ වෙනවයි කියල පටලවාගෙන තියෙන්නෙ. ඇත්තටම පටිසන්ධියේදි තමයි අලුත් භවයක් අල්ලන්නෙ. එහෙම ඇල්ලුවත් අර චුතියෙන් ගෙනාපු චිත්ත වීථිය තවම යනවා. ඒ යන්නෙ කලින් දීපු ශක්තියෙන්. අලුත් කර්ම ශක්තියට කාය, භාව, වස්තු දසක කියන මේ තුන එකට සම්බන්ධ කරන්නෙ අර අලුත් කර්ම ශක්තියෙන්.

ඊළඟට මේ විදියට පංචද්වාරවලට අරමුණු වදින කොට හෙමින් වදින අවස්ථා වගේම හයියෙන් වදින අවස්ථාත් තියෙනවා. එහෙම වදින කොට මානසිකත්වය ඒකට යොමු වෙන්න ඕන. නැත්නම් ඒ ස්පර්ශය එක පාරටම අල්ල ගන්න බෑ. එකක් කම්පනය වෙන කොට ඒක අල්ල ගන්න බැරි වුනොත් අතීත භවාංග වෙනවා. දෙවෙනි එක කම්පනය (චලනය) වෙන කොට හිතට දැනුනොත් භවාංග චලන වෙනවා. ඊළඟට ඉදිරියට මේ චිත්තක්ෂණ සියල්ලම කම්පනය වෙමින් යනවා. එහෙම ගිහින් අළුත් එකක් අල්ල ගන්න ලෑස්තිවෙන අවස්ථාව තමයි භවාංග උපච්ඡේද කියන්නෙ. දැන් එතකොට ඉස්සෙල්ලම අතීත භවාංග අරමුණක් මනස අල්ලගෙන හිටියා. දැන් ඒ අරමුණින් අහක් වෙලා රූප, ශබ්ද, ගන්ධ, රස හෝ ස්පර්ශ කියන අලුත් දර්ශන අරමුණකට ආවර්ජනය කරනවා. ඒකට තමයි පංචද්වාර ආවර්ජන කියන්නෙ.

මනෝද්වාරයේ ගතිය කියන්නෙ, සංසාරෙ අපි මැරෙන කොට අපිට මතක් වෙලා තිබ්බ අරමුණ නිසා පහළ වෙච්ච ගතිය. ඒක දැන් අත් හරිනවා. අලුත් එකක් අල්ලගන්නවා. අලුත් එක අල්ල ගන්න පරණ එක අත හරින මොහොත තමයි භවාංග උපච්ඡේද කිව්වෙ. ඒත් එක්කම නැවතත් රූප, ශබ්ද, ගන්ධ, රස හෝ ස්පර්ශ කියල පංචද්වාර ආවර්ජන එනවා. ඊට පස්සෙ ඒකට අදාල විඤ්ඤාණය එනවා. ඒකෙන් දැනීම් පහළ වෙනවා. සම්පටිච්චන කියන්නෙ ඒ ආපු දැනීම පිළිගත්තයි කියන එක. ඒක විපාක හිතක්.

ඊළඟට, ආ... මෙහෙම එකක්නෙ ආවෙ කියල තීරණය කරනවා. ඒක තමයි සංතීරණ කියන්නෙ. ඒකත් විපාක හිතක්. ඊට පස්සෙ ඒකට අනුකූලව තමන් භුක්තිය ගන්න ඕන කොහොමද කියල නිගමනය කරනවා, ව්‍යවස්ථාපනය කරනවා. ඒ කියන්නෙ ඒකට ලක ලෑස්ති වෙනවා. ඒක තමයි වොත්තපන කිව්වෙ. නමුත් ඒක ක්‍රියා හිතක්. විපාක හිතක් නෙවෙයි. හැබැයි තවම තීරණය කළේ නෑ. ප්‍රශ්නාර්ථයක් නගනවා. ඊළඟට මේකයි කළ යුත්තෙ කියල නිගමනයකට බහින කොට තමයි ජවන එන්නෙ. ඒ කියන්නෙ ක්‍රියාත්මක වීමක්. එතනදි ජවන 7 ක් යනවා. ඒ 7 එකිනෙකට ආසේවනය වෙනවා. පළවෙනි ජවනයෙන් බලය ගන්නවා. ඒ අනුසාරයෙන් ආසේවනය වෙලා පස් වතාවක් බල ගැන්වෙනවා. ඒ විදියට පස් වතාවක් බල ගැන්විච්ච එක තමයි පටිසන්ධියට ගිහින් අල්ලගන්න බලවත් වෙන්නෙ. 1, 2 බලවත් නෑ.

නවතින්නෙ නැතිව 5 ට යනකල්ම යනවා. ඒකත් නියමයක්. 3, 4 ත් ගෙවිල යනවා. එහෙම යන කොට එකින් එකට ආසේවනය ලබනවා. 2 ට ගියාම ශක්තියක් නැගෙනවා. 3 ට ගියාම හිතාගන්න පුළුවන් ශක්තියක් ලැබෙනවා. 4 දි කතා කරන්න ශක්තිය නැගෙනවා. 5 ට එනකොට ක්‍රියා ශක්තිය නැගෙනවා. ඒ නිසා තමයි චුත වෙන තැනදි ඊළඟ අත්භවය අල්ලන්න (පටිසන්ධි වෙන්න) පිහිටල තියෙන්නෙ.

මෙතනදි 14 හා 15 චිත්තක්‍ෂණ දෙකත් එක්කයි ජවන 7 ක් වෙන්නෙ. ඒ දෙක චුති-පටිසන්ධි කියල වෙනම වචන දෙකකින් හඳුන්වල තියෙනවා. මේ දෙකම පූර්ණ කර්මජ ක්‍රියාවලියක්. චුතියෙන්, පෙර කර්ම ශක්තිය ගෙවිල, පටිසන්ධියෙන් නව කර්ම ශක්තිය අල්ලනවා. මේ චුති-පටිසන්ධි කියන චිත්තක්‍ෂණ දෙක නිසා තමයි භවයෙන් භවයට සම්බන්ධ වෙන්නෙ. චුති පටිසන්ධියෙන් පස්සෙ නැවතත් භවාංග කියන්නෙ අලුත් භවයකට යනවයි කියන එක. මේ තමයි චිත්තක්‍ෂණ 17 ක විග්‍රහය.

එතකොට කුඩැල්ල එක තැනක් අල්ලගෙන තවත් තැනක් අතහරිනව වගේ, චිත්තජ රූප ගිහින් කොහොමද කර්මජ රූපයේ ඇඳෙන්නෙ? මෙතනදි ආසන්න කර්මය කියල එකක් තියෙනවා. ඒක තමයි පටිසන්ධියට ඇදල එන්නෙ. අතීතයේ කරපු භවගාමී කර්මවලින් එකක් තමයි මෙතනදි අවසාන චිත්ත වීථිය හැදෙන්න ආසන්න අරමුණක් වෙන්නෙ. ඒ චිත්ත වීථියේ ජවනයක් ජවනයක් ගානෙ චිත්තජ රූප හැදෙනවා. ඒවා සහජාතව ගොඩ නැගෙන්නෙ. ඒ කියන්නෙ චිත්ත වීථිවල කර්ම වේගයෙන්, ජවනවල කර්ම වේගයෙන් මේ ජවනත් එක්කම එකට ගොඩ නැගෙනවා. මේ විදියට මුල් ජවන 5 ට චිත්තජ රූප 5 ක් ගොඩ නැගෙනවා. නමුත් 6 වන ජවනයෙන් චුත වෙන නිසා එතනදි චිත්තජ රූපයක් ගොඩ නැගෙන්න විදියක් නෑ. හැබැයි එතනට එනකල් ආපු චිත්තක්‍ෂණ 17 ක කම්පන වේගය දිගටම යන්නත් ඕන. නමුත් ගොඩ නැගෙන්න චිත්තජ රූපයක් (සහජාත කර්ම රූපයක්) නැති නිසා ආසන්න කර්මය විදියට, පෙර චිත්තජ රූපය නැගෙන කොටම ඒ සහජාත රූපය බලවත් වෙලා 5 වන ජවන රූපයට ක්‍රියාකාරී බලයක් ලැබෙනවා. ඒ වෙලාවෙදි කර්මජ රූපයකුත් බල නැගෙනවා. ආසන්න කර්මය වශයෙන් ඒ කර්මජ රූපයෙන් තමයි කාය, භාව, වස්තු දසක කියල 6 වෙනියට චුත වෙන අවස්ථාවෙදි පටිසන්ධියට රූපය හැදෙන්නෙ. හැබැයි ඒක තිබුණෙ කර්ම භවයෙ. ඒ කර්ම භවයෙන් ආසන්නයටම තිබ්බ්ච එක තමයි ඇදල එන්නෙ. ඒකෙන් තමයි 6 වෙනි එක සම්පූර්ණ කරන්නෙ.

හැබැයි 6 වන ජවනයෙන් චුත වෙන කොට, ගෙනාපු කර්ම ශක්තිය ඉවරයි. ඒ නිසා කලින් කර්ම ශක්තිය ආධාර කරගෙන තමයි මේ 6 වෙනි එක හදන්නෙ. ඒක තමයි අතීත භවයට සම්බන්ධ වෙලා තිබ්බ්ච ආසන්න එක. ඒක 5 වන ජවනයෙදි ගොඩ නැගිච්ච කර්ම බීජය. 5 වන ජවනය බලවත් නිසා ඊළඟ අත්බැව හදන්න ඒක ඒ මොහොතෙ ගිහින් කර්ම භවයෙ පිහිටනවා. උප්පත්ති භවයට එන්න ඒක තමයි ආසන්නම කර්මය විදියට පටිසන්ධියට ඇඳෙන්නෙ.

උදාහරණ විදියට හරක් ගාලක දොරටුව අරින කොට බලවත් හරක් කොච්චර හිටියත්, ඒ දොරටුව ආසන්නයේ අන්තිමටම දුර්වල වෙලා හිටපු හරකෙක් හිටිය නම් ඌ තමයි ඉස්සෙල්ලම එළියට පනින්නෙ. දුර්වල වුනත් දොරටුව අරින කොටම ඒ ළඟම හිටපු සතා තමයි ඉස්සෙල්ලම එළියට පනින්නෙ. මේ වගේ පටිසන්ධියට අවශ්‍ය කරන කර්ම බීජය එන කොට, ආසන්නයටම තියෙන 5 වන ජවනයේ තිබ්බ්ච එක තමයි බලවත් වෙලා ඇදිල එන්නෙ. එතකොට ඒක තිරිසන්ද, ප්‍රේතද, යක්‍ෂද කියල බලන්නෙ නෑ, ඒ තිබ්බ්ච ගතියෙ ලක්‍ෂණයට අදාල එක තමයි ඇදල එන්නෙ. ඊට පෙර කොච්චර හොඳ දේවල් කරල තිබුණත් දැන් ඇදල එන්නෙ අර ආසන්නයට තියෙන එක. ඒ නිසා තමයි මරණාසන්න මොහොතෙ ආපු හිතට අනුවයි පටිසන්ධිය කියල කියන්නෙ. මොන විදියෙ හොඳ කරල තිබුණත් ඒක තමයි ක්‍රියාත්මක වෙන සිද්ධාන්තය.

අවිද්‍යාව, තණ්හාව තියෙන නිසාම, නැවතත් බලාපොරොත්තු වෙන නිසාම ඒක ආසන්න කර්ම බීජය බවට පත්වෙලා පටිසන්ධියට එනවා. ඒකට බීජය හදන්නෙ 5 වන ජවනයෙන්. ඒ කියන්නෙ 6 වන ජවනයට (චුතියට) අවශ්‍ය දේ 5 වන ජවනයෙන් නිෂ්පාදනය වෙනවා. හැබැයි ඒක 5 වන ජවනයේ තිබ්බ්ච චිත්තය නෙවෙයි. ඒ චිත්තයත් එක්ක නිපදවපු කර්ම බලය. මොකද පටිසන්ධිය පූර්ණ කර්මජ නිසා දැන් චිත්ත වීථියෙන් ගන්න දෙයක් නෑ. චුත වෙන කොටම 5 වන ජවනයෙන් බලය දීල ඉවරයි. ඒ බලයෙන් තමයි 6 වන එකට චිත්තජ රූප නිපදවෙන්නෙ.

දැන් මෙතනදි විශේෂ යමක් පෙනී යනවා. ඒ කියන්නෙ චුතිය සිද්ධ වෙලා එක චිත්තක්ෂණයකවත් අතරක් නැතිවම පටිසන්ධිය ලබල තවත් චිත්තක්‍ෂණ 2 ක කාලයක් යන කල් හෘද රූපය, මියයන කෙනාගෙ හෘදය වස්තුව ඇසුරු කරගෙන ක්‍රියාත්මක වෙලා තියෙන බව. (චිත්තක්‍ෂණ 14, 15, 16, 17, බලන්න) මේකෙන් පේන්නෙ පටිසන්ධිය සිද්ධ වෙන්නෙ මවු කුසක නෙවෙයි චුත වෙච්ච තැනම බව. මවු කුසක තියෙන්නෙ බාහිර උතුජ රූප සහ ආහාරජ රූප. එක රූපයක් හැදුවට පස්සෙ ඒ හදපු එක පරණ වෙනවා. පරණ වෙන ගානෙ අලුත් රූප හැදෙනවා. ඒ කියන්නෙ පරණ අලුත් රූපයක්. ඉස්සෙල්ල නොතිබ්බ්ච පරණ රූපයක්. ඊළඟ මොහොතෙදි ඊටත් වඩා පරණ එකක්. දැන් පරණ වෙච්ච රූප ගොඩවල්. එන්න එන්නම පරණ වෙනවා. ඍතු විපර්යාසය කිව්වෙ මේකට. ඒව තමයි උතුජ රූප කියන්නෙ.

ආහාරජ රූප කියනකොට කන බොන මොනව හරි ගත්තම, හැදිච්ච ගන්ධබ්බයට ඒක ආහාර වෙනවා. හැබැයි මේ ගන්ධබ්බය මෙතනදි කටින් කනව බොනව නෙවෙයි. මුළු ගන්ධබ්බ කයෙන්ම උරා ගන්නවා. උදාහරණ විදියට යම් කිසි වේලිච්ච කඩදාසියක් තෙතමනය තියෙන තැනකින් තිව්වොත්, ටික වෙලාවක් යන කොට ඒ කඩදාසියට කටක් නැති වුනත් තෙතමය පොඟල උරා ගන්නවා. මේ ක්‍රමයට තමයි ගන්ධබ්බයා ආහාර උරා ගන්නෙ. ඒ වගේම විවිධ ගන්ධබ්බයො ඉන්නවා. **සමහර ගන්ධබ්බයො සීතලට කැමතියි. එතකොට සීතල තියෙන තැනකට කර්ම ශක්තියෙන් පාවෙලා ඇදිල යනවා. එතනින් සීතල උරා ගන්නවා.** ඒ වගේම සමහරු උෂ්ණයට කැමතියි. ඒ අයත් අර වගේම උෂ්ණය උරා ගන්නවා. වාතයට කැමති අය වාතය තියෙන තැන්වලට ගිහින් වාතය උරා ගන්නවා. මේ තමයි ගන්ධබ්බයගෙ මූලික අවස්ථාව. ඊළඟට කාලයත් සමග සියුම් ඉන්ද්‍රියන් ගොඩනැගෙනවා. මෙහෙම ඉන්න ගන්ධබ්බය තමයි මවු කුසකට ඔක්කන්ති වෙන්නෙ.

මවුපිය දෙදෙනෙකුගේ එක්වීමෙන් හටගන්න ශුක්‍රාණු සහ ඩිම්බානු එකතු වෙලා ජනකානුවක් පහල කරල, ඒවා නිසි පරිදි සම්බන්ධ වෙන්න අවශ්‍ය ආහාරජ රූප වන ඕජස් සහිත කබලිංකාර ආහාර කියන්නෙ, මේ මස් ලේ සහිත කය හට ගන්න මුල් වෙච්ච රූප කලාප. ''කබලිංකාරාහාරෝ ඉමස්සකායස්ස ආහාර පච්චයේන පච්චයෝ'' කියල කබලිංකාරාහාර මේ කයට ආහාර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වෙන බව අභිධර්ම ග්‍රන්ථවල සඳහන් වෙනවා. උපදින ☞

සත්ත්වයන්ට අනුග්‍රහ පිණිසත්, ඉපදුන සත්ත්වයන්ට පැවැත්ම පිණිසත් සතර ආහාරයක් හේතු වෙන බව ධර්මයේ පෙන්වා තියෙනවා.

1. කබලිංකාර (කය බලි කරන හෙවත් ගොඩනගන) ආහාර 2. ස්පර්ශ ආහාර 3 මනෝ සංචේතනා ආහාර 4. විඤ්ඤාණ ආහාර කියන්නෙ මේ ආහාර හතර.

කබලිංකාර ආහාරයෙන් පෝෂණය ලබමින් ඇස, කන, නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රියන් ලබන කොට ඒවාට ගෝචර වෙච්ච, අරමුණු වෙච්ච රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු ස්පර්ශයෙන් ගොඩනැගෙන කාමාස්වාදය දෙන වින්දනයන් හෙවත් වේදනාවන් කෙරෙහි ඡන්දරාගයෙන් බැඳෙන සත්ත්වයා, මනෝ සංචේතනා හෙවත් සංඛාර ගොඩ නගනවා. එතකොට ඒවා ආහාර විදියට ප්‍රත්‍ය වෙලා විඤ්ඤාණ ගොඩ නැගෙනවා. විඤ්ඤාණ උපාදාන කරගත්තම නැවතත් පුනර්භවයට හේතු වෙනවා. මතු භවයක පටිසන්ධියට මේ විඤ්ඤාණය ආහාර වෙනවා. පටිසන්ධි විඤ්ඤාණයකින් පුනර්භවය ආරම්භ වීම පූර්ණ කර්මජ ක්‍රියාකාරිත්වයෙන් සිද්ධ වෙනවා. ඒ කර්ම ශක්තියෙන්ම නාම ධර්ම හට ගැනීමට අත්‍යවශ්‍ය වස්තු රූපය තමයි, ශුද්ධාෂ්ටකයක් (ශුද්ධ වූ අටකය) හෙවත් ආපෝ, තේජෝ, වායෝ, පඨවි, වර්ණ, ගන්ධ, රස, ඕජා කියන වෙන් කරන්න බැරි එකට බැඳුණු රූප කලාප 8 කින් හැදිච්ච පරමාණුවක් කියන්නෙ. ඒක කර්ම ශක්තිය මුල් කරගෙනම ගොඩනැගිච්ච පරමාණුවක් නිසා ඒ රූප මාත්‍රය පූර්ණ කර්මජයි.

මේ ශුද්ධාෂ්ඨකය කර්ම ශක්තියේ බලයෙන්ම ජෛවී ස්වභාවයක් පහල කරන පරිවර්තන ක්‍රියාවලියක් ඇති කරනවා. මේකත් මූල රූපය භ්‍රමණයෙන් හට ගත් රූපාකාරයක්. ඒ වගේම ඒ ඒ සත්ත්ව කොටසට ගෝචර මානසිකත්වයන් වැද්ද ගැනීමට වස්තු බීජයක් විදියට ක්‍රියාත්මක වෙන තවත් භ්‍රමණ චක්‍රයක් කර්ම ශක්තිය මූලිකවම ක්‍රියාත්මක වෙනවා. මේ විදියට ශුද්ධාෂ්ටකයේ රූප කලාප 8 ත්, ජීවිත රූපය සහ වස්තු රූපය කියන පරිවර්තන සහ පරිභ්‍රමණ රූප කලාප 2 ත් එකතු වෙලා රූප කලාප 10 ක් වෙනවා. මේක වස්තු දසකය කියල හඳුන්වනවා. පටිසන්ධි විඤ්ඤාණයට අනුකූල පුනර්භවය පහල කරන මේ මොහොතේ ඉහත කියපු වස්තු රූපය ඇසුරු කර ගෙනම ගති හිතක් විපාක වශයෙන් පහල වෙනවා.

ඒ මොහොතෙම පුනර්භවික-යාගේ කාය ස්වභාවය පහල කිරීමේ මූලික ශක්තිය කර්ම ශක්තිය වශයෙන්ම ගැබ් කෙරෙමින් තවත් ශුද්ධාෂ්ටක රූප කලාපයක් ජීවිත රූපය සහ කාය ස්වභාවය අරගෙන කාය දසකය විදියට පහල වෙනවා. ඒ මොහොතෙම ස්ත්‍රී පුරුෂ ආදී ඒ පුනර්භවිකයාගේ ස්වභාවයෙන්ම ඔප් නංවන කර්ම ශක්ති ගැබ්කරගත් ශුද්ධාෂ්ටකයක් ජීවිත රූපය සහ භාව රූප ස්වභාව ගනිමින් භාව දසකය විදියට පහල වෙනවා. මේ විදියට විපාක සිත සමගම පහලවෙන රූප කලාප 30 ක් තියෙන වස්තු දසක, කාය දසක, භාව දසක කියන 30 ත්, ඒ සමගම පහල කරන විපාක ගති සිතත් පූර්ණ කර්ම මූලිකයි. මේ ස්වභාවය ''පටිසන්ධික්ඛනේ විපාක අභ්‍යාකතානං (ලෝභ, ද්වේශ, මෝහ, අලෝභ, අද්වේශ, අමෝහ කියන මේ මොකුත් නැති විපාක වශයෙන් ආපු හිත් තමයි අව්‍යාකෘත හිත් කියන්නෙ.) කටත්තාච රූපානං (කර්මජ රූප) කම්ම පච්චයේන පච්චයෝ (කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වෙන) - විපාක පච්චයේන පච්චයෝ (විපාක ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වෙන) සහජාත පච්චයේන පච්චයෝ'' යනාදී වශයෙන් අභිධර්මයේ පෙන්වා තියෙනවා.



මේ අනුව පටිසන්ධි මොහොතෙදි බාහිර ලෝකයෙන් ගන්න කිසිම දෙයක් නෑ. ඒ අවස්ථාවෙදි සියල්ලම පූර්ණ කර්මජයි. කර්මය ප්‍රධාන වෙලා කර්මයෙන් ජනිතවන ආකාරය තමයි මේ පෙන්වන්නෙ. මේ විදියට පූර්ණ කර්ම ශක්තියෙන්ම පහල කරන මේ අලුත් භවයේ මූලාරම්භයට, මියයන පුද්ගලයාගේ ගතින් හෝ මවු ගැබකින් හෝ ගත යුත්තක් නැති බවත් තේරුම් ගන්න ඕන. මේ පටිසන්ධි මොහොත, අභිධර්මයේ **ඒකජ කාය හෙවත් එකම කර්ම ශක්තියෙන් ජනිත කළ කාය** කියල හඳුන්වනවා. එතැන් පටන් කර්මජ රූප ගොඩනැගීම ආරම්භ වෙනවා. ගොඩනැගෙන හැම රූපයක්ම ඉතා සුළු මොහොතකින් කර්මජ වශයෙන් උපචය වෙලා සන්තති අවස්ථාවට ඇවිත් (හට ගත්තට පස්සෙ තවම ජරාවට පත්වුනේ නැති, පවතින කාලය) ඊළඟ මොහොතේ ජරතා අවස්ථාව (දිරාපත් වෙන) ඉක්මවා ගිහින් අනිච්චතා (ඉක්ම ගිය අවස්ථාව) නම් අවස්ථාවට පැමිණෙනවා. මේ තමයි රූපයන්ගේ ඍතු විපර්යාසය.

දන් කර්මජ සම්බන්ධ-තාවයෙන් නිදහස් වෙලා උතුජ රූප අවස්ථාවට පත්වෙමින් කර්මජ කය පිරිවරා පිහිටනවා. කර්මජ රූප සහ උතුජ රූප සහිත කායික අවස්ථාව **ද්විජ කායික** කියල හඳුන්වනවා. ඒ ද්විජ කායට තාම සිතිවිලි නෑ. ඊළඟට සිතිවිලි නැගීමත් සමග චිත්ත ශක්තියෙන් ජනිත වන රූපත් ඒ කය පරිවාර කරගෙන පිහිටනවා. එතකොට තුන් ආකාරයකින් ජනිතවන කය **ත්‍රිජකායික** කියල හඳුන්වනවා. රූපාවචර බ්‍රහ්මයෝ කබලිංකාර ආහාර වළඳන්නෙ නෑ. චිත්ත ප්‍රීතියම ආහාර කරන නිසා බ්‍රහ්මකායිකයෝ ත්‍රිජකායිකයෝ වෙනවා.

මේ විදියට පහල වෙච්ච කය තියෙන කාමාවචර ගන්ධබ්බයෝ, ගඳ සුවඳ මට්ටමේ පටන් ඕලාරික (රළු) ආහාර භුක්තිය ලබල කබලිංකාර ආහාර භක්ෂිකයෝ වෙනවා. එතකොට ඔවුන් **චතුජ කායික** ගණයට පත් වෙනවා. **දිවැස් තියෙන කෙනෙක් ගෙවල් දෙකක දොර දෙකක් අතර ඉඳගෙන බලන කොට ගෙට ඇතුළුවන, ගෙයින් පිටවන, පාරේ සක්මන් කරමින් හැසිරෙන, අනිත් ගෙයට**

**ඇතුළුවන මිනිසුන් දකින ලෙස දකිනවා කිව්වෙ මේ ගන්ධබ්බයින්. ගෙය කියන්නෙ මේ මස්, ලේ සහිත කය. ගෙයින් පිටවෙනව කිව්වෙ කය හැර දමා ගන්ධබ්බයා ලෙසින් පිටවෙන සත්වයා. අතර සක්මන් කරන, සැරිසරන මිනිසුන් ලෙස මේ ගන්ධබ්බයන්ගෙ සැරිසැරීම පේනවා. තව ගෙයකට ඇතුළු වන්නන් විදියට මවු කුසකට ඔක්කන්ති වීම පේනවා.**

ඉතා සුළුවෙන් හෝ දිවැසක් නැති කෙනෙකුට මේ උපමාව තේරුම් ගන්න දත්තයන් නැති නිසා වටහා ගැනීම අපහසු වෙන්න පුළුවන්. ඒ නිසා අරිහත්වයට පත් නොවූ, ඉන් මෙපිට සියල්ලෝම ගන්ධබ්බයෝ කියල හිතෙන්නත් පුළුවන්. නමුත් දිවැස් ලබපු අයට මේ තතු පේනවා. ඉතා පිරිසිදු දිවැස් තියෙන්නෙ අභිඤ්ඤාලාභී මහ රහතන් වහන්සේලාට. ඒ දිවැස හිරු එළියෙන් යමක් දකිනව වගේ ඉතා ප්‍රබලයි. ඊට වඩා පහත් මට්ටමක දිවැස් තියෙන බාහිර යෝගී ඍෂිවරු හඳ එළියෙන් යමක් දකිනව වගේ දකිනවා. ඒ දිවැස දුර්වල නිසා. ඊටත් වඩා අඩු අභිඤ්ඤා තියෙන අය තරු එළියෙන් යමක් දකිනව වගේ දකිනවා. ඊටත් අඩු දිවැස් තියෙන අය පහන් එළියෙන් යමක් දකිනව වගේ අල්ප මාත්‍ර ලෙස දකිනවා. දිවැස් නැති අය තමන්ගෙ හිතට නැගෙන අදහස් පරිදි, එහෙම නැත්නම් අසාගත් දෙයක් අනුව බොහෝ විට යමක් ප්‍රකාශ කරනවා.

මීළඟට පටිසන්ධිය හා ඔක්කන්තිය කොහොමද කියල බලන්න ඕන. සත්ත්වයෙක් මියගිහින් ගන්ධබ්බයෙක් විදියට ඔක්කන්ති වීම තමයි ධර්මයේ සඳහන් වෙන්නෙ. ගැබක පටිසන්ධි හෙවත් පිළිසිඳ ගන්නවා කියන කතාව පසුකාලීනව ගොඩනගා ගත්තු දෙයක්. සූත්‍ර පිටකයේ උපත පෙන්වන කිසිම තැනක පටිසන්ධි කියන වචනයවත් යොදල නෑ. ඊට හේතුව ඉතා සූක්ෂමව කරුණු විග්‍රහ කළ යුතු තැන්, ධර්මයේ සියුම් නුවණට ගෝචර කරගෙන විසඳා ගත යුතු කොටස් අභිධර්ම කොටසට ඇතුළත් කිරීම විය යුතුයි. ජාති විග්‍රහ කරන සූත්‍ර පිටකයේ, පුනර්භවය හේතු කොට ගෙන පුනර් ජාතියක් සැකසීම, මවු කුසින් බිහි වී මෙලොව රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ලැබීමට සුදුසු කයකින් යළි පහල වෙනතුරු සිදුවන අවස්ථා සම්පිණ්ඩනය මේ විදියට විග්‍රහ කරල තියෙනවා.

''කථංච භික්ඛවේ ජාති, යං තේසං තේසං සත්තානං තම්හි තම්හි සත්ත නිකායේ ජාති (පළමුවෙන්ම ආරම්භකව සකස් වෙන අවස්ථාව) - සංජාති (ඒ හටගත්තු එකට තවත් එකතු වුනාම ඇති වන අවස්ථාව හෙවත් ගන්ධබ්බ අවස්ථාව) - ඔක්කන්ති (මවු කුසට ඇතුල් වන අවස්ථාව) - අභිනිබ්බත්ති (විශේෂයෙන් ගන්ධබ්බයාගේ මස් ලේ කයේ අනුරූව නිර්මාණය වීම) - ඛන්ධානං පාතුභාවෝ (මස් ලේ කය පූර්ණ වීම හෙවත් සනීභවන ස්කන්ධයන්ගේ පහළවීම) - ආයතනානං පටිලාභෝ (ඇස, කන, නාසය ආදී ආයතනයන්ගේ පහළ වීම) අයං වුච්චති භික්ඛවේ ජාති''

මේ අනුව අවස්ථා හයක සම්පිණ්ඩනයක් ජාති විදියට විග්‍රහ කරල තියෙනවා. මේ කාරණය සනාථ කරන්න දී.නි.(2) 80 පිටුවේ එන <u>මහා නිදාන සූත්‍රයේ</u> කොටසක් මේ විදියට දක්වන්න පුළුවන්. ''විඤ්ඤාණංචහි ආනන්ද මාතු කුච්ඡිං ඔක්කමිත්වා වොක්ඛ මිස්සථ අපිනුඛෝ නාම රූපං ඉත්ථත්ථාය (යම්කිසි ස්ථානයක පිහිටීම) අභිනිබ්බත්ථාය (ඒ පිහිටපු තැන වැඩීම)''

මෙතැන ''විඤ්ඤාණය මවු කුසට ඇතුළු වී'' කියන තැන රූපයෙන්, වේදනාවෙන්, සංඥාවෙන්, සංඛාරයෙන් තොරව විඤ්ඤාණයක යැමක් ඒමක් නොකියමියි කියන බුද්ධ දේශනාව අනුව, සංජාතිකයෙක් හෙවත් ගන්ධබ්බයකුගේ ඇතුළු වීම තේරුම් ගන්න ඕන. මෙතන ගැබට ඇතුළු වීම තමයි ඔක්කමිත්වා කියල කිව්වෙ. ගැබ තුළ නාම රූපයේ වැඩීම කිව්වෙ සජීවී ගැබ තුළ මස්, ලේ කය වැඩීම. අභිනිබ්බත්ථාය කිව්වෙ ඒ අර්ථයෙන්. මේ විදියට එක් එක් වචනයෙන් කියවෙන අදහස වෙන වෙනම තේරුම් ගන්න ඕන.

මහණෙනි, තුන් දෙනෙකුගේ සමවදානයෙන් ගර්භා වක්‍රාන්ති (ගැබ් ගැනීම) වෙයි. මේ සත්ත්ව ලෝකයේ දෙමාපිය සන්නිපතිත වෙත්ද (එතෙකුදු වුව) මව ඔසප් නොවූද, ගඳබෙක් (එහි උපදනා සතෙක්) නොඑළඹියේ වේද, එතෙක් ගර්භා වක්‍රාන්ති නොවන්නේය. මෙලොව දෙමාපිය සන්නිපාත වෙත්ද, මව ඔසප් වූද (එතෙකුදු වුව) ගඳබෙක් නොඑළඹියේ වේද එතෙකුදු ගර්භා වක්‍රාන්ති නොම වෙයි. මහණෙනි, යම් අවස්ථාවක දෙමාපියෝ සන්නිපාත වෙත්ද, මවද ඔසප් වූද, ගඳබෙක් එළඹියේත් වේද, මෙසේ තුන් දෙනෙකුගේ සන්නිපාතයෙන් ගර්භා වක්‍රාන්ති වේ.

මජ්ඃනිඃ1 - 623 පිටුව, <u>මහා තණ්හා සංඛය සූත්‍රය</u>.

මේ අනුව මවුපිය දෙදෙනෙකුගේ එකතු වීමත්, මව ඍතු ඇත්තියක් වීමත් සහ ගන්ධබ්බයෙකුගේ පැමිණීමත් කියන මේ කාරණා තුන සිද්ධ නොවේ නම් උපතක් සිදු නොවන බව පැහැදිලි වෙනවා.

ඉහත කියපු අවස්ථා හයෙන් ජාති කියල පළමුව කිව්වෙ චුතියට අනතුරුව චිත්තක්ෂණයක්වත්, අතරක් නැතිව පහල වෙන කාය, භාව, වස්තු යන දසක තුනේ පූර්ණ කර්මජ අවස්ථාව වන පටිසන්ධි අවස්ථාව. සංජාති කිව්වෙ ඊළඟට කර්ම මුල්කර ගෙන චක්ඛු, සෝත, ඝාන, ජිව්හා ප්‍රසාද රූප සමග චිත්තජ රූප එකතු වෙලා හැදෙන ගන්ධබ්බ අවස්ථාව. (අන්තරාභවිකයා කියල පටලවා ගත් තැන) ඔක්කන්ති කිව්වෙ ගන්ධබ්බයා ගැබකට ඇතුළුවන අවස්ථාව. ''ගන්ධබ්බා අවක්කන්ති හෝති'' කිව්වෙත් මේකට. අභිනිබ්බත්ති කිව්වෙ, මවු කුස තුළ සජීවී මස් ලේ කයක වැඩෙන අවස්ථාව. ඛන්ධානං පාතුභාවෝ කිව්වෙ මස් ලේ කයක ඇස, කන, දිව, නාසය, කය යන ඉන්ද්‍රියන්ගෙන් මේ භෞතික ලෝකයේ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ලැබීමට සුදුසු විදියට කය සැකසුණු අවස්ථාව. ආයතනානං පටිලාභෝ කිව්වෙ බිහි වෙලා මස් ලේ සහිතව සැකසුනු සනීභවන වෙච්ච ඇස, කන, නාසය, දිව, කය යන ඉන්ද්‍රියන්ගෙන් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ නැවත ලබන අවස්ථාව.

ගැබකට ඔක්කන්ති වෙන අවස්ථාව අභිධර්මයේ පෙන්වා තියෙන්නෙ ''ඔක්කන්තික්කනේ නාම රූපං අඤ්ඤමඤ්ඤං සහජාත පච්චයේන පච්චයෝ'' කියල. මෙයින් පෙන්වන්නෙ ගන්ධබ්බයාගේ නාම රූප පද්ධතිය, මවු ගැබ තුළ ගොඩනැගෙන කය හා සම්බන්ධ වෙලා, ගන්ධබ්බයාගේ ඒ ස්වභාවයට අනුව ගොඩ නැගෙමින් සකස් වේ කියන එක.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)


*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# අපට නොපෙනෙන ලෝකය දහම් ඇසින්...

**14 වන කොටස**

මේ දහම් ලිපි පෙළ ආරම්භ කරපු මුල් කාලයේ මහා මේරු පර්වතය ගැන යම් සඳහන් කිරීමක් කළා. මේ ගැන අද වෙනකොට නොයෙක් සාහිත්‍ය කතන්දර ගෙතිල තිබුණත්, ඒකෙ සැබෑ තත්වය බොහෝ දෙනෙක් දන්නෙ නෑ. හුගක් අය හිතන් ඉන්නෙ ඒක නිකන් සංකල්පයක් කියල. නමුත් බුදු දහම තුළ මේ මහා මේරු පර්වතය ගැන සඳහන් වෙනව වගේම, දිවැස් අභිඥා ලාභීන්ටත් මේ ගැන නියම තතු ගෝචර වෙනවා. මහා මේරු පර්වතය සහ ඒ වටාපිටාව ගැන කෙටි විග්‍රහයක් තමයි මේ ඉදිරිපත් කරන්නෙ.



මහා මිහිරියාව කියන අදහස තමයි මහා මේරු කියන්නෙ. ඒ කියන්නෙ ලෞකික සුවය සියලු ආකාරයෙන් තියෙන ප්‍රදේශයක්. මොකද තාවතිංසය සහ චාතුර්මහාරාජිකය කියන දිව්‍ය ලෝක දෙකත් මේ ආශ්‍රිතව පිහිටන්නෙ. ඒ කියන්නෙ මනුස්ස ලෝකයට ආසන්නයෙන්ම තියෙන දිව්‍ය ලෝක දෙක. ඒක ලෝක ආරම්භයේදි සත්වයින්ගෙ පුණ්‍ය ඍද්ධියට පහළ වෙච්ච දෙයක්. ඒ තමයි මහා මිහිරියාව හැදෙන්න මුල් වෙච්ච තැන. මේ මහා මේරු පර්වතය කේන්ද්‍ර කරගෙන තමයි අපි මේ ඉන්න පෘථිවිය ඇතුලු මනුස්ස ලෝක හතරත්, චාතුර්මහා රාජිකය සහ තාවතිංසය කියන දේව ලෝක දෙකත්, එයින් ඉහළට නිදහස්ව මේ මඟුල් සක්වළට අයති අනිත් දිව්‍ය බ්‍රහ්ම ලෝකත් පිහිටල තියෙන්නෙ. මේ වගේ මහාමේරු පර්වතයක් හැම සක්වලකටම පිහිටනවා. නමුත් ඒවා හඳුන්වන නම් වෙනස් වෙන්න පුළුවන්. හැබැයි මේක පර්වතයක් කියල කිව්වට මිනිස්සු හිතන විදිහට කලු ගලින් හරි වෙනත් ඝණ ද්‍රව්‍යයකින් හරි නිර්මාණය වෙච්ච දෙයක් නෙවෙයි. ඒක තනිකරම ඝණ මීදුම් පටල වගේ විවිධ කිරණවලින් හැදිච්ච ප්‍රදේශයක්. ඒ කියන්නෙ අපේ ලෝකයේ තියෙන කලු ගලක් වගේ පිට පෘෂ්ඨයක් තියෙන ඒ ජාතියෙ එකක් නෙවෙයි. හරියට නිකන් මීදුම වගෙයි. එහෙම නැත්නම් දුමාරයක් වගෙයි. එතකොට ඒ දුමාරයේ ඇතුලත, පිටත කියල වෙනසක් නෑ. ඒකෙ හැම තැනින්ම රිංගන්න, යන්න එන්න, කිමිදෙන්න පුළුවන්. අන්න ඒ වගේ ස්වභාවයක් තියෙන තැනක්. ඒක 2/3 ක් කිරි සයුරෙ ගිලිල ඉතිරි 1/3 තමයි මතු පිටට පේන්න තියෙන්නෙ. ඒ වගේම මේකට කාන්දම් හා සමාන කොවුලක් තමයි තියෙන්නෙ. ඒ වටා දුමාරයක් වගේ ජල වාෂ්ප ස්වභාව තියෙන විවිධ කිරණ වර්ග පිහිටනවා. සූර්යා ගමන් කරන කොට, ලෝකය කැරකි කැරකි යනකොට විවිධ පැතිවලින් බැලුවම උදේ හවස අපට විවිධ වර්ණ දැක බලාගන්න පුළුවන්. සමහර වෙලාවට ඒ වර්ණයන් නිකන්ම එන ඒව නෙවෙයි. විවිධ දේවල් සමග සම්බන්ධ වෙලා තමයි ගොඩ නැගෙන්නෙ. සමහර පැත්තකට කොල පාට, නිල් පාට. තවත් පැත්තකට රක්ත වර්ණ ආදී වශයෙන් වර්ණ හැදෙන කොටත් ඒ වර්ණ ස්කන්ධ කඳු වළලු වශයෙන් සම්බන්ධ වෙනවා. මේ වගේ ස්වභාවයක් තමයි මහාමේරු පර්වතයට තියෙන්නෙ. පාට ගත්තොත් මේ ස්වභාවික ලෝකය වගේමයි. වෙනම පාටක් කියල නෑ. මිශ්‍ර වර්ණ.

මේ මහා මේරු පර්වතය පෘථිවියේ ඉඳගෙන බැලුවොත් උත්තර ධ්‍රැවයට අංශක කීපයක් ඇලවෙලා තමයි පිහිටන්නෙ. ලෝකයේ උත්තර ධ්‍රැවයේ මධ්‍යයේ ඉඳල හරි කෙලින් එක්තරා හැඩතලයකට ඒක පිහිටනවා. අපේ ලෝකයේ මාලිමාවක් තිව්වම ඒකෙ උතුරු කටුව පිහිටන්නෙ, නිරක්ෂය රේඛාවෙ ඉඳල උතුරු පැත්තට මේ මහ මෙර කියන කාන්දම් පර්වතයට සාපේක්ෂව. හැබැයි අපි කතා කරන සම්මත උතුරයි, මේ කියන චුම්බක උතුරයි දෙකක්. මේ දෙක අතර අංශක ගණනක වෙනසක් තියෙනවා. මේ අංශක ගණන කෙලින් බැලුවොත් හරියට චුම්බක උතුරු පැත්තට කේතුකාකාර හැඩයට තමයි මේ මහ මෙර පිහිටන්නෙ.

හැබැයි සාමාන්‍ය කෙනෙකුට මේක දැක බලාගන්න ක්‍රමයක් නෑ. මොකද එතනට එහෙම නිකන් කෙනෙකුට යන්න බෑ. නමුත් සතර ඍද්ධිපාද වඩපු අභිඥා ලාභීන්ට මෙතනට ගිහින් ස්පර්ශ කරන්නත් පුළුවන්. මොකද අභිඥා ලාභීන්ට තමන්ගෙ ශරීරය ඊට අවශ්‍ය ප්‍රමාණයට පරිවර්තනය කරගැනීමේ හැකියාව තියෙනවා. එතකොට ඒ අය මනෝමය කයත් එක්කම එතනට ☞

ගැලපෙන්න පරිවර්තනය කරගන්නවා. ඒ විදිහට ක්ෂණයකින් හිතනකොටම එතනට යන්න පුළුවන්. ඊටත් එහා ඍද්ධි බල අභිඥා බල තියෙන කෙනෙක් හිටියොත් සම්පූර්ණ මස් ලේ කයම අභිඥා බලයෙන් සියුම් කරගෙන, මුළු කයම ඒ තත්වයට පත් කරගෙන ගෙනියන්න පුළුවන්. එහෙම ගියොත් මහා මේරු පර්වතය ඒ අයට භෞතිකවම ස්පර්ශ කරන්න පුළුවන්. නමුත් සාමාන්‍ය අයට ඒක භෞතිකව ස්පර්ශ කරන්න බෑ. උදාහරණයක් විදිහට ගත්තොත් යකඩයක් කාන්දමකට ප්‍රතිචාර දක්වනවා, හැබැයි කාන්දමයි ලී කෑල්ලකුයි එකට එකක් ප්‍රතිචාර දක්වන්නෙ නෑ. මේ වගේ අභිඥාලාභියෙකුට විවිධ ප්‍රතිචාර සහිතව මේ මහා මේරු පර්වතය දැක බලාගන්න, ස්පර්ශ කරන්න පුළුවන්. එතකොට ඒ අයට, ඒක අපි මේ ඉන්න භෞතික ලෝකය වගේමයි දැනෙන්නෙ. මොකද ඒ ඒ තැන්වලට යනකොට මස් ලේ කයත් ඒ ඒ මට්ටමේ ශරීර බවට පරිවර්තනය කරගන්න පුළුවන් නිසා.

ඊළඟට මේ මහා මේරු පර්වතයේ ස්වභාවය ගත්තොත් හරියට බෙරයක් වගේ. බෙරයක මැදින් මහතයි. දෙපැත්ත හීනියි. එතකොට උතුරුකුරු දිවයින, අපරගෝයානය, පූර්වවිදේහය සහ ජම්බුද්වීපය කියන මේ මනුස්ස ලෝක හතර තමයි මේ මහ මෙරේ මැද හතර පැත්තට අංශක 90 කෝණය බැගින් පිහිටන්නෙ. බෙර ඇහේ දෙපැත්තෙන් එක පැත්තක දීප්තිමත් තලයක්. ඒ වටේට රවුමට කිරි සයුර පිහිටනවා. ඒක ලෝකයේ දැන් කතා කරනව වගේ ජල සාගරයක් නෙවෙයි. තනිකරම හිම වළා පටලයන්ගෙන් වැහිල තියෙන්නෙ. නමුත් අද වෙනකොට ඒකත් මේ ජල සාගරයක් වගේ එකක් කියල පටලවාගෙන. ඊළඟට බෙර ඇහේ අනිත් පැත්ත වගේ, මහ මෙරේ අනිත් පැත්තෙ තමයි තාවතිංසය කියන දෙව් ලෝකය පිහිටල තියෙන්නෙ. ඊට පල්ලෙහා තියෙන කේතු රූපාකාර ප්‍රදේශය වටේට චාතුර් මහා රාජිකය පිහිටනවා. බෙරය වගේ කොටසෙ අනිත් පැත්ත තමයි මේ මනුස්ස ලෝක හතරෙ පාමුල පිහිටල තියෙන්නෙ. ඒ වගේම මේ මනුස්ස ලෝක හතරටම වායුගෝල 4 ක් තියෙනවා. ඒ වායුගෝල හතරම කැරකෙන කොට ඒවායේ සර්ෂණයෙන් ඇතිවන එක්තරා පොදු සුලියක් තියෙනවා. එතන තමයි මහ මෙරේ පතුල් පැත්ත.

**දැන් අපි මේ පෘථිවියේ ඉන්න කොට හරියට දවල් 12ට කෙලින්ම සූර්යාට තියෙන දුරට සමාන දුරක්, සූර්යා පසු කරගෙන කෙලින්ම තවත් ආකාසයේ ඉහලට ගියොත් මේ කියන උතුරුකුරු දිවයින අහුවෙනවා.** එතකොට සූර්යා ඒකෙ පතුල වගේ. මොකද අපි බලන්නෙ යට ඉඳන් උඩට. එහෙම බැලුවම උඩට ඒ කෙලින්ම පේන ලෝකය තමයි උතුරුකුරු දිවයින. ඊළඟට සූර්යා මධ්‍ය ලක්ෂය කරගෙන ඒ කෙලින්ම හරියට එකතු කිරීමේ ලකුණෙ (+) හැඩයට දෙපැත්ත බැලුවොත්, නැගෙනහිරට ඒ හා සමාන දුරකින් පූර්වවිදේහයත්, බටහිරට ඒ හා සමාන දුරකින් අපරගෝයානයත් පිහිටල තියෙනවා. නමුත් මේ ලෝක තනිකරම නැගෙනහිරට බටහිරට වෙන්න නෙවෙයි පිහිටන්නෙ. අංශක ගණනක ඇලයකින් උතුරු පැත්තට වෙන්න තමයි පිහිටන්නෙ. මොකද මහා මේරු පර්වතයේ තියෙන කාන්දම් බලය නිසා. එතකොට මේ කියන විදිහට බැලුවොත් මේ ඉතිරි මනුස්ස ලෝක තුනත් අහුවෙනවා. මනුස්ස ලෝකයේ ඉඳගෙන මේ සිද්ධාන්තයට අනුව තමයි ඒක බලන්න ඕන. **දිවැසක්, සමාධියක් තියෙන කෙනෙකුට ඔක පහසුවෙන් බලාගන්න පුළුවන්. එහෙම නැත්නම් මොනව හරි නවීන තාක්ෂණික ක්‍රමයක් පාවිච්චි කරල තමයි බලන්න වෙන්නෙ.**

ඉතින් අපි ඕක පෘථිවියේ ඉඳගෙන බැලුවොත් මේ ඉතිරි මනුස්ස ලෝක තුන හරියට ආකාසෙ පිහිටල තියෙනව වගේ තමයි අපට දැනෙන්නෙ. දවල් 12ට බැලුවොත් තමයි ඒ පිහිටීම අහුවෙන්නෙ. හැම වෙලේම එකතු කිරීමේ ලකුණ (+) කැපෙන විදියට තමයි අංශක 90 ක කෝණවලින් මේ ලෝක හතර පිහිටල කැරකෙන්නෙ. ඒකත් කැරකිලා අවුරුද්දක් යනකොට මේ ලෝක හතරම එක රවුමක් කැරකෙනවා. අපි තිරක්ෂ රේඛාවෙ ඉඳගෙන මේ ලෝක හතර, හතර පැත්තට මවා ගත්තොත් ඒ හතර බලන්න නම් අපි තිරක්ෂ රේඛාවෙ උඩ ඉන්න ඕන. ඒ නිසා අපට මේ පොළවෙ ඉඳගෙන උඩ, යට, වටපිට බලල මේව හොයාගන්න බෑ.

ඒ වගේම දැනට ලෝක සම්මතයේ, සූර්යාට පෘථිවියේ සිට තියෙනවයි කියන දුර නෙවෙයි ඇත්තටම තියෙන්නෙ. දැන් කියන්නෙ සූර්යා හැතැප්ම කෝටි ගණනක් ඈත තියෙනව කියල. ඒක විද්‍යාඥයින් විසින් උපකල්පනය කරල හදාගත්තු එකක්. නමුත් මේ අපට පේන්නෙ ප්‍රධාන සූර්යා නෙවෙයි, ඡායා සූර්ය මණ්ඩලයක්. දසදහසක් සක්වලට එක් ප්‍රධාන සූර්යයයි පිහිටන්නෙ. ඒක පිහිටල තියෙන්නෙ අපේ මේ පෘථිවියේ ඉඳන් හුගක් ඈතින්. නමුත් ඒ ප්‍රධාන සූර්යාගෙ එළිය අපට එන්නෙ නෑ. පරාවර්තනය වීමක් හරහා එන කිරණ විතරයි අපට එන්නෙ. ප්‍රධාන සූර්යාගෙන් එන්නෙ ධන කිරණ. ඒ ධන කිරණ ඇවිත් වායුගෝලයේ තියෙන ඍණ කිරණ ධාරවක වැදුනම තමයි, ඒ දෙක එකට එකතු වෙලා ආලෝකය හා උෂ්ණත්වය බවට පත්වෙන්නෙ. ඒ එකතුවෙන් තමයි දැන් මේ අපට පේන ඡායාමය ආලෝක සූර්යා හැදෙන්නෙ. ඒක අපි මේ ඉන්න මගුල් සක්වලටම පොදුයි. ඒ කියන්නෙ එක සක්වලකට එක උප සූර්යයෙක් තියෙනවා. ඒ වගේ ප්‍රධාන සූර්යාගෙන් එළිය වෙන දස දහසක් සක්වලට උප සූර්යයො දස දහසක් තියෙනවා. නමුත් ඒ ප්‍රධාන සූර්යා අපට පේන්නෙ නෑ. එතකොට මේ කියන තරම් ඈතකින් නෙවෙයි අපට පේන සූර්යා පිහිටල තියෙන්නෙ. එක්තරා දුරක් ඉහළට ගියාට පස්සෙ ඔය සූර්යා නොපෙනී යනවා. ඒ කියන්නෙ එතනට ගියාට පස්සෙ සූර්යා කියල වස්තුවක් දකින්න නෑ. අන්න එතන තමයි අර කලින් කියපු මේ මනුස්ස ලෝක හතරෙ වායුගෝල හතර සර්ෂණය වන සුලිය පිහිටල තියෙන්නෙ. ඒ සුලියට අහුවුනොත් එහෙම නැවත ලේසියෙන් එන්න බෑ. නමුත් ඒ සුලිය මගහැරල අවශ්‍ය නම් වෙනත් පැත්තකින් යන්න පුළුවන්. හැබැයි ඒ සුලිය ඉක්මවල තවත් දුරක් ගියාම නැවතත් නිශ්චලයි. ඒ කියන්නෙ ඊට පස්සෙ කලින් වගේ සාමාන්‍ය වායුගෝලයක් තියෙන්නෙ. එහෙම යනව නම් යන්න ඕන ඉලක්කය තමයි මේ කිව්වෙ.

හැබැයි මේ කියන තැන්වලට අද මේ කතා කරන රොකට්, චන්ද්‍රිකා වගේ මාධ්‍යයකින් යන්න පුළුවන්කමක් නෑ. මොකද අද මේ තාක්ෂණයෙන් දියුණු රටවල මිනිස්සු ගියයි කියන තැන්, කොච්චර දුරට ඇත්තද බොරුද කියන්න කවුරුවත් දන්නෙ නෑ. අහවල් තැනට චන්ද්‍රිකාවක්, රොකට්ටුවක් යැව්වයි කියනව, මිනිස්සු ඒකට ගියයි කියනව. නමුත් ඒ කිව්වට ඒව එකක්වත් හරියට පෙන්වන්නෙ නෑ. විවිධ රටවල් අතර මේ වගේ තැන්වලට යන්න, තමන් ඉස්සෙල්ලම ගියයි කියන්න ලොකු තරගකාරීත්වයක් තමයි මේ වෙනකොට ඇතිවෙලා තියෙන්නෙ. මේ නිසා ඒ ඒ රටවල් ඒවට විවිධ උපක්‍රම පාවිච්චි කරනවා.

සමහර විට සහරා වගේ විශාල කාන්තාරයක් ගත්තොත් ඒකට සාමාන්‍ය මිනිස්සු කවුරුවත් යන්නෙ නෑ. නමුත් ලෝකයේ තියෙන නවීන තාක්ෂණය පාවිච්චි කරල ආකාසයෙන් රවුමක් ගහල කාටවත් පේන්නෙ නැතිවෙන්න ඔය වගේ තැනකට බහින්න පුළුවන්. එතකොට මුහුද මැද නිශ්චල වගේ, සහරාවෙ මැදත් නිශ්චලයි. ඉතින් ඒ වගේ පැතිවලට ගිහින් විවිධ පර්යේෂණ කරන්න පුළුවන්. ඛණිජ තෙල් වගේ මිනිස්සු වටිනවයි කියන දේවල් රහසිගතව බලාගෙන, ඒවායෙන් ප්‍රයෝජන ගන්න හොයන්න පුළුවන්. මේ වෙනකොට රටවල් අතර ඇතිවෙලා තියෙන තියුණු තරගකාරීත්වය නිසා

ඒ වගේ දේවල් කරනවා. ඉතින් ඕව සාමාන්‍ය මිනිස්සුන්ට තේරෙන්නෙ නැති නිසා තනිකරම පිටසක්වල ලෝකයක් වගේ පෙන්වන්නත් පුළුවන්. මොකද ඒ තියෙන පරිසර තත්වයන් නිසා. ඒවායේ වායුව පවා ඇත්වෙලා හමන්න තරම් වායුවක් නෑ. පසට වුනත් ගැහුවට දූවිලි විසිවෙන්නෙ නෑ. දවල්ට වායුව රත්වෙලා ඉහළට යනකොටයි, නැවතත් රාත්‍රියට සීතල වෙලා වායුව පහළට බහිනකොටයි කියන මේ අවස්ථා දෙකේදි විතරයි වැලි කුණාටු ඇති වෙන්නෙ. අනිත් වෙලාවට නිශ්චලයි. ඒ වගේම සූර්යාලෝකය එන වෙලාවට අධිකව එනවා. ඉතින් අවශ්‍ය ඇඳුම් ආයිත්තම් ඇඳගෙන මේ වගේ තැනකට ගිහින් විවිධ ලෝකවලට ගියයි කියන්න පුළුවන්. නමුත් සාධක ඇතිව ඔප්පු කරන්න විදිහක් නෑ. කොහොම හරි **මේ ලෝක සම්මත විද්‍යාඥයින් කියන සමහර කරුණු දහමට ගලපල බැලුවොත් පිලිගන්න අමාරුයි. සමාධියකින්, දිව්‍යසකින් බැලුවත් ඒ සමහර කරුණු සත්‍ය නොවන බව පැහැදිලිව දැනෙනවා.**

එතකොට මේ කියන මනුස්ස ලෝක හතරෙන් අපි ඉන්න ලෝකය හැර ඉතිරි ලෝක තුන තවමත් විද්‍යාඥායින්ට හොයාගන්න බැරි වෙලා තියෙනවා. ඉතින් මේ කියන ලෝක තුනට යනව නම් යන්න වෙන්නෙ, දැන් එන පියාඹන පීරිසි වගේ කිරණමය මාධ්‍යයකින්. ඒකට මාර්ගයත් මේ දැන් තියෙන ගුවන් මාර්ග නෙවෙයි. මාර්ගයයි, මාධ්‍යයයි දෙකම වෙනස්. මේ කිරණමය මාධ්‍යය ඒකට හරියටම ගැලපෙනවා. ඒ නිසා තමයි උතුරුකුරු දිවයිනේ වැසියන් ඒ අයගෙ පුණ්‍ය සෘද්ධියට පහළ වෙන කිරණමය පියාඹන පීරිසිවලින් මේ ලෝකයට ඇවිත් යන්නෙ. **අද පිටසක්වලින් මෙහාට එනව කියල හිතාගෙන ඉන්නෙත් මේ උතුරුකුරු දිවයිනෙන් එන වැසියන්ට.** අපිට එහෙම තාක්ෂණයක් නැති නිසා ඒ ලෝකවලට යන්න බෑ. මොකද අර වගේ කිරණමය මාධ්‍යයකින් යන කොට තමයි අර සුළි වගේ බාධක මගහැරල යන්න පුළුවන් වෙන්නෙ. නැත්නම් ඒවට අහුවෙනවා. යම් කිසි වායු කම්පනයකට ෂෙල් වෙඩි ප්‍රහාරයක් එල්ල කළා වගේ, ක්‍රමයෙන් ඉදිරියට තල්ලු වෙන ක්‍රම වේදයක් තමයි මේ මාධ්‍යයට තියෙන්නෙ. ඒක ආලෝක ගුලි විහිදුවමින් යන ක්‍රම වේදයක්. එතනදි යම් කිසි ප්‍රසාරණයක් සිද්ධ වෙලා ඉදිරියට ඇදල යන ක්‍රමයක් තියෙන්නෙ. ඒ කියන්නෙ කිරණමය මාධ්‍යයක් තවත් කිරණමය මාධ්‍යයකට වදිනවා. ඒ නිසා තමයි අපේ යානාවල වගේ ශබ්දයක් පිටවෙන්නෙ නැත්තෙ. කිරණ-කිරණ ගැටුනම එහෙම විශාල ශබ්ද එන්නෙ නෑ. ඊට අනුකූලව හැදිච්ච යානා තමයි උතුරුකුරු දිවයින වගේ අනිත් මනුස්ස ලෝක දෙකේ වැසියන්ටත් තියෙන්නෙ. නමුත් මේ අපේ මනුස්ස ලෝකයේ තියෙන යානා ඒකට ඔරොත්තු දෙන්නෙ නෑ. ටික දුරක් ගිහින් කඩා වැටෙනවා.

දැන් මේ වගේ කාරණා ටිකක් මේ විදිහට හෙළිදරව් කළේ, මේ කෙලවරක් නැති ලෝක විෂය ගැන පර්යේෂණ කර කර ඉන්න නෙවෙයි. මොකද ඒව ගැන පර්යේෂණ කරන්න ගියොත් කවදාවත් කරල ඉවර කරන්න බෑ. ජීවිත කාලය නිකරුණේ ගෙවිල යන එක විතරයි වෙන්නෙ. නමුත් මේ වෙනකොට ලෝකයේ සම්මත කරගෙන තියෙන විද්‍යාවන් තුලින්, මේ විශ්වයේ පිහිටි විවිධාකාර ලෝකයන් ගැන යම් යම් මත පළ කරල තියෙනවා. ඉතින් මිනිස්සුත් ඒවා අගක් මුලක් දන්නෙ නැතිව විශ්වාස කරල බොහොම කුතුහලයෙන් තව තවත් ඒ වගේ දේවල් පසුපස හඹා යන්න පෙළඹිලා ඉන්නවා. ඒ වගේම මේ අතර ප්‍රකාශ කෙරෙන සමහර වැරදි තොරතුරු නිසා මිනිස්සුත් දෘෂ්ටිගත වෙලා නන්නත්තාර වෙනවා. ඒ නිසා දහමට අනුව, මේ කෙලවරක් නැති ලෝකවල සැබෑ තත්වය යම් පමණකට පෙන්වා දෙන්න මේ වගේ කරුණු කාරණා හෙළි කළා මිසක්, මේවා පස්සෙ හඹායන්න කරන විග්‍රහයක් නෙවෙයි. මේ කෙලවරක් නැති ලෝකවල තියෙන අනිච්ච, දුක්ඛ, අනත්ථ ස්වභාවය වටහාගෙන මිදෙන්නයි උත්සාහ කරන්න ඕන.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ 25 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**ශ්‍රම දායකත්වය** ♦ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ♦ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම ♦ සමන් සිල්වා මහතා - කළුතර ♦ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ♦ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ♦ රාජ් නිල්මිණි විජේවික්‍රම මහතා - ගොඩගම ♦ චිත්‍ර ශිල්පී එස්. එම්. ජයසේකර මහතා - මාලබේ ♦ ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලයේ චන්දිම පෙරේරා මහතා ඇතුළු කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ පර්ෆෙක්ට් කම්පියුටර් ආයතනයේ කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ♦ නන් අයුරින් දායකවූ පින්වතුන්

**මූල්‍යමය දායකත්වය** ♦සමන් සිල්වා මහතා - කළුතර - රු. 16,000/- ♦ කරුණා ධර්මසේන මහත්මිය ඇතුළු පවුලේ සැම - හෝමාගම - රු. 10,000/- ♦ තුසිත නාකන්දල මහතා - මහනුවර- රු. 6,000/- ♦ කැළුම් ලංකේශ්වර මහතා ඇතුළු පවුලේ සැම - නෙළුව- රු. 5,000/- ♦ අමිත් හඳුගොඩ මහතා - අත්තිඩිය - රු.5,000/- ♦ චරිත් ඉන්දික මහතා - ඉතාලිය - රු. 5,000/- ♦ ජනක හපුආරච්චි මහතා ඇතුළු පවුලේ සැම - ගිනිගත්හේන - රු. 3,000/- ♦ අමිල සල්ගාදු මහතා - බෝමිරිය රු. 2,500/- ♦ බිනාධි යොහන්සා දියණිය ඇතුළු පවුලේ සැම - පානදුර - රු. 2,500/- ♦ කෝෂලා සිරිවර්ධන මෙනෙවිය - ගාල්ල - රු. 2,000/- ♦ ලලිතා ජූලියට් හේවාපතිරණ මහත්මිය - මාහොළුව - රු. 2,000/- ♦ මානෙල් කටුගම්පොල මහත්මිය - මහරගම - රු. 2,000/- ♦ පුෂ්පික ගයාන් ඉන්ද්‍රජිත් ලොකුමාන්න මහතා - ගල්කිස්ස - රු. 2,000/- ♦ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ♦ ඩබ්. ඩී. සුමනසිරි මහතා සහ ප්‍රියන්ත වාහලවත්ත මහතා - කළුබෝවිල - රු.1,200/-♦ ඩබ්. විලියම් මහතා - දෙහිඅත්තකණ්ඩිය - රු. 1,000/- ♦ කේ.ඒ.උපාලි ජිනදාස මහතා - ගැටහැත්ත - රු. 1,000/- ♦ කේ. අමරතිලක මහත්මිය - මහරගම - රු.1,000/- ♦ශමීන් බණ්ඩාර මහතා - උඩුබැද්දෑව - රු.1,000/- ♦ශ්‍යාමල් බණ්ඩාර මහතා- කුරුණෑගල - රු. 1,000/-♦ ඉන්ද්‍රානි විශාකා ජයසිංහ මහත්මිය- බොරලැස්ගමුව - රු. 1,000/- ♦ රුවන් රණසිංහ මහතා - පන්නිපිටිය - රු.1,000/- ♦ ඥානා ටී ගමගේ මහත්මිය ඇතුළු පවුලේ සැම - හක්මන - රු.1,000/- ♦ මධුහානි කළුවැව මහත්මිය - මාලබේ - රු.1,000/- ♦ නිමල් චන්ද්‍රසිරි මහතා - නෙළුව - රු.1,000/- ♦ රියා ෆෝගල්ස් මහත්මිය - නෙදර්ලන්තය - රු.1,000/- ♦ කරුණාවතී පෙරේරා මහත්මිය - හොරණ - රු.1,000/- ♦ පියුමිනී විජේනායක මහත්මිය - මහනුවර - ☞

රු.1,000/- ♦ සමන් අමුගොඩ මහතා - මතුගම - රු.1,000/- ♦ එච්. පී. විජේරත්න මහතා - කිරුලපන - රු.1,000/- ♦ නිලන්ත ප්‍රසාද් මහතා ඇතුළු පවුලේ සැම - මාලබේ - රු.1,000/- ♦ අනුරුද්ද ඉද්දවෙල මහතා - කඩවත - රු.1,000/- ♦ නදීෂා හර්ෂනී ලියනගේ මෙනවිය- කළුබෝවිල - රු.1,000/- ♦ එරංග ලියනගේ මහතා සහ බිසන්තිකා ගුණසේකර මහත්මිය - කළුබෝවිල - රු.1,000/- ♦ වීනා අතුකෝරාල මහත්මිය, ජනිඳු බිම්සර පුතා ඇතුළු පවුලේ සැම - නෙළුව - රු.1,000/- ♦ නන්දාවතී සුබසිංහ උපාසිකා මාතාව - ගාල්ල - රු.1,000/- ♦ ආර්. ඒ. ගාමිනී අබේරත්න මහතා ඇතුළු පවුලේ සැම - කෑගල්ල - රු.1,000/- ♦ රංජිත් වික්‍රමසිංහ මහතා, පද්මාවතී වික්‍රමසිංහ මහත්මිය - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, මනෝජ් ජයසූරිය මහතා, උදාන ආරියවංශ මහතා - මහරගම, ඉසුර සම්පත් මහතා - කළුතර, පතිරණ විජේතිලක මහතා - හෝකන්දර, චතුර මල්වාන මහතා - කෑගල්ල, චන්දිම ගුණදාස මහතා - මොරටුව, දුමින්දා සංජීවනී මහත්මිය - නිට්ටඹුව, සුභාෂිනී අබේරත්න මහත්මිය - වත්තල, ශාන්ත මාරසිංහ මහතා - මහනුවර, කුමාරි ගොඩවිට මහත්මිය - කුරුණෑගල, නදිනි වික්‍රමසිංහ මෙනෙවිය - කඩිගමුව, ඩබ්. ආර්. ගුණතිලක මහතා සහ එම මහත්මිය, සන්ධ්‍යා නානායක්කාර, එල්.පී.ආර්. මල්කාන්ති, ඩබ්.එල්.එස්. ප්‍රියන්ති, නිලූකා සංජීවනී ගමගේ යන මහත්මීන් - නවලෝක රෝහල 4 වන මහල, ඉන්ද්‍රානි කුසුම්ලතා මහත්මිය, අමරාවතී සුබසිංහ මහත්මිය - පන්නල, සිරිතුංග දෙළුම්දෙනිය මහතා - බෙන්තොට, කුසුමා නාකන්දල මහත්මිය, අමරා ජයසිංහ මහත්මිය - මතුගම, දීපානි රාජපක්ෂ මහත්මිය, සුජීවා හේරත් මහත්මිය - එන්.බී.ආර්.ඕ.- ජාවත්ත, දහමට ලැදි පිංවතෙක් - වල්ගම්මුල්ල - රු. 12,420/- ♦ එකතු වූ සියලු මුදල් පරිත්‍යාග- රු. 100,120/- ♦ පළමු පිටපත් 10000 සඳහා මුද්‍රණ වියදම රු. 232,500/- ♦අනෙකුත් වියදම් - 15,670/- ♦ සම්පූර්ණ වියදම - රු. 248,170/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදී. සඟරා අලෙවියෙන් ලැබෙන ඉතිරි සියලු මුදල් නැවත මුද්‍රණ කටයුතු ඇතුළු දහම් කටයුතු සඳහා යොදවනු ලැබේ.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වර්ගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා! එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්‍ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

**සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,**
**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ,**
**අග්ගඤ්ඤ සූත්‍රය, නිරුක්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව,**
**දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ**
**අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද**
**නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත**
**බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net www.aaryadharma.org
විද්‍යුත් ලිපිනය: webmaster@helabodhupiyuma.net දු.අ:- 071 3046895

**දම් සභා ගුවන් හඬ** - www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ පුර සහ අමාවක පොහොය දිනයන්හි උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**

සැම පුන් පොහෝ දිනකම සහ සැම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව.

ගමන් මාර්ගය: නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණු පස.

## හෙළ බොදු පියුම දහම් සඟරාවේ පසුගිය කලාපයන් ඇතුලු සියලු කලාපයන් දැනට ලබාගත හැකි ස්ථාන:

1. ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - තලවතුගොඩ පාර, පිටකෝට්ටේ
2. නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ.
3. නිව් පියුමි කොමිනිකේෂන් - පීරිස් මාවත, කළුබෝවිල.
4. තුෂාරා ෆැෂන් - හයිලෙවල් පාර, හෝමාගම.
5. තුෂාරි සාරි සෙන්ටර් - කොළඹ පාර, පාදුක්ක.
6. සුජය ෆාමසි - කටුබැද්ද හංදිය, මොරටුව.
7. ගේට්වේ අධ්‍යාපන ආයතනය - කලේගාන, ගාල්ල.
8. සමනල පොත්හල - නෙළුව.
9. නිව් මෙට්‍රෝ කම්පියුටර්ස් - කාලිදාස මාවත, මාතර
10. මෝලෙ කඩේ - මුදුන, වලස්මුල්ල.
11. කේ. පී. ස්ටෝර්ස් - ගන්තුන, කෑගල්ල.
12. නුගේගොඩ නාලන්දාරාම විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (ඉරිදා උදේ 9.00 සිට සවස 2.00 දක්වා පමණි.) (077 7577592)
13. දෙහිවල කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (සෙනසුරාදා උදේ 8.30 සිට සවස 2.00 දක්වා පමණි) (077 2292677 / 071 4406928)

***ඉහත ආයතන හිමි පින්වතුන් මෙම සද් කාර්ය ඉටු කරනු ලබන්නේ කිසිදු වෙළඳ ලාභයකින් තොරව සාසනික කටයුත්තක් වශයෙන් පමණි.***



# මාර වස්තුව...





ගනු දෙනු කරන නෙක වස්තුව ලොවේ හුරු
මනු සත වටින ලෙස සිතුවද මරේ මරු
සුනු වෙන විටදී දුක දෙයි නම් නොවේ සරු
දිනු කිසි දෙයක් නැත මෙය වැටහෙනා තුරු



මරුට අයිති දේ නොම දැන බදා ගෙන
ලොවට හොරෙන් වින්දද මම මගේ මෙන
ණයට ගත්ත මිස කෝ ණය නොදී පැන
ළයට නොමැත නිදහස කිසි ලොවේ තැන




හරස් වෙන විටදී කම් එල යමෙක් වෙත
දුරස් වෙන්න කළ හැකි පින් දමක් ඇත
සකස් කරන්නට ගොස් කම් සැපක් සත
කෙළෙස් මරුට වැටුනොත් ගැලවුමක් නැත



කෙළ කෝටියක් තිබුණද වස්තුව එමට
එළඹෙන දිනක් එයි අත හැරුමට සැමට
කලකදී උරුම වෙයි නම් මරුවගෙ නමට
මළ විට කොතෙක් තිබුණද වස්තුව කුමට

අත්බැව රැකෙන පමණට උපයන ධනය
කෙත් වතු පිටින් නැතුවට හොඳටම ගුණය
මෙත් සිත පැතිරුවොත් සතහට එන පිනය
ගත් හැම වස්තු පරයයි නිවනට තැනය



සරු ලෙස පෙනෙන වස්තුව දිනයකදී මතු
මරුටම අයිති වෙයි ඒ බව දැකිය යුතු
දුරු වෙන තුරු කෙළෙස් මල සියොළඟෙහි එතු
උරුමය මරණයයි ලොකු පොඩි සැවොම සතු

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන





# කවදා නිම වෙද මේ
# පර්යේෂණ...



දවසින් දවස නිම වෙන නව උපකරණ
මිනිසුන් වසඟ කරවයි සසරෙහි සරන
අහසින් යන්න කරනා විදු ලොව තරණ
හරසුන් වෙමැයි දවසක් එන විට දිරන

ලොව වට ගගන තලයේ සැරි සරන සත
කවදක නිම කරන්නද තම සිතැඟි මත
දුවනට ගිහින් මස් ලේ ඇස ගැටෙන අත
දවසක මැරෙයි කළ කිසිවක් ඉතිරි නැත





නර ලොව තැනෙන නෙක දෑ මොහොතක් දුවන
පර ලොව යන විටදි නැත පිහිටක් දෙවන
හර නැති වැඩට වෙහෙසෙන මනුසත් නුවණ
මරණය ළඟදි තනි වෙයි නිවනක් නොවන



මුළු දිවියම ගෙවා සෙව්වද ලොවෙහි තතු
සුළුවට ලැබෙන දෙයකුත් නැත භවෙහි මතු
අළු වෙන විටදි නැත කිසිවක් අතෙහි සතු
ඔළුවක් ඇති කලදි නිසි තතු දැකිය යුතු

පිළි සමුපන්න බව දත් විට හැම දේක
එළි වෙයි නැණ නුවණ නිසි තතු දෙන ලෝක
අලියට අල්ල ගෙන දැඟලුව ලොව නේක
මැළි වෙයි යළිදු දැන ගැනුමට වුව කෝක

අති දුලභව ලැබුව මනුසත් භවයෙ සිට
හති වැටෙනකල් විදු ලොව සෙව්මටම බට
ගති අත හැරෙන බුදු බණ පද ඇසෙන විට
නොතිරවු සසර හරිනට ගත යුතුය පොට





පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

නීතිඥ චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල වනාත පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.